ISSN 1391 - 1031
2019 අගෝස්තු
25 වෙළුම 04 කලාපය
ආධාරය රු 40/=

# ද නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"විවිධ රටවලදී එය (විප්ලවය) විවිධාකාරයෙන් වර්ධනය වෙයි. එය නිතරම දිගු කාලයක් තිස්සේ දුෂ්කරතාවන්ගෙන් යුතුව ගමන් කරයි. ධනපතීන් තමන්ගේ අයිතීන් එක් වරම අත්හරිතියි සිතන සමාජවාදියා නරකය. නැත. ලෝකය විසින් තවමත් එවැනි කරුණාබරිත ධනපතීන් බිහිකර නැත. සමාජවාදය වර්ධනය විය හැක්කේ, ධනවාදය හා සමග කරන අරගලයෙන් පමණි. සටනින් තොරව යටත්වූ පාලක පංතියක් ලොව මෙතෙක් කවරදාකවත් පැවතී නොමැත."

**ලෙනින්**




# විකල්පයේ අපේක්ෂකයා ජාතික ජන බලවේගයෙන්

වසර 71ක සාම්ප්‍රදායික ධනේශ්වර පාලනයේ ශේෂ පත්‍රය ලෙස පැනනැගුණ අර්බුද රැසකින් පීඩා විඳින රට වෙනස් කිරීම සඳහා වූ ප්‍රතිපත්තිත් ඒ අනුව ක්‍රියාමාර්ගත් ගොඩනගා එම විකල්ප දේශපාලනය වටා දැවැන්ත මහජන බලවේගයක් ගොඩනගා ගැනීම ඉලක්ක කරගනිමින් පිහිටුවාගෙන ඇති ජාතික ජන බලවේගය එළඹෙන ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බවත් එහි ජනාධිපති අපේක්ෂකයා අගෝස්තු 18වැනි දින කොළඹ ගාලු මුවදොරදී පැවැත්වෙන දැවැන්ත රැලියේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිත බවත් වාර්තා වේ.

මෙම තොරතුරු අනාවරණය කෙරුණේ පසුගිය 30වැනි දින පිටකෝට්ටේ සෝලිස් උත්සව ශාලාවේ පවත්වන ලද ජාතික ජන බලවේගයේ මංගල මාධ්‍ය හමුවේදීය. මෙහිදී එම සංවිධානය නියෝජනය කරන ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් අදහස් දැක්වූ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහා දැවැන්ත මහජන ව්‍යාපාරයක්, දැවැන්ත කැපකිරීම් හා අවංකකම අවශ්‍ය බවත් මෙතෙක් රට පාලනය කළ දෙපිලටම රට ගොඩනැගීමේ ඕනෑකමක් හෝ ඒ වෙනුවෙන් සමාජ ආර්ථික ප්‍රතිපත්ති නොමැති බවත් පෙන්වා දුන්නේය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"ජාතික ජන බලවේගය කියන්නේ වමේ, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සහ සංවිධාන ගණනාවක් එකතුවෙලා ගොඩනගාගෙන තිබෙන සංවිධානයක්. පහුගිය 14වෙනිදා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී එය පළමු සමුළුව පැවැත්වූවා.

මේ වෙනකොට අපේ රටේ ජනාධිපතිවරණය ඉලක්ක කරගනිමින් දේශපාලන කතාබහක් ඇතිවී තිබෙනවා. සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හැමපැත්තෙන්ම විශාල අර්බුදයක තිබෙන අවස්ථාවක තමයි අපි දැන් ඉන්නේ. වසර 71ක ධනේශ්වර පාලනයේ ශේෂ පත්‍රය තමයි ඉතා බරපතළ ලෙස පැනනැගුන මේ සියලුම අර්බුද. ආර්ථිකය ගොඩනගන්න මේ පාලකයන් අසමත් වුණා වගේම සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව තුළ ජාතික සමගිය ගොඩනගන්නත් අසමත් වී තිබෙනවා. ආර්ථික වශයෙන් විතරක් නොවෙයි, සංස්කෘතික වශයෙන්, ජාති, ආගම්, ලිංගිකත්වය නිසා පීඩාවට පත්වුණු ජන කණ්ඩායම් ඉන්නවා. රටක් ලෙස සියලු ජන කොටස්වල අයිතිවාසිකම් පිළිගන්න අසමත් වී තිබෙනවා. රට රකින්න හෝ රට ගොඩනගන්න මේ දක්වා සිටි සියලුම පාලකයන් අසමත්වීමේ ප්‍රතිඵල පහුගිය අවුරුදු 40ක කාලය තිස්සේ විශේෂයෙන් අත්දකිනවා.

මේ නිසා අපේ රටේ ආර්ථිකය ගොඩනගන්න, සමාජ සාධාරණත්වය ඇති කරන්න, ජාතික සමගිය ගොඩනගන්න හැමදෙනාගේම අයිතිය පිළිගනිමින් සියලුම සමාජ කොටස්වලට සාධාරණත්වය අත්කර දෙන කිසිවෙකු ප්‍රතික්ෂේප නොකර නව සමාජයක් ගොඩනගන්න අවශ්‍යයි. මේ වෙනුවෙන් විකල්ප දේශපාලන බලවේගයක් හැටියට ගොඩනැගෙන ව්‍යාපාරයකින් මහජනතාවගේ පාලනයක් ගොඩනැගීමේ කාර්යභාරය මේ සංවිධානයෙන් ඉටුකරමින් ඉන්නවා. වත්මන් සමාජ ක්‍රමය තුළ තර්කානුකූලව හිතලා නිවැරදි තීන්දු තීරණ ගන්නා ජනතාවක් වෙනුවට දේශපාලන නායකයන්ගේ පිටුපස ගමන් කරන බැතිමතුන්ගේ තත්වයට පත්වුණු ඡන්දදායකයින් පිරිසක් නිර්මාණය කර තිබෙනවා. මේ වගේ තැනක වෙනසක් ඇති කිරීම ඉතාම දුෂ්කර කාර්යයක්.

මේ දක්වා රට පාලනය කළ පිරිස ප්‍රතික්ෂේප කරන ජනතාවගේ ප්‍රමාණය ඉහළ යමින් තිබෙනවා. මෙතෙක් රට පාලනය කළ දෙපිලටම රට ගොඩනැගීමේ ඕනෑකමක් හෝ ඒ වෙනුවෙන් සමාජ ආර්ථික ප්‍රතිපත්ති හෝ ඇත්තේ නැහැ. ඔවුන් සිටින්නේ පවතින තත්වය පාවිච්චි කර තම තමන්ට පුද්ගලිකව බලය ගන්න ව්‍යාපෘතිවලයි. බොරදියේ මාළු බෑමේ ප්‍රතිපත්තිය මිසක්, රටට අලුත් මගක් හඳුන්වාදෙන දේශපාලන ක්‍රියාමාර්ගයක් ඔවුන්ට නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායමත් එක්සත් ජාතික පක්ෂයත් තමන්ගේ අපේක්ෂකයා තෝරා ගැනීමේ සංවාදයක මිස රට ගොඩනැගීම ගැන කිසිම සාකච්ඡාවක් ඔවුන්ට නැහැ. ජනතාව කල්පනා කරන්නේත් කිසියම් නායකයෙකුට ඡන්දය දීලා ඔවුන්ගේ පසුපස යාමෙන් තමන්ගේ ප්‍රශ්න විසඳාගත හැකි බවයි.

ඉතිහාසය පුරාම ඔප්පුකර තිබෙන්නේ මේ තනි තනි නායකයන්ට ජනතාවගේ ප්‍රශ්න විසඳන්න බැරි බවයි. ඒ ප්‍රශ්න විසඳීම සඳහා දැවැන්ත මහජන ව්‍යාපාරයක්, ඒ ව්‍යාපාරයකින් ක්‍රියාවට නගන ප්‍රතිපත්ති, ඒ වෙනුවෙන් දැවැන්ත කැපකිරීම්, අවංකකම අවශ්‍යයි. බලය වෙනුවෙන් හා වරප්‍රසාද වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයන්ට සමාජයක් වෙනස් කරන්න බැරි බව ඉතිහාසය පුරාම ඔප්පු කර තිබෙනවා. නමුත් අපේ

02 පිටුවට

**03 ධනවාදයේ අර්බුදය...**




දේශපාලනයේ පවතින මෙම අර්බුදයත්, අරාජිකත්වයත් සැබෑ ලෙසම මඟ විවෘත කර ඇත්තේ...

**07 වසර මැද ආර්ථිකය...**



විදේශිකයින්ට අත්පත්කර ගැනීමට නොහැකි වූ ජනතා අරගල මගින්ම ආරක්ෂා කරගත් වටිනා...

**10 සොයුරියනි, මේ පාරෙන්...**



ඇඳුමක් ගන්නටගිය විට තෝරා තෝරා හොඳම දෙයක් ගන්නට වග බලා ගනිමු. නමුත් රටේ පාලකයින්...

**11 රජය ව්‍යාප්ත වීමේ...**



ලෝකයේ ලිඛිත ඉතිහාසය යනු බොහෝ විට රාජ්‍යය විසින් නැතිනම් පාලකයන් විසින් ලියන ලද්දක්...

තරුණ................ 04
සංවාදය................ 05
ආවර්ජනා................ 06
ජාත්‍යන්තර................ 12
වේදිකාව................ 13
විශේෂ................ 14

යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සටන් බිම

## නැගෙනහිර ජැටිය විකිණීමේ ගිවිසුම අහෝසි කරන්න වරාය ජාතික ව්‍යාපාරයෙන් උද්ඝෝෂණ



රනිල් වික්‍රමසිංහ මහතා සහ රජය විසින් විෂය භාර අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් කොළඹ වරාය නැගෙනහිර පර්යන්තය සංවර්ධනය කර පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාව, ජපානය හා ඉන්දියාව සමග අත්සන් කළ සහයෝගිතා ගිවිසුම අහෝසි කරන ලෙස ඉල්ලා කොළඹ වරාය නැගෙනහිර පර්යන්තය රැකගැනීමේ ජාතික ව්‍යාපාරය පසුගියදා උද්ඝෝෂණ පැවැත්වීය. වරාය සේවක රැකියා 10,000ක් හා ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් ගෙන දෙමින් ජාතික ආර්ථිකයට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කරනු ලබන ආණ්ඩුවේ ජනතා විරෝධී ක්‍රියාමාර්ග පරාජය කර මෙම ජාතික සම්පත කෙසේ හෝ ආරක්ෂා කර ගත යුතු බව එම ජාතික ව්‍යාපාරයේ කැඳවුම්කරු චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා උද්ඝෝෂකයන් අමතමින් එහිදී පැවසීය. වරාය නැගෙනහිර පර්යන්තය විකිණීමේ ගිවිසුම අහෝසි කරන ලෙස බලකරමින් වරාය සේවකයින් අරඹා ඇති සටනට සමගමීව සියලු සේවකයින් දැනුවත් කිරීමේ අත්පත්‍රිකා බෙදාහැරීම්, ජනමාධ්‍ය හමු පැවැත්වීමට කටයුතු කර තිබුණි.

## පොරොන්දු වූ රු. 50/= ඉල්ලා වතු කම්කරුවන්ගෙන් පෙත්සමක්



පසුගිය කාල වකවානුව තුළ අත්සන් කරන ලද වතු කම්කරු සාමූහික ගිවිසුම මගින් රු. 1000 අරගලය පාවාදීමත් සමඟ වතු කම්කරුවන් වෙතින් ආණ්ඩුවට එල්ල වූයේ බලවත් විරෝධයකි. මේ තත්වය තුළ වැවිලි කර්මාන්ත ඇමති නවීන් දිසානායක, දිගම්බරම් ඇතුළු ආණ්ඩුව නියෝජනය කරන ඇමතිවරුන් විසින් අයවැයෙන් යෝජනා සම්මත කර වතු කම්කරුවෙකුගේ දිනක වැටුපට රු 50/= ක් මැයි මාසයේ සිට එකතු කරන බවට පොරොන්දු වී තිබිණි.

මේ වන විට මැයි සහ ජුනි මාසවල වැටුප් ගෙවා තිබුණද පොරොන්දු වූ රු. 50/- ලබානොදීමට එරෙහිව එම මුදල ලබාදෙන ලෙස ආණ්ඩුවට බලකරමින් සමස්ත ලංකා වතු කම්කරු සංගමය විසින් විරෝධතා බැනරයකට අත්සන් ලබාගැනීමේ ව්‍යාපාරයක් හැටන් නගරයේදී ආරම්භ කෙරිණ. එම අවස්ථාවට සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කේ. සෙල්වරාජ් ලේකම් ජේ.එම්.ඒ. ප්‍රේමරත්න යන සහෝදරවරුන් ඇතුළු හැටන් ප්‍රදේශයේ වතු කම්කරුවෝ රැසක් සම්බන්ධ වී සිටියහ.

## කුණු ගෙනා ජාවාරම්කරුවන් නීතිය හමුවට ගෙනෙනු

### රේගු සේවා සංගමය පවසයි



පසුගිය දිනවල මහත් ආන්දෝලනයට තුඩුදුන් පිටරටින් ආනයනය කරන ලද කුණු බහාලුම් ගෙන්වූ ජාවාරම්කරුවන් වහාම නීතිය හමුවට ගෙන ඔවුන් හෙළිදරව් කළ යුතු බව සමස්ත ලංකා රේගු සේවා සංගමය පවසයි. සමස්ත ලංකා රේගු සේවා සංගමයේ ලේකම් ජේ.ඒ. ගුණතිලක සහෝදරයා පසුගියදා කොළඹදී පවත්වන ලද මාධ්‍ය හමුවකදී මේ බව පැවසීය. මේ වන විට අපද්‍රව්‍ය බහාලුම් 102ක් වරාය තුළ ගොඩගසා ඇති බවත් මේවා 2017 වසරේ සිට ආනයනය කර තිබෙන බවත් තවත් 120 ක ප්‍රමාණයක් වරායෙන් එළියට ගොස් තිබෙන බවත් මෙහිදී ගුණතිලක සහෝදරයා අනාවරණය කළේය. 2013 ජූලි 11 වැනිදා මහින්ද රාජපක්ෂ මහතා විසින් අංක 1818-30 ගැසට් පත්‍රයක් අත්සන් කිරීම මගින් මෙවැනි බහාලුම් නිදහස් කළ හැකි වූ බවත් එබැවින් මෙම කුණු වරායෙන් මෙපිටට ගෙන්වීමේදී රේගුවට කිසිදු මැදිහත් කිරීමක් කළ නොහැකි බවත් ඔහු මෙහිදී පැවසීය.

ලෝක නායකයන් එකතුවී සකසාගත් බාර්සෙල්ස් සම්මුතිය අනුව ජාතික ඝන අපද්‍රව්‍ය ලංකාවට ආනයනය කිරීම තහනම් බවත් ලංකාවත් මෙම සම්මුතියට අත්සන් කර තිබෙන බවත් එසේ තිබියෙදී මෙලෙස ගැසට් පත්‍රයක් නිකුත් කිරීම නිවැරදි නොවන බවත් ඒ පිළිබඳවද ප්‍රශ්නයක් තිබෙන බවත් මෙහිදී ජයකොඩි සහෝදරයා පෙන්වා දුන්නේය. මේ සම්බන්ධයෙන් තම සංගමය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් හිටපු පාලකයන් සහ දැනට සිටින පාලකයන් මෙයට වගකිව යුතු බවත් මෙහිදී ඔහු පැවසීය.

## ගුරු විදුහල්පතිවරු සැප්. 26 -27 අසනීප නිවාඩු ක්‍රියාමාර්ගයකට...



වසර 22 ක් තිස්සේ නොවිසඳී ඇති වැටුප් විෂමතාවය විසඳීම ඇතුළුව ප්‍රධාන ඉල්ලීම් කිහිපයක් මුල්කරගනිමින් ගුරු විදුහල්පතිවරු ආරම්භ කළ වෘත්තීය ක්‍රියාමාර්ගයේ ඉදිරි ක්‍රියාමාර්ග අරඹමින් සැප්. 26-27 දෙදින අසනීප නිවාඩු වාර්තා කිරීමක් හා සැප්. 26 කොළඹදී දැවැන්ත උද්ඝෝෂණයක් පැවැත්වීමට තීරණය කර ඇති බව ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පවසයි.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරු විදුහල්පතිවරුන් හා රටේ ජනතාව රවටමින් රුපියල් ලක්ෂ ගණනින් ජනතා මුදල් වැයකරමින් පත්තරවල දැන්වීම් පළ කළද ගුරුවරුන්ගේ වැටුප් විෂමතාවය ඉවත් කිරීම වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ආණ්ඩුව විසින් ගෙන නැති බව පවසන මහින්ද ජයසිංහ සහෝදරයා ඉදිරියේදී මෙම සටන ජයග්‍රහණය තෙක් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවද ඒ වෙනුවෙන් සියලු ගුරු විදුහල්පති සංගම් මෙම අරගලය සඳහා එක්වී සිටින බවද මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය. එමෙන්ම මෙම ක්‍රියාමාර්ගය සඳහා ගුරු විදුහල්පති සංගම් 30කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වීමට නියමිත බවද මහින්ද සහෝදරයා පැවසීය.

## අන්තරේ ශාඛා නිලධාරී නියෝජිත සමුළුව මුළුදෙයි



අන්තර් සමාගම් සේවක සංගමයේ ශාඛා නිලධාරී නියෝජිත සමුළුව පසුගියදා කොළඹ සෞන්දර්ය නිකේතනයේදී එම සංගමයේ සභාපති වසන්ත සමරසිංහ හා ලේකම් නීතිඥ ජානක අධිකාරී යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. 'රට රකින රට ගොඩනගන, වැඩකරන ජනතා බලය ශක්තිමත් කිරීමට, පෞද්ගලික අංශයේ සේවකයින් පෙළගස්වමු' යන තේමාව යටතේ පැවති මෙම නියෝජිත සමුළුවේදී ඉදිරි වර්ෂය සඳහා යෝජනා කිහිපයක්ම සම්මත කර ගනු ලැබීය.

## විකල්පයේ අපේක්ෂකයා..

01 වැනි පිටුවෙන්

රටේ එවැනි දේශපාලනයක් ගැන ජනතාවගේ සංවාදය කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. සමහර නායකයින් ජනාධිපති අපේක්ෂකකම ලැබෙයි කියන බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ අයගේ බිරින්දෑවරු ජනාධිපති ආර්යාවන් වීමේ සිහින දකිනවා. මේ අයට රටක් හදන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මේ රට වෙනස් කරන්න ඕනෑ කරන ප්‍රතිපත්තිත් ඒ අනුව ක්‍රියාමාර්ගත් ගොඩනගා ගනිමින් ඒ දේශපාලනය වටා දැවැන්ත මහජන බලවේගයක් ගොඩනගා ගැනීමට ජාතික ජන බලවේගය පිහිටුවාගෙන තිබෙනවා.

වසර 71ක තට්ටුමාරු දේශපාලනය ප්‍රතික්ෂේප කරලා අපේ රට අලුත් මාවතක ගෙනියන්න එකතුවුණු සංවිධාන සහ කණ්ඩායම් රැසකින් සමන්විතව ජාතික ජනබලවේගය වටා අපේ රටේ ජනතාව ඒකරාශි කර ගැනීමේ දැවැන්ත රැලියක් අගෝස්තු 18වැනිදා ගෝල්ෆේස් පිටියේදී අපි පවත්වනවා. මේ බලවේගයේ මූලික අරමුණ මැතිවරණය වෙනුවෙන් ක්‍රියාකිරීම නොවෙයි. ඊට වඩා දිගුකාලීන සැලසුම් අපිට තිබෙනවා. නමුත් ඒ අතර අප ඉදිරියට එන මැතිවරණවලටත් මුහුණ දෙනවා. ඉදිරි ජනාධිපතිවරණය සඳහා ජාතික ජන බලවේගයෙන් ඉදිරිපත් කරන අපේක්ෂකයා අපි මේ දැවැන්ත මහජන රැලියේදී රටට හෙළිදරව් කරනවා. ජාතික ජන බලවේගය වටා එකතු වන ලෙස සියලු ජනතාවට ආරාධනා කරනවා."

## ජනාධිපතිවරණය කල්දාන්න...

16 පිටුවෙන්

වගකිව යුතුයි. විශේෂයෙන්ම රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ගන්නා තීන්දු තීරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතුයි. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පත්කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට ජනාධිපතිවරයා සහභාගී නොවන බව කියා තිබුණා. තේරීම් කාරක සභාව කියන්නේ පාර්ලිමේන්තුවෙන් පත්කරන එකක්. ඒ සඳහා ජනාධිපතිවරයා අනිවාර්යයෙන් සහභාගි විය යුතුයි. රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයන් ගන්නා තීන්දු තීරණ තේරීම් කාරක සභාවට පැහැදිලි කළ යුතුව තිබෙනව. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(අ) වගන්තියේ සඳහන් වෙනවා. එම නිසා ජනාධිපතිවරයාට වංගු ගහන්න පුළුවන්කමක් නැහැ.

### ආණ්ඩුව අසමත් බව කියන්න කුණු කන්ටේනර් සිදුවීම හොඳම උදාහරණයක්

ඒ වගේම මේ වනවිට කුණු කන්ටේනර් තොගයක් පිළිබඳව රටේ මහත් ආන්දෝලනයක් මතුවෙලා තිබෙනවා. සායනික අපද්‍රව්‍ය ප්‍රමාණයක් කටුනායක අංගනයේ තිබී හසුවීමත් එම අපද්‍රව්‍ය කාලයක් තිස්සේ පරිසරයට නිරාවරණය වීම නිසාත් විශාල ගැටලුවක් මතුවෙලා තිබෙනවා. පරිසර ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. මෙවැනි වර්ගයේ කුණු ලංකාවට ගෙන ඒමට ඉවහල් වුණු ක්‍රියාවලියක් තිබෙනවා. 2012 මාර්තු 30වැනිදා අපේ රටේ මුදල් පනත සංශෝධනය වුණා. ඇතැම් භාණ්ඩ ආනයනය කිරීමේදී රේගු ආඥා පනත, විනිමය පනත සහ ආනයන අපනයන පනත බල නොපැවැත්වෙන පරිදි ඒ මොහොතේදී මුදල් පනත සංශෝධනයට ලක් වුණා. මුදල් පනත සංශෝධනය වීමෙන් පසුව 2013 ජූලි මස 07වැනිදා ඒ සම්බන්ධ ගැසට් පත්‍රය නිකුත් වුණා. ඒ මගින් ආනයන අපනයනවලදී බලපාන විශේෂ කේන්ද්‍රස්ථාන කිහිපයක් නම් කොට තිබෙනවා. ඒ වගේම මෙම ස්ථාන දෙපාර්තමේන්තු නියෝග මගින්ද තහවුරු කරනු ලැබ තියෙනවා. ඒ අනුව කොළඹ සහ හම්බන්තොට වරාය නිදහස් වරායන් ලෙස නම්කොට තිබෙන අතර කොග්ගල, කටුනායක නිදහස් අපනයන සැකසුම් කලාප බන්ධිත කලාප ලෙස නම්කොට තිබෙනවා. ඒ වගේම මත්තල ගුවන්තොටුපොළත් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයත් විශේෂ බන්ධිත කලාප ලෙස නම්කොට තිබෙනවා.

මෙම කලාපවලදී ආනයනය භාණ්ඩ බදුවලින් නිදහස් වෙනවා. ඒ අනුව තමයි මෙම අපද්‍රව්‍ය සහිත කන්ටේනර් ලංකාවට ගෙන එන්නේ. කන්ටේනර් 220කට අධික ප්‍රමාණයක් හමුවී තිබියදී ගෙන්නපු අය හොයාගන්න බැහැ කියලා මුලින් ප්‍රකාශ වුණා. මෙම ගනුදෙනුවට සම්බන්ධ හේලීස් ෆ්‍රී සෝන් පුද්ගලික සමාගම නිවේදනයක් මගින් ප්‍රතික්ෂේප කොට තිබුණත් මෙම භාණ්ඩ ගෙන්වූයේ එම ආයතනය බව පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා. ලන්ඩන් සිට ගෙන්වන ලද මෙම අපද්‍රව්‍ය අඩි 20∘40 බහාලුම්වල ගෙනවිත් තිබෙන බවත් ඒ අතර භාවිත කරන ලද මෙට්ට අඩංගු බවත් රේගු විස්තරවල සඳහන් වෙනවා. ඒ වගේම ආයෝජන මණ්ඩලයේ නිවේදනය මගින්ද හේලීස් ෆ්‍රී සෝන් පුද්ගලික සමාගමට එරෙහිව අවශ්‍ය පියවර ගන්නා බවද සඳහන් කොට තිබෙනවා.

මෙම කුණු තොගය ගෙන්වන්නේ 2017දීයි. නමුත් රේගුවට, පරිසර අධිකාරියට මේවා අත්අඩංගුව ගන්න බැරිවෙනවා. මීට සති දෙකකට ඉහතදී තමයි මේවා සොයාගෙන තිබෙන්නේ. ඒක බරපතළ ප්‍රශ්නයක්. මේ ආකාරයට අපේ රටට ඕනෑම කුණු ගොඩක් ගේන්න පුළුවන්. අපේ රටේ ආණ්ඩු මගින් පනත් ගැසට් හදලා සම්මත කරලා දීලා තිබෙනවා. සිංගප්පූරු ගිවිසුම මගින් මේ නීතිමය තත්වය තවත් තහවුරු වෙනවා. එම ගිවිසුමේ පැහැදිලිව සඳහන් වෙනවා අපද්‍රව්‍ය ගේන්න පුළුවන් කියලා. අපේ රට කුණු හබ් එකක් කරන්නයි මේ හදන්නේ. රටකින් රටකට කුණු ආනයනය අපනයනය කිරීම ලේසි කරුණක් නෙවෙයි. එම රටවල් දෙක අතර සම්මුතියක් තිබිය යුතුයි. මීට අවුරුදු 27කට පෙර ශ්‍රී ලංකාව අත්සන් කරපු බාසල් සම්මුතිය නම් සම්මුතියක් තිබෙනවා. එයින් ලංකාවට කුණු ගේන එක තහනම් කළා. ඒ වගේම ප්‍රති අපනයනයත් තහනම්. කුණු ගේන්න නීති හදන ආණ්ඩුව බාසල් සම්මුතිය වැනි රටට හිතකර සම්මුතියක් නීතියක් කරන්න කිසිවක් කරන්නේ නැහැ. ඒක ලොකු අනතුරක්. ඒනිසා අපි ආණ්ඩුවට කියනවා, ගෙනත් තිබෙන කුණු කසළ තොගය ප්‍රතිඅපනයනය නොකර විනාශ කර දාන්න කටයුතු කරන්න කියලා. එය ජනතාවටත් පරිසරයටත් හානි නොවන ආකාරයෙන් සිදු කිරීමට ආණ්ඩුව කටයුතු කළ යුතු වෙනවා. මෙම කුණු තොගයෙන් යම් ප්‍රමාණයක් වළ දාලා තිබෙන බවට ආරංචියක් තිබෙනවා. එයද පරිසරයට සිදුවන හානියක්. එම නිසා ආණ්ඩුව මෙම කුණු තොගය සඳහා ආරක්ෂාවක් ලබාදිය යුතු වෙනවා. සාමාන්‍යයෙන් අපේ රටේ නීතියට අනුව ආනයනය කරන ලද භාණ්ඩ මාස දෙකක් ඇතුළත නිදහස් කර නොගන්නේ නම් රජයට පවරා ගන්නවා. නමුත් මෙම කුණු තොගය 2017 ගෙන්වපු ඒවා. මේ තරම් කාලයක් තිබුණේ කොහොමද? අපේ රටේ පරිසර අමාත්‍යාංශයත් මුදල් අමාත්‍යාංශයත් ආණ්ඩුවත් අසමත් බව කියන්න මේක හොඳම උදාහරණයක්. මේ අසමත්කම නිසා තමයි අපේ රටට මහා පරිමාණයෙන් කුඩු ගෙන්වන්නේ. ජනාධිපතිවරයා එල්ලුම්ගහ ගැන කිවුවට කුඩු ගේන එක නතර වෙලා නැහැ. මේ කුණු කන්ටේනර් අස්සෙත් කුඩු ගේන්න පුළුවන්. ඒක අහන්න දෙයක් නැහැ. එම නිසා අපි ආණ්ඩුවට අවධාරණය කරනවා මේ සම්බන්ධයෙන් නීති වෙනස් කරන්න කියලා"

මෙම අවස්ථාවට ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික ලක්ෂ්මන් නිපුනාරච්චි සහෝදරයාද සහභාගි විය.

## ධනවාදයේ අර්බුදය...

3 පිටුවෙන්

ඉන් ඉදිරියට යාමය. සැබෑ මහජන බලයක් අවශ්‍ය වන්නේ ඒ අනුවය.

දැනටමත් ගොඩනැඟෙමින් තිබෙන වමේ, ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කඳවුර ඉතා ඉක්මනින් මහජන ව්‍යාපාරයක්, මහජන බලයක් බවට පත්කර ගන්නේ නම් ලාංකේය දේශපාලනයේ විකට රූපවල නාඩගම් අවසන් කොට රට නිවැරදි ගමන් මඟකට යොමු කළ හැකි බව ඉතා පැහැදිලිය. එබැවින් දැන් කළ යුතු වන්නේ, දේශපාලන විකට රූප දෙස බලා සිටීම නොව, ගොඩනැඟෙමින් පවතින වමේ හා ප්‍රගතිශීලීන්ගේ කඳවුර ශක්තිමත් කොට විශාලතම මහජන ව්‍යාපාරය ගොඩනැඟීමය. ඒ සඳහා එක් අවස්ථාවක් ලෙස ජනාධිපතිවරණය උපයෝගී කරගැනීම හා ජනාධිපතිවරණයේදී වමේ හා ප්‍රගතිශීලී කඳවුරෙන් ඉදිරිපත් වන ප්‍රබල අපේක්ෂකයෙකුට ලංකාවේ දේශපාලන අනාගතය මුළුමනින්ම වෙනස් කිරීමේ හැකියාව තිබෙන බව අවධාරණය කර ගත යුතුය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# විකල්ප මහජන ව්‍යාපාරයක ඇරඹුම

ධනපති ක්‍රමය දුගඳ හමන මළකුණකියි වරක් කීවේ ලෙනින්ය. ඒ, මීට සියවසකට පෙරය. ලංකාවේ ධනපති ක්‍රමයද දැන් මියගිය දුගඳ හමන මළකුණක්මය. එයට නැවත පණදීමට හෝ ජීවත්කරවීමට කිසිවෙකුට නොහැකිය. ධනවාදයේ අර්බුදයට විසඳුම් සෙවීමට ධනපති පක්ෂවලට කිසිදු හැකියාවක් නැත. ධනවාදයේ අර්බුදයෙන් මිදීමට ධනපති පංතියට නොහැකි බවත් ධනවාදයේ අර්බුදයෙන් මිදීමට ධනේශ්වර පංතිය දරන උත්සාහය හරියටම අයෙක් තමන්ගේම සපත්තුවේ පටිවලින් ඇද තමන්ව ඔසවා ගැනීමට උත්සාහ කිරීමක් වැනි යැයි පැවසුවේද ලෙනින්මය. එබැවින් දැන් ලංකාවේ ධනවාදයේ අර්බුදයට ඇති එකම විසඳුම වන්නේ, සමාජවාදී මූලධර්ම මත ගොඩනැගෙන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකි.

ධනවාදයේ වත්මන් අර්බුදය විසින් ඉල්ලා සිටියේ විකල්ප මහජන ව්‍යාපාරයකි. රට හදන විකල්ප ප්‍රතිපත්ති සහිත වාමවාදීන්ගේ ප්‍රගතිශීලීන්ගේ, මානවවාදීන්ගේ, ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ එකතුවක් තුළින් බිහිවන විකල්ප මහජන ව්‍යාපාරයකි. දීර්ඝකාලීන අත්දැකීම් විසින් උගැන්වූ පාඩම් සහිත, වර්තමාන සමාජ අවශ්‍යතාවය හඳුනාගත් හා ඊට පිටුපෑමට නොහැකි වූ සමාජ බලවේග ගණනාවක එකතුවෙන් එකී මහජන ව්‍යාපාරය ගොඩනැගීමේ ආරම්භය පසුගිය ජූලි 14 දා කොළඹදී සිදුවිය. ඒ, ජාතික ජන බලවේගය බිහිවීමය. මෙය මේ මොහොතේ ඉටුකරමින් සිටින්නේ ලාංකේය දේශපාලනයේ ඓතිහාසික අවශ්‍යතාවයක් ඉටුකිරීමක් බව නිසැකය.

පසුගියදා බිහිවූ මෙම මහජන ව්‍යාපාරය වමේ පක්ෂ හා සංවිධාන ප්‍රගතිශීලී සංවිධාන, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින සංවිධාන, පීඩිත හා කොන්කරනු ලැබූ ජන කණ්ඩායම්වල අයිතීන් වෙනුවෙන් පෙනී සිටින සංවිධාන, වෘත්තීය සමිති, ගොවි සංවිධාන, තරුණ, කාන්තා සංවිධාන ආදී විවිධ සංවිධාන රැසක එකතුවකි. මෙම සෑම සංවිධානයකටම තමන්ගේම වූ මතයක් දැක්මක් හා ක්‍රියාකාරිත්වයක් තිබේ. එහෙත් වැදගත්ම දෙය නම්, එම වෙනස්කම් තබාගනිමින්ම මේ සියලු දෙනා පොදු අරමුණකින් එකට බැඳීමය. ඒ පොදු අරමුණ නම් පවතින දූෂිත හා බංකොලොත් ක්‍රමය වෙනස් කර නව සමාජයක් බිහිකිරීම සඳහා වන මහජන ව්‍යාපාරයක් ගොඩනැගීමය. එහිදී තම සංවිධානවල අනන්‍යතා රැකගනිමින්ම පොදු අරමුණ වෙනුවෙන් කැපවීමට මෙම සංවිධාන අධිෂ්ඨාන කරගෙන සිටීම ඉතාම සුබදායකය.

මෙහි වන විශේෂිතම කරුණ වන්නේ, මෙය හුදු ඡන්ද පෙරමුණකට සීමා නොවුණු දීර්ඝකාලීන සමාජය තුළ ජනතාව සමග දේශපාලනය කිරීමට සූදානම් මහජන ව්‍යාපාරයක් වීමය. එය ප්‍රභූ නායකයෙක් වටා එක්වූ කණ්ඩායමක් නොව, සමාන වගකීම් හා සමාන අයිතීන් ඇති ස්වේච්ඡාවෙන් කටයුතු කරන ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත එක්වූ දේශපාලන ව්‍යාපාරයකි. රටේ ජනතාවට නව බලාපොරොත්තුවක් ඇතිකර ගත හැක්කේ ඒ නිසාය.

වත්මන් ධනවාදය තුළ ධනවාදය රකින ජනතාවගේ සතුරන්ගේ බාධා මැද මෙවැනි පුළුල් සංවිධානයක් පවත්වාගෙන යාම අතිශයින්ම අභියෝගාත්මකය. එහෙත් එම අභියෝගය ජය ගැනීමට අවශ්‍ය දැනුමත්, දැක්මත්, අධිෂ්ඨානශීලීත්වයත්, කැපවීමත් මෙහි සියලුදෙනා සතුව ඇති බව එහි පළමු සමුළුවෙන්ම පෙන්නුම් කර තිබේ. එයද සුබවාදී බලාපොරොත්තු දල්වන්නකි.

ජනතා විමුක්ති පෙරමුණද සමාන කොටස්කරුවෙකු ලෙස වගකීම් දරන මෙම නව මහජන ව්‍යාපාරය ඉතාම පැහැදිලිව යුගයේ අවශ්‍යතාවක් වේ. ධනපති පක්ෂ විසින් මැතිවරණ ඉලක්ක කර ගනිමින් අටවන විවිධ අවස්ථාවාදී පෙරමුණුවලට, රංචු ගැසීම්වලට එරෙහි පැහැදිලි අභියෝගයක් වන්නේද මෙයමය. ජනතාවට අලුත් මඟක් හා අලුත් දේශපාලන සංස්කෘතියක් සඳහා මඟපෙන්වීමට ඊට ඇති හැකියාව විශාලය.

දැන් මෙම ජාතික ජන බලවේගය මෙරට පීඩාවට පත් සියලු ජන කණ්ඩායම්වලට මෙන්ම සමාජයේ වෙනසක් අපේක්ෂා කරන අවංක පුරවැසියන්ට අයත් ඔවුන්ගේම බලවේගය වේ. එබැවින් එය හඳුනාගැනීම, ඒ සමග අත්වැල් බැඳ ගැනීම එය පෝෂණය කිරීම, එය ආරක්ෂා කිරීම හා එය සමාජය වෙනස් කළ හැකි මහා ජන බලයක් බවට වහ වහාම පත්කර ගැනීම ජනතාවගේ වගකීමය. එහිදී එහි ප්‍රබල කොටස්කරුවෙකු ලෙස වගකීම් ඉටුකිරීමේ අධිෂ්ඨානයෙන් සිටින අප මෙම නව මහජන ව්‍යාපාරයේ ජයග්‍රහණය වෙනුවෙන් සුබ පතමු!


# ධනවාදයේ අර්බුදය හා දේශපාලනයේ විකට රූප

ලාංකේය ධනවාදය දැන් පවතින්නේ, හිස සිට දෙපතුල දක්වාම අර්බුදයට ගිය සමාජයක් සේය. ලංකාවේ අර්බුදය සරල එකක් නොවේ. එය ආර්ථික, දේශපාලන, සමාජයීය හා සංස්කෘතිකමය අර්බුදයක් ලෙස සෑම අංශයකින්ම විද්‍යමානව තිබේ. ආර්ථිකයේ පවතින විශාලතම අර්බුදය හා විනාශකාරී ආර්ථික උපායමාර්ගය (නව ලිබරල්වාදය) විසින් දැවැන්ත සමාජ අර්බුදයක්ද ඒ තුළ සංස්කෘතිකමය අර්බුදයක්ද නිර්මාණය කරනු ලැබ තිබේ. හුදකලාව හැසිරෙන, අතාර්කික ලෙස හිතන, ආත්මාර්ථකාමයට ගොදුරු වූ, දැකීමෙන් අන්ධ වූ, මිනිස් සමූහයක් බිහිවී තිබේ. ඊට අනුව දේශපාලනයේද මේ අර්බුදය තීව්‍ර වී තිබේ. වගකිවයුතු ලෙස කටයුතු කළ යුතු ධනවාදී දේශපාලකයෝ හා ඔවුන් පසුපස ගාටන්නෝ දේශපාලනයේ විහිළුකාරයෝ බවට පත්ව, විකට රූප පෙන්වමින් සිටිති.

මේ දිනවල සමාජයේ ප්‍රධාන දේශපාලන කතිකාවක් පවතින්නේ ජනාධිපතිවරණය මුල්කර ගනිමිනි. වසර 71ක් මෙරට බලය හෙබවූ ධනපති කණ්ඩායම් දෙකම ජනාධිපතිවරණය ඉදිරියේ අර්බුදයට ගොස් තිබේ. ඒ, තවම තම ජනාධිපති අපේක්ෂකයා කවුදැයි නම් කිරීමට නොහැකිවීම නිසාය. ඒ නිසා මේ පක්ෂ දෙක තුළම හැමකෙනාම 'සිහින ජනාධිපති' කෝලමකට ඇඳ තිබේ. එ.ජා.ප.යේ සජිත් ජනාධිපතිකමට සිහින දකින විට ඔහුගේ බිරිඳ දැනටමත් 'ආර්යාව' වී තිබේ. රටට අඩුවී තිබුණේ එපමණය! අනික් අතින් කරු ජයසූරියද සිහින ජනාධිපති තරගයේ සිටී. ඒ අතර 2015 ජනාධිපතිවරණයේ සිදුවූ දේ නැවත නැවත සිදුවෙතැයි සිතන සමහර මහත්වරු මීළඟ 'මෛත්‍රීපාල' වීමටද සිහින දකිති.

එ.ජා.ප.යේ අපේක්ෂක අර්බුදය නිසා එ.ජා.ප. නොවන කෙනෙකුට අවස්ථාව සැලසේ යැයි සිතන අය බොහෝ දෙනෙක් පොදු අපේක්ෂකයා හෙවත් මීළඟ 'මෛත්‍රීපාල' වීමට කල්පනා කරති. චම්පික සිටින්නේ ඒ අතර ඉදිරියෙනි. තවත් කිහිපදෙනෙක්ම එසේ සිතමින් සිටිති. ජනාධිපති ධුරයක වගකීමේ බරපතළකම හෝ ඊළඟ ජනාධිපතිවරයා බලතල ඉතාම සීමිත කෙනෙක්ය යන්න පිළිබඳ අදහසක් හෝ සිතිවිල්ලක්වත් ඔවුනට නැත. එකම සිහිනය අර්බුදය විසින් තමාට අවස්ථාවක් සැලසේ යැයි සිතමින් එම සිහිනය තුළ සැරිසැරීමය.

මහින්ද රාජපක්ෂ පිළ තුළද මේ තත්වයම පවතී. ව්‍යවස්ථාවට අනුව මහින්දට ජනාධිපතිවරණය සඳහා තරග කළ නොහැකි තත්වය තුළ, රාජපක්ෂවරු සියලු දෙනාම (ගෝඨාභය, චමල් ආදී) ජනාධිපතිවරණයේ




සිහින දකිති. ඒ අතර ශිරන්තිද නැතිවා නොවේ. රාජපක්ෂ පවුලට පිටින් අවස්ථාව ලබාගැනීමට සිතා සිටින අයද ඒ අතර වෙති. දිනේෂ් ගුණවර්ධන සිටින්නේ ඒ අතරය.

ප්‍රධාන ධනපති දේශපාලන ධාරා දෙකෙහි මෙම අර්බුදය නිසාත්, ලාංකේය සමාජය තුළ ධනපති පක්ෂ දෙකම ප්‍රතික්ෂේප කරමින් විකල්පයක් ගැන සිතන ඡන්දදායකයන් ප්‍රමාණය 25%කට වඩා වැඩි යැයි ලැබෙන සමීක්ෂණ වාර්තා නිසාත්, විකල්පයේ ජනාධිපති වීම සඳහාද පොරයක් පවතී. ඉතාම විහිළුකාරීව සිතන අපේක්ෂකයන් සිටින්නේ ඒ තුළය. මේවා දේශපාලන විකට රූප වේ. එම විකට රූප අතර මුලින්ම සිටියේ පල්ලෙවත්ත නම් ව්‍යාපාරිකයෙකි. තම පෞද්ගලික ධනයෙන් ලංකාවේ සියලුම රාජ්‍ය ණය ගෙවා දැමීමට කථා කළේද ඔහුය. දැන් මේ වන විට ඔහු පසෙකට තල්ලු කරමින් වෙනත් විකට රූප මතුවෙමින් තිබේ.

නාගානන්ද සිටින්නේද එම විකට රූප ගොඩ අතරය. එක්තරා එෆ්එම් නාලිකාවක් වහාබ්වාදය කුමක්දැයි ඇසූවිට ඊට ඍජු පිළිතුරු නොදී 'වටේ ගිය' ඔහු අවසානයේ එම නාලිකාව විසින් මොහොමඩ් ඉබින් අබ්දුල් වහාබ් දන්නේ දැයි ඇසූ විට තමා විසින් පැවරූ නඩුවේ එවැනි පුද්ගලයෙක් සිටීදැයි මතක නැති බව පවසා තමා මොන තරමේ විකටයෙක්ද යන්න පෙන්වීය. ඒ අතර මේ වන විට ආනයනික කසළ බහාලුම් පිළිබඳ අවුලකට පැටලී සිටින ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක්ද, ජනාධිපති සටනට ඒමට සූදානමින් සිටී. ඒ බොහෝ විට රනිල් වික්‍රමසිංහගේ ආරාධනයෙනි. මෙම සිහින ජනාධිපති පෝලිමේ තවත් දන්නා නොදන්නා බොහෝ දෙනා සිටිති. විශ්‍රාමික ඉහළ රාජ්‍ය නිලධාරීහුද ඒ අතර වෙති. මෙහි ලොකුම විකටයා බවට පත්ව සිටින්නේ තමාගේ අධිෂ්ඨාන බලයෙන් අමෙරිකා එක්සත් ජනපදයට වැසි වස්සවා මුළු ඇමෙරිකාවම යටකර දමන බව පැවසූ පුද්ගලයාය. ඔහුද ලංකාවේ සිහින ජනාධිපති අපේක්ෂකයෙකි. අහෝ...! රටකට ගිය කළ යයි අයෙකුට සිතෙන්නේ මේ අනුවය.

> දේශපාලනයේ පවතින මෙම අර්බුදයත්, අරාජිකත්වයත් සැබෑ ලෙසම මඟ විවෘත කර ඇත්තේ විකට රූපවලට හෝ ඒකාධිපතියන්ට නොව සැබෑ වමේ ප්‍රගතිශීලී මහජන බලයකටය. ධනවාදයේ අර්බුදයට හුදකලා පුද්ගලයන් සතුව විසඳුම් ඇතැයි සිතන්නේ නම් හෝ මානසික රෝගයකින් පෙළෙන්නෙකු හෝ මන්ද මානසික තත්වයේ කෙනෙක් විය යුතුය. ධනවාදයේ අර්බුදයට විසඳුම් ධනපති පංතිය සතුව නැත. මෙම ගැඹුරු, තීව්‍ර අර්බුදය විසඳිය හැකි වන්නේ නිවැරදි, සමාජ ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් මත පිහිටා රට තුළ පුළුල් සමාජ පරිවර්තනයක් කිරීමට සමත් මහජන බලවේගයකටය.

ජනාධිපතිවරණයක් අභිමුව මෙවැනි විකට රූප මතුවන්නේ ඇයි? එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ, පවතින ගැඹුරු සමාජ ආර්ථික දේශපාලන අර්බුදය විසින් එක් අතකින් සම්ප්‍රදායික ධනේශ්වර කණ්ඩායම් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙමින් තිබීමත්, මෙතෙක් ඒ ස්ථානය අත්කර ගැනීමට වමේ හා ප්‍රගතිශීලී බලවේග අපොහොසත්ව සිටීමත්ය. ධනවාදය අර්බුදයට ගොස් අරාජිකත්වයක් නිර්මාණය කර ඇති තත්වය තුළ එම අරාජිකත්වයේ විකල්ප ඉඩ වමට හා ප්‍රගතිශීලීන්ට පිරවීමට නොහැකි වූ විට මෙවැනි විකාර රූප මතුවීම ස්වභාවිකය. මෙය වඩාත් අනතුරුදායක වන්නේ, විකට රූප මතුවෙනවා වෙනුවට මෙම අරාජිකත්වය, ඒකාධිපතියෙකුගේ බිහිවීමටද හේතු සැපයිය හැකි නිසාය. එබැවින් වත්මන් අර්බුදය තුළ ජනප්‍රිය මතවාද ඔස්සේ පහසු විකට රූප හෝ ඒකාධිපතියන් සොයනවා වෙනුවට අර්බුදයට සැබෑ විසඳුමක් සෙවීම දැන් කාගේත් වගකීමක් බව කිව යුතුය.

කෙසේ වෙතත් දේශපාලනයේ පවතින මෙම අර්බුදයත්, අරාජිකත්වයත් සැබෑ ලෙසම මඟ විවෘතකර ඇත්තේ විකට රූපවලට හෝ ඒකාධිපතියන්ට නොව සැබෑ වමේ ප්‍රගතිශීලී මහජන බලයකටය. ධනවාදයේ අර්බුදයට හුදකලා පුද්ගලයන් සතුව විසඳුම් ඇතැයි සිතන්නේ නම් හෝ මානසික රෝග යකින් පෙළෙන්නෙකු හෝ මන්දමානසික තත්වයේ කෙනෙක් විය යුතුය. ධනවාදයේ අර්බුදයට විසඳුම් ධනපති පංතිය සතුව නැත. මෙම ගැඹුරු, තීව්‍ර අර්බුදය විසඳිය හැකි වන්නේ නිවැරදි, සමාජ ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් මත පිහිටා රට තුළ පුළුල් සමාජ පරිවර්තනයක් කිරීමට සමත් මහජන බලවේග යකටය. එම බලවේගය වමේ හා ප්‍රගතිශීලී දැක්මක් සහිත එකක් විය යුතුය.

වර්තමාන දේශපාලනයේ පැහැදිලිවම හිස් තැනක් පවතී. නැත්නම් විකල්ප බලයක් සඳහා වන සමාජ අවශ්‍යතාවයක් පවතී. මෙවැනි දේශපාලන හිස්තැන් සමාජ අවශ්‍යතාවයන් දිගු කලක් හිස්ව පවතින්නේ නැත. මෙම දේශපාලන හිස්තැන නිවැරදි බලවේගයක් විසින් පුරවනු ලැබීමට අසමත් වන්නේ නම්, ඒ තැන විකටයන් විසින් හෝ ඒකාධිපතියන් විසින් පුරවනු ලබනු ඇත. එහෙත් එයට ඉඩදිය යුතු නැත. මෙම දේශපාලන හිදැස වමේ හා ප්‍රගතිශීලී බලවේග විසින් පිරවිය යුතුව ඇත. නැවත 2015 සිදුවූ දේම සිදුවෙතැයි ඇතමුන් සිතා සිටියද, 2015 නැවත සිදුවන්නේ නැත. එය ඉතිහාසයට අත්දැකීම් එකතුකරමින් අවසන්ව තිබේ. දැන් අවශ්‍ය

02 වැනි පිටුවට



## YES WE CAN

# රැවටෙමුද? ගොඩයමුද?

ජනතාව රැවටීම මෙම පාලකයන්ගේ සහජ ලක්ෂණයකි. රූපවාහිනිය දෙස බලාසිටින ඕනෑම කෙනෙකුට හැඟෙන්නේ මේ ආණ්ඩුව ජනතාව ගැන කොයිතරම් නම් සංවේදීද කියාය. ඒ වෙන කිසිවක් නිසා නොව තරුණයින්ට හා දුප්පත් ජනතාවට දෙනවා යැයි කියන සංවේදී පොරොන්දු නිසාය. විනාඩියෙන් විනාඩියට ප්‍රචාරක දැන්වීම්ය. දුප්පතාට සමෘද්ධිය, තරුණයින්ට උසස් අධ්‍යාපනය, විවාහකයින්ට නිවාස ණය, විදෙස්ගත ශ්‍රමිකයින්ට අදහාගත නොහැකි ණය, ශිෂ්‍යයන්ට ටැබ්, ඇඟපත ආරපු අපේ ගැමියන්ට පිම් කට්ටල, උපාධිධාරීන්ට රැකියා; මේවා නැවත වරක් රටම රැවටීමට ගෙන එන ඊනියා පොරොන්දුය.

උපාධිධාරීන්ට රැකියා ලබාදීම මෙම බොරු පොරොන්දුවලට කදිම උදාහරණයයි. අපේ රටේ රැකියා නොමැති උපාධිධාරීන් 60,000ක් පමණ සිටින නමුත් ආණ්ඩුවේ මීටර්වලට මෙම ඉලක්කම හසුවන්නේ නැත. මෙයින් 35,000කට ආසන්න පිරිසක් සිටින්නේ බාහිර උපාධිධාරීන්ය. මෙම සංඛ්‍යාව ආණ්ඩුවේ සංවේදී මීටරයට කොහෙත්ම හසුවන්නේ නැත.

ඒ බව පෙනී යන්නේ ජූලි මස 19වැනි දින දිස්ත්‍රික් කාර්යාලවලට එවූ රැකියා ලබාදෙන නාමලේඛනය දෙස බැලීමෙන්ය. ආණ්ඩුව රැකියා දෙන්නට සැරසෙන්නේ 60,000න් 16,000කට පමණි. එයිනුත් බාහිර උපාධිධාරීන් කිසිවෙකුට රැකියා ලබාදී නොමැත.

බාහිර උපාධිධාරීන්ට කුඩම්මාගේ සැලකිලි දක්වන්නට මෙම සංවේදී යැයි කියාගන්නා අසංවේදී පාලකයින් පටන්ගන්නේ 2016 සිටය. 2016/13 චක්‍රලේඛය ගෙන එමින් ආණ්ඩුව බාහිර උපාධි අධ්‍යාපනයට සීමා පැනවීය. එතැනින් නොනැවතුණු මෙම අසංවේදී පාලකයින් 2017 වසරේ 4,035කට රැකියා ලබා දෙන්නේ බාහිර උපාධිධාරීන්ට කෙනහිලිකම් කරමින්ය. රැකියා පත්වීම් ලබාගැනීමේ උත්සවය සඳහා සහභාගී වීමට පැමිණි 60 දෙනෙකුට අරලියගහ මන්දිරයේ දොර වැසෙන්නේ බාහිර උපාධිධාරීන් වීම නිසාය.

නමුත් ඒ මොහොතේ පැනනැගුණු විරෝධතා හමුවේ ආණ්ඩුව පොරොන්දු වූයේ නැවත රැකියා ලබාදීමේදී කිසිම දිනෙක අභ්‍යන්තර හෝ බාහිර යන අවිද්‍යාත්මක බෙදීම නොසලකන බවටත් සලකන්නේ උපාධි වර්ෂය බවටත්ය. නමුත් අද වනවිට පෙනෙන්නේ ආණ්ඩුව බාහිර උපාධිධාරීන්ට කොකා පෙන්වා ඇති බවය; කුඩම්මාගේ සැලකිලි දක්වා බාහිර උපාධිධාරීන් කිසිවෙකුට රැකියා ලබා දී නොමැති බවය.

බාහිර උපාධිය සඳහා පෙනී සිටින්නේ උසස් පෙළින් විශ්වවිද්‍යාල සුදුසුකම් ලබාගන්නා නමුත් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් වීමට අවස්ථාව නොලද තරුණ තරුණයින්ය. මොවුන්ට පුද්ගලික හෝ විදෙස් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබාගැනීමට වත්කමක් නොමැත. මොවුන්ට රැකියාවක් ලබා ගැනීමට තිබෙන සුදුසුකම වන බාහිර උපාධිය නොසලකා හැරීම සංවේදීකමද?

රැකියාවක් කිරීම තරුණ තරුණියන් සතු පූර්ණ අයිතියකි. උපාධියට රැකියාවක් ඉල්ලා සිටීමද ඔවුන් සතු පූර්ණ අයිතියකි. නමුත් මෙම අසමත්, අදූරදර්ශී, අසංවේදී පාලකයින් කරමින් සිටින්නේ මෙම අයිතිය අමු අමුවේ උල්ලංඝනය කිරීමය. තමන්ට රැකියා ලබාදීමට ඇති නොහැකියාව වසා ගැනීමට අභ්‍යන්තර හා බාහිර ලෙස බෙදීම් ඇති කිරීමය.

නැවතත් අපි රැවටෙමුද?? නැතිනම් අපේ රටේ තරුණ පරම්පරාවත්, අපේ රටේ උපාධිධාරීනුත් රවටන මෙම අදූරදර්ශී හා අසමත් පාලකයින් පලවා හැර කිසිදු භේදයකින් තොරව සැමට රැකියා සහතික කෙරෙන නව පාලනයක් සඳහා පෙළගැසෙමුද? 71 වසරක මෙම පාලන ක්‍රමය අවසන් කොට නව ගමනක් සඳහා අත්වැල් බැඳගැනීමට කාලය උදා වී ඇත..!




# තවත් කළු ජූලියක් එපා!

සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කරනු ලබන 'සහෝදරත්වයේ දිනය' මෙවර ජූලි 23වැනි දින කොළඹ, නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේදී පැවැත්වුණි. ඒ, 2008 වසරේ පටන් සෑම වසරකදීම පවත්වනු ලබන අපේ රටේ ජාතික සමගිය ගොඩනැගීම අරමුණු කරගත් වැඩසටහනකට සමගාමීවය.

මෙම වැඩසටහන "තවත් කළු ජූලියක් එපා!" යන මැයෙන් පැවැත්වූ නිහඬ විරෝධතාවයකින්, ජාතික සමගිය තේමා කරගත් වීදි නාට්‍යයක් සහ ගී ගැයීම් ඇතුළත් සංස්කෘතික වැඩසටහනකින් හා අදහස් දැක්වීම් කිහිපයකින් සමන්විත විය.

එහිදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, කැළණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය එල්ලක්කල සිරිසුමංගල විද්‍යායතනයේ ආචාර්ය රාජකීය පණ්ඩිත කැකිරාවේ සුදස්සන හිමි, ගාල්ල කොටිගලහේන ශ්‍රී පරමේන්ද්‍රාරාම පුරාණ විහාරවාසී කාව්‍යමය ධර්ම දේශක කාව්‍ය ශ්‍රී විශාරද පූජ්‍ය හිනිදුම සරණසිරි ස්වාමීන්වහන්සේ, සම්මානනීය රංගන ශිල්පිනී නදී කම්මැල්ලවීර මහත්මිය, 'මාරුතයේ හඬ' සංවිධානය වෙනුවෙන් විදර්ශන කන්නංගර මහතා, 'රම්‍ය ලංකා' සංවිධානය වෙනුවෙන් එන්.එම්.එම්. ඉන්ෂාෆ් මහතා, සමාජවාදී තරුණ සංගමයේ ප්‍රචාරක සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන සම්පත් අමරසිංහ සහෝදරයා, සිල්මා මොහිදීන් අහමඩ් මහත්මිය, 'වොයිසස් ඔෆ් හියුමන්ස්'හි අධ්‍යක්ෂ කපිල රස්නායක මහතා සහ ප්‍රගතිශීලී මුස්ලිම් සමාජයක් උදෙසා තරුණ එකමුතුව සංවිධානයේ සම කැඳවුම්කරු චිත්‍රපට අධ්‍යක්ෂක අර්ෂාඩ් නජුදීන් මහතා අදහස් දැක්වූහ.

එසේම ප්‍රවීණ ගායන ශිල්පී ඉෂාක් බෙග් මහතා, යොවුන් ගායන ශිල්පී පියත් රාජපක්ෂ මහතා, ස්කිට්සෝ සංගීත කණ්ඩායම සමඟින් සංගීත ශිල්පී සුදන්ත මාධව මහතා, ගායන ශිල්පී සුලක්ෂන් අශෝකන් මහතා, ගායන ශිල්පිනී දිලූනි ජාගොඩආරච්චි මහත්මිය, සහෝදරත්වයේ රඟමඩල නාට්‍ය කවය සහ සමාජවාදී තරුණ සංගමයේ චේන්ජ් සංගීත කණ්ඩායම ඇතුළු පිරිසක් සංස්කෘතික ප්‍රසංගය සඳහා සම්බන්ධ වූ අතර මෙම අවස්ථාව සඳහා තවත් කලාකරුවන්, සමාජ ක්‍රියාකාරිකයින් හා තරුණ තරුණියන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.











## ඉල්ලීම එල්ලීම

================

හදවත් කපා
ලේ ඉල්ලන...
හදවත් නැති
ලේ කොහින්ද...
අතොරක් නැති
බෙදුමකි
කවුරුත් තනිව
ගේම ඉල්ලන...
පතුරක් ගලවන්
හිත් ගලක
පවුරක් නැතුව
එක මිටක...
තවත් සියවසක්
ඇදගෙන යමුද
ඇදගෙන නාගෙන
බෙදීම් බිඳීම් එක්ක...
ඉල්ලීමක් මේක
බෙදපු'වුන්
එල්ලා මැරීම
නසා හළ ප්‍රේමය
කළු කළ මනුදම්...
හෙට පිණිස...
යහලොවක අරුණැල්ල
උදා කරනට ළබැඳිව
එක්ව...











# ජාතික ජන බලවේගය ජනතාවගේ බලාපොරොත්තුවයි



ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික
**බිමල් රත්නායක සහෝදරයා**

***නියමුවා:- රටට නව බලාපොරොත්තුවක් දල්වමින් ජනතා විමුක්ති පෙරමුණද ඇතුළත් වූ 'ජාතික ජන බලවේගය' පසුගිය 14දා එළිදුටුවා. ඒ සඳහා මුලපිරුණේ කොහොමද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** දේශපාලනික සහ ඓතිහාසික වටපිටාව විසින් ඇතිකරපු තත්වයක්. ඒක තමයි අපේ ප්‍රධාන ධනපති කඳවුරු දෙකම ජනතාව අතර ඉමහත් ලෙස පිරිහීමකට ලක්වෙලා තිබුණා වුණාට මේ දක්වා ඒ ධනපති කඳවුරු දෙකටම විකල්පව තුන්වැනි කඳවුරක් ගොඩනැගිලා තිබුණෙ නැහැ. අනික් අතට ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ කොට ගත් දේශපාලන පක්ෂ වගේම සිවිල් සංවිධාන මේ ක්‍රමය පිළිගන්නේ නැතිව සිටින කලාකරුවන්, උගතුන්, වෘත්තීය සමිති, ඒ වගේම වාමාංශික පමණක් නොවෙයි ප්‍රජාතන්ත්‍රවාදය යටතේ දැනට අසාර්ථක වී සිටින එයට විරුද්ධව සටන් කරන ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ සඳහා සටන් කරන සංවිධාන සහ පොදුවේ මේ ධනේශ්වර පාලනයන් කෙරෙහි කලකිරුණු සැලකිය යුතු විශාල පිරිසක් ඉන්නවා. මේ අයට මේ දූෂිත කඳවුරුවලින් ගලවාගෙන රට ඉස්සරහට ගෙනියන්න දේශපාලන වුවමනාවක් තියෙනවා. ඒ හැමකෙනාටම වුවමනාව තිබුණට ඒ අයට තනිවම එය කරගන්න බැහැ. ඒ නිසා තමයි මෙම සංවිධානයට එකතු වෙලා පොදු බලයක් හදා ගැනීමේ අවශ්‍යතාවය ඇති වෙන්නේ. දශක ගණනාවක් තිස්සේ වෙන වෙනම වැඩකිරීම මගින් ලබාගත් අත්දැකීමත් මෙයට එකතුවෙලා තිබෙනවා. ඕක තමයි මෙයට බලපෑ සමාජ දේශපාලන ඓතිහාසික වටපිටාව.

සැබැවින්ම 2015 සිටම මෙවැනි දේශපාලන මධ්‍යස්ථානයක් ගොඩනැගිය යුතුව තිබුණා. මැතිවරණ ඉක්මවා ගියපු, මැතිවරණවලටත් තරග වදින, පොදුජන ව්‍යාපාරයක් ජ.වි.පෙ. සහ ජ.වි.පෙ. නොවන සමාජ දේශපාලන සිවිල් සංවිධාන එකතු කරගත් සංවිධානයක් ගොඩනගන්න ඕනැ කියන එක අපි දැඩිව විශ්වාස කළා. පසුගිය කාලයේම සිද්ධ වුණේ යම්කිසි ප්‍රගතිශීලීත්වයක්, යම්කිසි ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ පිළිබඳ විශ්වාසයක් තියෙන සංවිධාන පවා මේ ධනපති කඳවුරු විසින් ඉතාම ලාබෙට මංකොල්ලකා ගැනීමයි. ජ.වි.පෙ. අපි ගත්තොත් අපි 2015 සිටම මෙවැනි මධ්‍යස්ථානයක් ගොඩනැගීම වෙනුවෙන් විශාල වැඩකොටසක් ඉටුකළා. ඒ අතරම මෙතන ඉන්න අනෙකුත් සංවිධානත් යම් යම් උත්සාහයන් දරා තියෙනවා. එහි ප්‍රතිඵලයක් ලෙසට තමයි ඇත්තටම මේ ජාතික ජන බලවේගය ගොඩනැගෙන්නේ. ආසන්න වශයෙන් ඔක්තෝබර් 26 ඇතිවූ කුමන්ත්‍රණ සිදුවීම පදනම් කරගෙන එකට වැඩ කරගෙන හිටපු සංවිධානවලට, දේශපාලන කුමන්ත්‍රණයෙන් ඇති වූ අර්බුදය විසින් වඩාත් සමීපවෙලා වැඩකරන්න බල කෙරුණා. එය විසින් මෙහි ගොඩනැගීමට අදාළ අවසාන හැඩහුරුකම ලබා දී තිබෙනවා.

***නියමුවා:- මේ සඳහා දැනට සංවිධාන හා පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් ඒකරාශි වී තිබෙනවා. ඉදිරියටත් එකතු වීමට නියමිත බව පැවසෙනවා. මේ එකතු වන්නේ කවුද? මේ එකතුව සඳහා වන අවම ප්‍රතිපත්ති රාමුව මොකක්ද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** දැනට මේ සඳහා ජනතා විමුක්ති පෙරමුණ ඇතුළුව සංවිධාන 31ක් ඒකරාශි වී තිබෙනවා. තව සිවිල් පුද්ගලයන් සැලකිය යුතු ප්‍රමාණයක් එකතු වී සිටිනවා. ඔවුන් සංවිධාන නියෝජනය කරමින් නොවෙයි. නමුත් යම් යම් ක්ෂේත්‍රවල යම්කිසි බලපෑමක් කළ හැකි ප්‍රගතිශීලී ක්‍රියාධරයන් සහ උගතුන් එකතු වී තිබෙනවා. මේ සංවිධානයට ආරම්භයේදී එකතු වූ සංවිධාන විසින් ජනතා ව්‍යාපාරයේ පරමාර්ථ, ක්‍රියාකාරිත්වය සහ ව්‍යුහය පදනම් කර ගත් මූලික පදනම් ලියවිල්ලක් සකස් කළා. ඒ පදනම් ලියවිල්ල අපි මාස හයකට ආසන්න කාලයක් තිස්සේ අපි වරින්වර සංශෝධනය කරමින් සාකච්ඡා කරමින් ගොඩනගනු ලැබුවා. ඉන්පසුව පසුගිය මාස දෙකේදී මේ සඳහා සම්බන්ධ වූ සංවිධාන සියල්ල සමගම මේ පදනම් ලියවිල්ල සාකච්ඡා කරමින් ඒ පදනම් ලියවිල්ලට එකඟ වූ සංවිධාන සහ පුද්ගලයන් තමයි ජාතික ජන බලවේගයේ සාමාජික සංවිධාන බවට පත්වෙන්නේ.

දැනට සම්බන්ධ වෙලා සිටින අය අතර දේශපාලන සංවිධාන, දේශපාලන පක්ෂ, දේශපාලන බලය සඳහා වැඩකරන වගේම, දේශපාලන බලය සඳහා නොවන බලපෑම් කණ්ඩායම් තිබෙනවා. දැනට වෘත්තිකයන්ගේ ප්‍රධාන සංවිධාන දෙකක් මේ සමග සිටිනවා. එයින් එකක් රටේ ප්‍රබලතම වෘත්තික සංවිධානය වන ජාතික විද්වත් සංවිධානයයි. ඒ වගේම ශ්‍රී ලංකාවේ විද්‍යාර්ථීන්ගේ සහ වෘත්තිකයන්ගේ සංවිධානය යනුවෙන් තවත් එක් සංවිධානයක් එකතු වී තිබෙනවා. ඒ වගේම මුස්ලිම් ජනතාව මත පදනම් වූ පැරණි සංවිධාන මෙයට සම්බන්ධ වී තිබෙනවා. ඒ සමග 'ජනනියමු කලාකරු එකතුව' වශයෙන් රටේ ඉන්න ප්‍රගතිශීලී මෙන්ම ප්‍රවීණතම සහ ප්‍රධානම කලාකරුවන් සම්බන්ධ වූ සංවිධානයක් එකතු වී තිබෙනවා.

සම්බන්ධ වීමට හැකි අය ගත්තොත් ක්‍රම දෙකක් තියෙනවා. එකක් තමයි මේ පදනම් ලියවිල්ල පිළිඅරගන ඒකෙ සාමාජික සංවිධානයක් බවට පත්වෙන්න ඕනැ. ඕනෑම සංවිධානයකට එකතු වෙන්න පුළුවන්. මෙහි දේශපාලන පරමාර්ථ පිළිගන්නා සහ ඒ පිළිගැනීමට අදාළ කරන භාවිතයක් දැනට පවත්වාගෙන ගිහින් තියෙන අයට එකතුවෙන්න පුළුවන්. දෙවැන්න මේ පදනම් ලියවිල්ල පිළිගත්තා වුණත් මේ ජනතා ව්‍යාපාරය ගොඩනැගෙනකම් මෙයට සහයෝගය පළ කරමින් නිරීක්ෂණ මට්ටමිනුත් සම්බන්ධ වෙන්න පුළුවන්. එවැනි සංවිධාන සහ පුද්ගලයනුත් ඉන්නවා. අපි බලාපොරොත්තු වෙන්නේ ඉතාම ප්‍රජාතන්ත්‍රවාදීව ඉතාම අවබෝධයෙන් මේ ජනතා ව්‍යාපාරය ගොඩනගන්න. කලබලයෙන් හා හදිසියේ ක්‍රියාත්මක වීම අපේ අරමුණක් නොවෙයි. ඒ වගේම මෙය දිගුකාලීනව මැතිවරණ පමණක් නොව, මැතිවරණවලට පසුවත් අඛණ්ඩව වැඩකරන, අපේ රටේ පීඩාවට පත්වුණු, ඒ වගේම වාමාංශික, ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සෑම සියලු බලවේගවල මධ්‍යස්ථානය බවට මෙය පත්කරගැනීම තමයි අරමුණ වී තිබෙන්නේ.

***නියමුවා:- එළඹෙන මැතිවරණවලට මුහුණදෙන්නේ මෙම සංවිධානය ලෙසද? එය ලංකාවේ දේශපාලන ඉතිහාසයේ හැරවුම් ලක්ෂයක් සලකුණු කරනු ඇතිද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** ජාතික ජන බලවේගයේ ප්‍රධාන අරමුණ තමයි, ජනතා ප්‍රශ්න වෙනුවෙන් සහයෝගය පළ කිරීම, ඒ වෙනුවෙන් සටන් වැදීම සහ මේ ප්‍රතිපත්තිවලට පදනම් වූ මහජන බලයකින් මහජන ආණ්ඩුවක් නිර්මාණය කිරීම. ඒ නිසා මේක හුදු බලපෑම් පමණක් මුල්කර ගත්ත එකක් ලෙස නොවෙයි. මෙහි පදනම් ලියවිල්ලේම මෙය මහජන ආණ්ඩුවක් සඳහා වැඩකළ යුතුයි කියන එක පැහැදිලි කරුණක්. නමුත් ජනතා ව්‍යාපාරය අපි ආරම්භ කළා පමණයි. එනිසා අපි යම්කිසි ශක්තියක් අත්පත්කර ගත යුතුයි. දැනට සම්බන්ධ වුණු සංවිධාන තිහ අතර ඒකාබද්ධව, ඉවසිලිවන්තව, එකිනෙකා අවබෝධකර ගනිමින් වැඩකිරීම මගින් සහ එකිනෙකාට තිබෙන වෙනස්කම් තබාගෙන ඉන්න ගමන් මේ මධ්‍යස්ථානය තුළ දියුණු කර ගත යුතු සංවිධානමය සහ දේශපාලන සංස්කෘතියක් තියෙනවා.

නමුත් මෙම ජනතා ව්‍යාපාරයට සම්බන්ධ වෙලා සිටින සංවිධාන හා පුද්ගලයන් සැලකිය යුතු ප්‍රමාණයක් පැහැදිලිවම ඉදිරි මැතිවරණවලට පවා මේ ජනතා ව්‍යාපාරය හෝ මේ ජනතා ව්‍යාපාරය නියෝජනය කරන අයගේ බලවේගයක් ලෙස මැතිවරණවලට මුහුණදිය යුතුයි කියන එක පිළිගන්නවා. ඒ නිසා මේ ජාතික ජන බලවේගයේ ආශීර්වාදය සහිතව එය නියෝජනය කරන සංවිධානවලින් වැඩි ප්‍රමාණයකගේ සම්බන්ධය සහිත, නමුත් වෙනස් දේශපාලන සංවිධානයකින් මැතිවරණයට ඉදිරිපත් වීම තමයි බොහෝදුරට විය හැකිව තිබෙන්නේ.

එය පැහැදිලිව ලංකාවේ දේශපාලනය ඉතිහාසයේ නව ආරම්භයක් සලකුණු කරාවි. ජ.වි.පෙ. වශයෙන් ගත්තොත් පසුගිය ඉතිහාසය පුරාවටම මෙවැනි පුළුල් සංවිධානයකට සම්බන්ධ වෙන පළමුවැනි අවස්ථාව. අපේ රටේ රට පාලනය කරපු දේශපාලන පක්ෂවල අසාර්ථකභාවය නිසාම පසුගිය කාලයේ වෘත්තිකයන්, විශාල දේශපාලන සමාජ ක්‍රියාකාරිත්වයකට ආවා. මේ බලවේගවලට පුළුල් නියෝජනයක් තියෙනවා.

මීට කලින් වුණේ දේශපාලන පක්ෂවලින්ම අපේක්ෂකයෙක් දෙන්නෙක්, වෘත්තිකයන් දෙන්නෙක් තුන්දෙනෙක් ඡන්දෙට දාන එක. නමුත් මෙවර වෙන්නේ වෘත්තිකයන් ජ.වි.පෙ.න් එනවා නොවෙයි; ජ.වි.පෙ. සහ වාමාංශික සංවිධාන ඇතුළු වෘත්තිකයන් එකතු වුණු සංවිධානයක් ලෙස මැතිවරණයට ඉදිරිපත් වීමයි.

අපි හිතනවා, අපේ රටේ සමාජය යහපත් දිශාවට වෙනස් කිරීම දේශපාලන සංස්ථාවට පමණක් කළ හැකි දෙයක් නොවෙයි කියන එක. මේ දූෂිත ධනපති වළල්ල කඩන්න පැහැදිලිවම උගතුන්, වෘත්තිකයන්, ආගමික නායකයන්, සමාජයේ සිවිල් නායකයන්, කලාකරුවන්, වෘත්තීය සමිති සියලු දෙනා දායක විය යුතුව තිබෙනවා. මෙතන තියෙන විශේෂත්වය වෙන්නේ එවැනි කණ්ඩායමක් ප්‍රථම වතාවට ප්‍රධාන දේශපාලන ධාරාවේ ඡන්ද ව්‍යාපාරයකට සම්බන්ධ වීමයි.

***නියමුවා:- ජාතික ජනබලවේගය තුළ ජනතා විමුක්ති පෙරමුණේ භූමිකාව කවරාකාරද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** මෙතන ජාතික ජනබලවේගය තුළ දැනට තිබෙන සංවිධාන අතරින් විශාලතම සහ වැඩිම සමාජ බලපෑමක් සහිත සංවිධානය ජනතා විමුක්ති පෙරමුණයි. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණට මෙහි සැලකිය යුතු බරක් අදින්න වගකීමක් තිබෙනවා. නමුත් අපිට මැදිහත්වීමට සිදුවෙන අරගලයේ ස්වභාවය අනුව ජ.වි.පෙ. ප්‍රමුඛ වෙන සටන් වගේම ජ.වි.පෙ. වෙනුවට වෙනත් සංවිධාන ප්‍රමුඛ වෙන සටන් ක්‍රියාමාර්ග අනිවාර්යයෙන්ම මෙහි තියෙනවා. ඒ නිසා මේ ජාතික ජනබලවේගයේ මෙහෙයුම් මණ්ඩලය සකස් වෙලා තියෙන්නේ සෑම සංවිධානයකම ලොකු කුඩා බව, එහි ඉතිහාසය නොසලකා හැමකෙනාම සමාන නායකත්වයක් ලෙස සලකලයි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී, දියුණු සහෝදරාත්මක පදනමක් මත තමයි, ජ.වි.පෙ.ත් සියලුම සංවිධාන මේ තුළ අන්‍යෝන්‍ය වශයෙන් විනයකට යටත්වෙලා කටයුතු කරන්නේ.

> "මේ වෙලාවේ ජාතික ජන බලවේගය ලෙස රටේ දූෂිත විනාශකාරී දේශපාලන වලල්ලට එරෙහිව දේශපාලන සහ ප්‍රගතිශීලී වාමාංශික බලවේග නියෝජනය කරන ස්වාධීන අනන්‍යතාවක් සහිත කණ්ඩායම්වල මධ්‍යස්ථානයක් ගොඩනගන්න අපි සමත්වෙලා තිබෙනවා."

15 වැනි පිටුවට

# අලුත් ඉරක් පායයි අද අහසේ

"අද සමාජය කඳවුරු තුනකට බෙදී තිබෙනවා, එකක් ගෝත්‍රවාදී අන්තයක් නියෝජනය කරනවා, අනෙක් පාර්ශවය නව ලිබරල් විනාශකාරී අන්තයක් නියෝජනය කරනවා. මේ කඳවුරු දෙක විටෙක එකටත් විටෙක වෙන් වෙන්වත් බලය හෙබවූවා. ඊට පිටින් විශාල විසිරුණු කඳවුරක් තිබෙනවා. මේ විසිරුණු තුන්වෙනි විකල්ප කඳවුර එක මධ්‍යස්ථානයකට එකතු කළ යුතුව තිබෙනවා. ජාතික ජන බලවේගය නිර්මාණය වන්නේ එම මධ්‍යස්ථානය වෙනුවෙනුයි" (අනුර දිසානායක සහෝදරයා , බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාව, 2019.07.14)

රට ගොඩනැගීමට, අර්බුද ජය ගැනීමට දියසෙන් කුමාරයා පැමිණෙන තෙක් බලා සිටින ජනතාවකට වෙනස් අරුතක් ලබා දෙමින් තනි තනි මිනිසුන් නොව මේ අර්බුදය ජය ගැනීම සඳහා පුළුල් ජනතා මධ්‍යස්ථානයක අවශ්‍යතාවය තහවුරු කරමින් "ජාතික ජන බලවේගය" පසුගිය ජූලි 14 වැනිදා රට හමුවේ එළි දැක්විණි. නමින් පමණක් දෙකට බෙදී සිටින ධනපති කඳවුරට විකල්පයක් ලෙසද මෙම ජනතා මධ්‍යස්ථානය හැඳින්විය හැක.

ජාතික විද්වත් සංවිධානය ඇතුලු වමේ හා ප්‍රගතිශීලී දේශපාලන පක්ෂ, විකල්ප සංවිධාන හා කණ්ඩායම්, සමාජ ක්‍රියාකාරීන්, කලාකරුවන් ආදීන්ගේ එකතුවෙන් මේ මධ්‍යස්ථානය සමන්විත වී ඇත. ජූලි 14වැනිදා කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාවේදී පැවති මෙහි ආරම්භක උත්සවය සඳහා විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

ජනතා විමුක්ති පෙරමුණ, වමේ කේන්ද්‍රය, හැත්තෑ එකේ සහෝදරත්වය, අලුත් පරපුර, ජාතික භික්ෂු පෙරමුණ, ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය, සමාජ සාධාරණත්වය උදෙසා විශ්වවිද්‍යාල ආචාර්යවරු, ජන නියමු කලාකරු එකතුව සහ ජනාවබෝධය කේන්ද්‍රය ආදී සංවිධානයන්හි නියෝජිතයින් විසින් මේ උත්සව සභාව අමතන ලදී.




# විකල්පයට පෙළගස්වමින්





"ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලින් ගිනි පොලියට ණය ගත් කාන්තාවෝ 169ක් දිවි නසාගෙන, දිවයිනම ඩෙංගු කලාපයක් වීමේ අවදානම, සති තුනට මත් ද්‍රව්‍ය වැරදිවලට 17,000ක් අත් අඩංගුවට, කල් ඉකුත්වූ ඖෂධ පරීක්ෂා කිරීමට තවම පරීක්ෂණාගාරයක් නැහැ, බදුල්ලේ පවුල් 10,992කට වැසිකිළි පහසුකම් නැහැ, රටින් කසළ ගෙන්වීමට මහා පරිමාණ ව්‍යාපාරිකයෙකු හවුල්, මහ බැංකු බැඳුම්කර වංචා සිද්ධිය විත්තියේ 08කට අධි චෝදනා බාරදී දැඩි කොන්දේසි සහිතව ඇප මුදා හරී " ඉහත දක්වා ඇත්තේ පසු ගිය කාලයේ පුවත්පත්වල පළ වූ ප්‍රවෘත්ති සිරස්තල කිහිපයකි. මේ සිරස්තල තුළින්ම වසර 71ක නිල්-කොළ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ පාලනයන් විසින් අප රට ඇදවට්ටා ඇති තත්වය පිළිබඳව අදහසක් ලබා ගත හැක.

ඒ අනුව මේ කල් ඉකුත්වූ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂවලටත් විවිධ වේෂයෙන් පැමිණෙන ඔවුනට ගැතිකම් කරන සංවිධානවලටත් පුද්ගලයින්ටත් මේ රට තව අඟලක් හෝ ඉදිරියට ගෙන යා නොහැකි බව පැහැදිලිය. ඒ සඳහා රට රකින, රට හදන ජනතාවාදී පාලනයක් අරමුණු කරගත් දැවැන්ත වැඩපිළිවෙළක අවශ්‍යතාවය දැන් මතුව තිබේ. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ, ප්‍රගතිශීලී සංවිධාන, වෘත්තීය සමිති, ගොවි ව්‍යාපාර, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, බුද්ධිමතුන්, විවිධ ක්ෂේත්‍රවල වෘත්තීයවේදීන් සහ රටට සැබෑ ලෙසම ආදරය කරන පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් පුළුල් ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගී අවසන්ය.

එම මධ්‍යස්ථානය ජනතාව අතරට ගෙනයාම ඉලක්ක කර ගනිමින් ජනතා විමුක්ති පෙරමුණ විසින් මුළු දිවයිනම ආවරණය වන සේ මහජන හමුවීම් මාලාවක් සූදානම් කර තිබේ. ඒ අනුව පසුගිය ජූලි 23වැනිදා ඌව පළාත් සභා මන්ත්‍රී, ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා විසින් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේදී මහජන හමුවක් පවත්වන ලදී. මේ අවස්ථාව සඳහා ප්‍රදේශවාසීන් රැසක් සහභාගි වී සිටි අතර මෙම නව ජනතා මධ්‍යස්ථානයට සුබපැතූ ඔවුහු තමන් ඊට නොපැකිළව සහයෝගය දක්වන බව පැවසූහ.


# ආණ්ඩුව පලවා හැරීමට

පසුගිය ජූලි 07-08 යන දිනයන්හි ජනතා විමුක්ති පෙරමුණ විසින් අසමත් ආණ්ඩුවට එරෙහිව ඉතා සාර්ථක පා ගමනක් සහ මහජන රැලියක් පවත්වන ලදී.

එහෙත් එම දැවැන්ත විරෝධතාවයෙන් ආණ්ඩුවට මෙන්ම විපක්ෂයේ රාජපක්ෂ කඳවුරටද බලපෑමක් සිදුව තිබූ බව ඔවුන් කරන ලද ප්‍රකාශවලින් ගම්‍ය වී තිබුණි. විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ඒකාබද්ධ විපක්ෂය මුහුණු පොතෙනුත් තමන්ට හිතවත් මාධ්‍ය මගිනුත් එම ජ.වි.පෙ. ක්‍රියාමාර්ගය විවේචනයට ලක් කිරීමට පවා පෙළඹී තිබුණේ මෙම තත්වය තුළය.

රාජපක්ෂ කල්ලිය උද්ඝෝෂණ පා ගමනට අවලාද නගන්නේ ජ.වි.පෙ. විසින් ආණ්ඩුවට එරෙහිව ගෙනෙනු ලබන ප්‍රතිපත්තිමය විවේචන තමන්ටද එක සේ අදාළ වන බැවින් බවනම් ස්ථිරය.

කෙසේ නමුත් පුරා දින දෙකක් මුළුල්ලේ කළුතර සිට නුගේගොඩට ඇදී ගිය "රට අරාජික කළ , මහජන ආරක්ෂාව බිලි දුන් ආණ්ඩුව පලවා හරින වීදි පිරෙන පාද සටන " යනුවෙන් නම් කළ මෙම පා ගමන නුගෙගොඩ නගර මධ්‍යයේ දැවැන්ත මහජන රැලියක් පවත්වා සාර්ථකව අවසන් කරන ලද අතර ජනතා විමුක්ති පෙරමුණේ නායකත්ව මණ්ඩලය ඇතුළු සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් මේ ක්‍රියාමාර්ගය හා බද්ධ වී සිටියහ.



# යෝජනාවලිය පූජ්‍ය පක්ෂයට සහ විද්වතුන්ට






ජනතා විමුක්ති පෙරමුණ විසින් සම්පාදිත "ආගමික උමතු අන්තවාදයත් ජාතිවාදයත් පරදා ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාවත් ජාතික සමගියත් තහවුරු කිරීම සඳහා රට හමුවේ තබන යෝජනා මාලාව" පසුගිය ජූලි මස 02 වැනිදා මල්වතු පාර්ශවයේ මහනායක ස්වාමින් වහන්සේට පිළිගැන්වීම ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් සිදු කරන ලද අතර මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. මහනුවර දිස්ත්‍රික් සංවිධායක ගයාන් ජානක සහෝදරයාද සහභාගි විය.

එදිනම එම යෝජනා මාලාව ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහ මධ්‍යම කාරක සභික රාමලිංගම් චන්ද්‍රසේකරන් සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් යාපනයේ මැනේජ්මන්ට් ෆෝරම් නම් විද්වත් සංවිධානය වෙත යාපනේ පිහිටි එම සංවිධානයේ මධ්‍යස්ථානයේදී පිළිගන්වන ලදී. මෙම සංවිධානය විද්වතුන්ගෙන් සහ වෘත්තියවේදීන්ගෙන් සමන්විතය.

ඉස්ලාම් ආගමික අන්තවාදයේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය අප්‍රේල් 21වැනිදා ජීවිත රැසක් විනාශකරමින් සහ තවත් පිරිසක් ආබාධිතයන් කරමින් බෝම්බ මාලාවක් පුපුරා යාමෙන් අනතුරුව එම අන්තවාදයට එරෙහිව වෙනත් අන්තවාදයන් මතු වෙමින් රට තවත් ලේ ගංගාවක් වන දිශාවකට තල්ලු වෙමින් තිබියෙදී ජ.වි.පෙ. විසින් ඉහත යෝජනා මාලාව රට හමුවේ එළිදැක්වනු ලැබිණි.

# වසර මැද ආර්ථිකය හා රට වටකරන අර්බුදය



"සමාජයේ වෙනස්වීම සිදුවන්නේ එහි පවතින ප්‍රතිවිරෝධයන්ගේ වර්ධනය හේතුවෙනි. නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදන සම්බන්ධතා අතර ප්‍රතිවිරෝධයේත්, පංති අතර ප්‍රතිවිරෝධයේත්, අභාවයට යන පරණ දේ හා නැගී එන අලුත් දේ අතර ප්‍රතිවිරෝධයේත් වර්ධනය හේතුවෙනි. පැරණි සමාජය යට කරගෙන අලුත් සමාජයට ඉදිරියට වර්ධනය වීමට ඉඩ දෙන්නේත් මේ ප්‍රතිවිරෝධය නිසාය."

**මාවෝ සේ තුං**
**තෝරාගත් කෘති,**
**1කාණ්ඩය,**
**314 පිටුව**

මුදල් අමාත්‍යංශය විසින්, 2019 වසරේ වසර මැද මූල්‍ය උපනතිය පිළිබඳ වාර්තාව (මූල්‍ය කළමනාකරණ වගකීම් පනත අනුව අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය) පසුගියදා පාර්ලිමේන්තුව හමුවේ සභාගත කරනු ලැබීය.


මෙම ලේඛනය මගින්ද සුපුරුදු පරිදිම ආර්ථිකයේ ආපසු ගමන විද්‍යමාන කරනු ලැබීය. 2018 හා 2019 වසර දෙකේදී පළමු මාස 04 පිළිබඳව සැලකිල්ලට ලක්කිරීම මෙම සංඛ්‍යා ලේඛනවලින් සිදු කරනු ලබයි. එනම් 2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලයයි. අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව ආර්ථිකයේ අර්බුදය තවත් අවුලෙන් අවුලටම පත්වූ බව නොරහසකි. මුදල් අමාත්‍යංශයේ වාර්තාවේද ඒ පිළිබඳව වාර්තා කර ඇත්තේ, බෝම්බ ප්‍රහාරයෙන් පීඩාවට පත් ජනතාවට වන්දි ගෙවීමට හා විනාශ වූ දේපළ අලුත්වැඩියාවලට වියදම දරන අතරේම ආණ්ඩුවට අහිමි වී ඇති මුදල රුපියල් කෝටි 5000ක් පමණ වන බවයි.

"පාස්කු ඉරුදින ප්‍රහාරය හේතුවෙන්, කෙටිකාලීනව රාජ්‍ය ආදායම මත ඇති වූ බලපෑමෙහි මූලික ඇස්තමේන්තුවක් වශයෙන් මූල්‍ය, සංචාරක, වෙළඳ හා ඉදිකිරීම් යනාදී බලපෑමට ලක් වූ ක්ෂේත්‍රයන්ගෙන් රාජ්‍ය ආදායමට ලැබෙන සෘජු දායකත්වය දළ වශයෙන් රුපියල් බිලියන 50කින් අඩුවනු ඇත. 2019 වසරේ ඉදිරි මාසවල ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම හේතුවෙන් මෙලෙස රාජ්‍ය ආදායම ඇස්තමේන්තුගත අලාභය තවදුරටත් ඉහළ යා හැකි වේ. (17 පිටුව, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව - 2019 මුදල් අමාත්‍යංශය)."

මේ මුදල් අමාත්‍යංශයේ නිල ලේඛනයේ පිළිගත් තහවුරු කළ සත්‍යයයි. තවමත් හවුලේ වෙඩි නොවදින වාහන සඳහා ලක්ෂ ගණනින් මහජන මුදල් කාබාසිනියා කරන තකතීරු දේශපාලකයින්ට නොවැටහෙන සත්‍ය මෙයයි.

### ආණ්ඩුවේ ආදායම - වියදම

2018 වසරේ පළමු මාස 04ට වඩා 2019 වසරේ පළමු මාස 04 තුළ රජයේ ආදායම පහළ වැටී ඇති අතර ඊට පරස්පරව රාජ්‍ය වියදම 2018ට වඩා 2019 පළමු මාස 04 දී තවත් වැඩි වී ඇත. ඒ නිසා කලින් අපේක්ෂා කළ මට්ටමටත් වඩා වැඩි අයවැය පරතරයක් දැනටමත් දැකිය හැකිය. සහරාන්ලාගේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් හානි සිදු වූයේ ජීවිත - දේපළවලට පමණක් නොව මුළු මහත් ආර්ථිකයටමය. ඒ නිසා රට තවත් ආපස්සට ගමන් කරමින් තිබේ. දැනටමත් සංචාරක කර්මාන්තය යළි ගොඩගත නොහැකි මට්ටමට ඇද වැටී අවසන්ය. කුරුඳු, ගම්මිරිස් හා තේ මිල විශාල ලෙස පහත




වැටී ඒ ඒ කර්මාන්තවල නියුතු දහස් ගණනක් අද මහ පාරට ඇද දමනු ලැබ ඇත. අලි මදිවට කොටි කියන්නාසේ දැන් ජනාධිපතිවරණයකුත් පැමිණ ඇත. ඉදිරි මාස කිහිපයද ගතවනු ඇත්තේ ආණ්ඩුව නාස්තිකාර වියදම් හා දේශපාලන සංදර්ශන සඳහා මහජන මුදල් වියදම් කරමිනි.

**2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා රාජ්‍ය මූල්‍ය තත්වය**

| | 2018 රුපියල් මිලියනවලින් (පළමු මාස 04) | 2019 |
|---|---|---|
| ආදායම හා ප්‍රදාන | 622,712 | 961,864 |
| වියදම | 873,350 | 6,017,992 |
| සමස්ත අයවැය | (250,638) | (363,438) |
| ණය ගැනීම | 686,882 | 937,426 |
| ණය ආපසු ගෙවීම | 443,479) | (566,909) |

### වසර මැද ආර්ථික අර්බුදය

ආණ්ඩුව අවුරුදු 04කට තබා මාස 04කටවත් රට පාලනයට නුසුදුසු බව 2019 පළමු මාස 04 තුළ ආර්ථිකයේ ස්වභාවය තේරුම් ගැනීමෙන් පැහැදිලි කරගත හැකිය. 2019 පළමු මාස 04 තුළදී රටේ ආදායම රු: කෝටි 2,428කින් (රු: මිලියන 24,286) අඩු වී ඇත. නමුත් ඊට පරස්පරව වියදම කෝටි 8,851 කින් (මිලියන 88,514) වැඩි වී ඇත. සමස්ත අයවැය පරතරයද 2018ට වඩා කෝටි 1,128කින් වැඩිය. ආදායමට වඩා වියදම කෝටි 8,000කින් වැඩි වන විට ණය ගැනීමද, පසුගිය වසරේ පළමු මාස 04ට වඩා රු: කෝටි 25,054කින් වැඩි වී ඇත. කෙටියෙන් කියතොත් මාස 04කදී ආණ්ඩුව රට පාලනය කර ඇත්තේ ණය ගැනීම වැඩිකර, වියදම් වැඩිකර ආදායම අඩුකර ගනිමිනි. රට උකස් කර ණය ගෙන, ණය ගෙවීමට ණය ගෙන, ආදායම අඩුකර වියදම් වැඩිකර, යළි රට ණය කිරීමට ආණ්ඩුවක් අවශ්‍යදැයි රටේ ජනතාව තමන්ගෙන්ම ඇසිය යුතු නොවන්නේද?

ආණ්ඩුව ලබාගෙන ඇති ආදායමද ලබාගෙන ඇත්තේ, නිෂ්පාදන ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයකින් නොව ජනතාව මත බදු බර පැටවීමෙන් බව පැහැදිලිය. මුළු ආදායමෙන් 5න් 1ක්ම (කෝටි 10,223ක්ම) ලැබී ඇත්තේ වැට් (VAT) බද්දෙනි. දේශීය පරිභෝජනය මත බදු තුළින් තවත් කෝටි 19,314ක්ද, ආදායම් බදු මගින් තවත් රු: කෝටි 10,425ක්ද උපයාගෙන ඇත. මෙම ධනපති ආණ්ඩුව බදු ආදායම මිස නිෂ්පාදන ආර්ථිකය මත ආදායම උපදවන පාලනයක් නොවන බව මින් පැහැදිලිය.

වියදම් තුළින් වැඩිම පංගුවක් වියදම් කරනු ලැබ ඇත්තේ ණය වාරික තුළින් පැන නගින පොලිය ගෙවීමටය. රජයේ මුළු වැටුප් ගෙවීමට රු: කෝටි 21,844ක් වියදම් කරන විට රජයේ ණය පොලී ගෙවීමට වියදම පමණක් රු: කෝටි 29,706කි.

රජයේ ආදායම මෙන් තුන්ගුණයකට ආසන්නව ණය වාරික හා පොලී ගෙවීමට ජනතාව ආණ්ඩුවට උපයා දිය යුතු නම්, රටේ මුළු වියදම ආදායම මෙන් දෙගුණයක් වේ නම් එවන් රටක් ඉදිරියට යන්නේ කෙසේද?

**2019 පළමු මාස 04 සමාජ සුභසාධන වියදම**

| මව්වරුන් හා ළමුන් | 2018 | 2019 |
|---|---|---|
| ත්‍රිපෝෂ/ළදරු කිරි සහනාධාර | 194 | 210 |
| නොමිලේ පෙළ පොත්/නිල ඇඳුම් | 196 | 320 |
| පාසල් වාර ප්‍රවේශ පත්‍ර | 123 | 150 |
| පාසල් පෝෂණදායී ආහාර | 137 | 177 |

| සුභසාධන ගෙවීම | 2018 | 2019 |
|---|---|---|
| සමෘද්ධි සහනාධාර | 1,314 | 1,300 |
| ආබාධිත රණවිරු දීමනාව | 946 | 1,057 |
| වැඩිහිටි දීමනාව | 305 | 328 |
| ආහාර ආධාර, ගංවතුර හා නියං ආධාර | 132 | 25 |
| වකුගඩු රෝගීන් සඳහා දීමනාව | 39 | 46 |

### ණය පොලියට කෝටි 29,000

ආණ්ඩුව මැතිවරණ කට මුල තබාගෙන මාධ්‍ය දැන්වීම් පළ කරමින් උපරිම ප්‍රචාරය ලබා දෙන්නේ, තමන් ජනතාව ගැන සොයා බලන ජනතා සුභ සාධනයට මුල්තැන දෙන ආණ්ඩුවක් බව පෙන්වීමටය. නමුත් ආණ්ඩුව වත්මන් රනිල් වික්‍රමසිංහ පාලනයේ සහ පරණ රාජපක්ෂ පාලනයේද ණය ගැනීම්වලින් පැනනැගී ඇති පොලී ගෙවීමට දරන ලද වියදම හා සැසඳීමේදී මුළු සුභසාධනයටම සිදුකරන වියදම ගැනිය නොහැකි තරමේ සොච්චමකි.

2019 වසරේ පළමු මාස 04 තුළින් සමාජ සුභසාධනයට සිදුකර ඇති මුළු වියදම කෝටි 3,655කි. ණයවලට ගෙවන පොලිය එම මුදල මෙන් අට ගුණයකි. සමෘද්ධි සහනාධාරයට කෝටි 1,300, ආබාධිත රණවිරුවන්ට කෝටි 1,057, එම දීමනාව 2018 වසරේදී ද වෙන්කරන ලද සාමාන්‍ය ප්‍රමාණයම බව පහත වගුවෙන් පැහැදිලිය.

රටක ජනතාව ජීවත් කරවීමට ආණ්ඩුවක් රටේ ජනතාව උපදවන ආදායම යොදා ගන්නේද? නැතිනම් රටේ ජනතාව දුක් මහන්සියෙන් උපයන ආදායම එකතු කර තමන්ගේ පාලනයේ නාස්තිකාර වියදම්වලට සහ ගත් ණයට පොලී ගෙවීමට යොදවන්නේ යැයි තර්ක බුද්ධියක් නැතත් බැලූ බැල්මට අනුව තේරුම් ගැනීමට හැකිය.

මීට ඉහතදී ද අප සාකච්ඡා කර ඇති පරිදි රටේ මුළු වත්කම රු: කෝටි ලක්ෂයක් වන විට ගෙවීමට ඇති මුළු වගකීම් රු: කෝටි දොළොස් ලක්ෂයකි. වත්කමෙන් දොළොස් ගුණයක් ණය කර ඇති මේ රට ලෝකයේ බොහෝ රටවල් හා සැසඳීමේදී සම්පත් අතින් උසස් වටිනාකමක් සහිතය. පිහිටීම අතින් ලෝක සිතියමේ වටිනාම ස්ථානයක් හිමිය. දින 365ක්ම හිරු එළිය හොඳින් පතිත වෙන හැම දිනකම පැය 12කට වැඩියෙන් භාවිත කළ හැකි මහ මුහුදකි. මුහුද පුරා ඕනෑම තැනකින් නෙළාගත හැකි මත්ස්‍ය අස්වැන්නකි. තවමත් විදේශිකයින්ට අත්පත්කර ගැනීමට නොහැකි වූ ජනතා අරගල මගින්ම ආරක්ෂා කරගත් වටිනා ස්වභාවික සම්පත් රැසකි. ඒ සියල්ලටම වඩා ආසියානු කලාපයේම අන් රටවලට වඩා උසස් සාක්ෂරතාවයක් සහිත ජනතාවක් සිටී. මේ සියල්ල හොඳින් කළමනාකරණය කළ හැකි සැලසුම්සහගත පාලනයක් ඇත්නම් මේ සුන්දර රට දියුණු කළ හැකිය. නමුත් වැරදි පාලකයින්ට තමන් සතු බලය පූජා කිරීමේ වරද නිසා ජනතාවට දුක් විඳීමට සිදුව ඇත.

මැතිවරණවලදී කෙටි කාලයකට දිගු කරන පොරොන්දු මලුවලට රැවටෙන ජනතාවගේ වැරදි තීරණ පෙරළා වින කර ඇත්තේ ජනතාවටමය. මුදල් අමාත්‍යංශය විසින්ම ඉදිරිපත් කරන ආණ්ඩුවේ වසර මැද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන 2019 වසරේ පළමු මාස 04ට ඉදිරිපත් කර ඇති රටේ මූල්‍ය තත්වයට වඩා ගත වූ මාස 03 තුළද රට තවත් අරාජිකභාවයට ගොස් ඇති බව තවම නිල වාර්තා නැතත් අපි සැම භාවිතයෙන් අත්විඳ හමාරය.

මාස 04කටවත් රටක් පාලනය කර නොහැකි මේ දුබල ධනපති ආණ්ඩුව මාස්පතා නොව දිනපතා ඔප්පු කරන්නේ තමන් කොතරම් අසාර්ථකද යන වග පමණි. ඒ නිසා දැන් ජනතාව තමන්ගේ බලය යෙදවිය යුත්තේ දුබල දුර්වල පැරණි පාලකයින්ටම යළි බලය භාරදීමට නොව මේ අර්බුදයෙන් අර්බුදයට යන රට ගලවා ගත හැකි නව පන්නයේ ධෛර්යවන්ත ජනතාවගේ පාලනයක් නිර්මාණය කරගැනීමටය.

දින 365ක්ම හිරු එළිය හොඳින් පතිත වෙන හැම දිනකම පැය 12කට වැඩියෙන් භාවිත කළ හැකි මහ මුහුදකි. මුහුද පුරා ඕනෑම තැනකින් නෙළාගත හැකි මත්ස්‍ය අස්වැන්නකි. තවමත් විදේශිකයින්ට අත්පත්කර ගැනීමට නොහැකි වූ ජනතා අරගල මගින්ම ආරක්ෂා කරගත් වටිනා ස්වභාවික සම්පත් රැසකි. ඒ සියල්ලටම වඩා ආසියානු කලාපයේම අන් රටවලට වඩා උසස් සාක්ෂරතාවයක් සහිත ජනතාවක් සිටී. මේ සියල්ල හොඳින් කළමනාකරණය කළ හැකි සැලසුම්සහගත පාලනයක් ඇත්නම් මේ සුන්දර රට දියුණු කළ හැකිය.

# 'වීදි පිරෙන පාද සටන'

කළුතර සිට පාගමන හා නුගේගොඩ මහජන රැලිය
(ජූලි 07/08 දෙදින මතකයෙන්)













## දැන් මේ රටේ ජනතාවට අපි කියන්නේ අපට බලය දෙන්න කියන එකයි

**ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා**



ඊයේ (07) දිනයේ කළුතරින් ආරම්භ කරපු පා ගමන කි.මී. 41ක් දුර ගෙවාගෙන අද නුගේගොඩට පැමිණ රටට අලුත් සංඥාවක් ලබා දුන්නා. ඒ, වත්මන් ආණ්ඩුව ගෙදර යවන බවටත් අලුත් ආණ්ඩුවක් ගෙන එන බවටත් වන පණිවිඩයක්. ජනතා විමුක්ති පෙරමුණ මහපාරට අලුතින් බැස්සා නෙමෙයි. ජ.වි.පෙ. හැමදාම ජනතාව සමග සිටගනිමින් ආණ්ඩුවේ ජනතා විරෝධී වැඩවලට එරෙහිව පාරට බහින පක්ෂයක්. ගොවි ජනතාව, ධීවර ජනතාව, කම්කරු ජනතාව වෙනුවෙන් පාරට බහින පක්ෂයක්. ජනතා විමුක්ති පෙරමුණ රාජපක්ෂලා වගේ වොයිස් කට් දේශපාලනයක් කරන පක්ෂයක් නොමෙයි; ඇත්ත ජනතා ප්‍රශ්න වෙනුවෙන් මහ පාරට බැහැලා සටන් වදින පක්ෂයක්.

අපි රනිල්ටත් මහින්දටත් අභියෝගයක් කරනවා, 2015 ජනවාරි 09 උදේ පාන්දර මහින්ද හිටපු අරලියගහ මන්දිරයට ගිහින් කළ රහස් සාකච්ඡාව මොකද්ද කියන්න කියලා. අවුරුදු 41/2ක් පුරා දෙන්නාම රටට කිවුවෙ නැහැ. ඇත්තටම මහින්ද ඉල්ලුවෙ බලය අතඇරලා යන්නම් තමන්ගෙ පවුලෙ අයට විරුද්ධව මොකුත් කරන්න එපා කියන එකයි. පහුගිය ඔක්තොබර් 26න් පස්සෙ රනිල් අරලියගහ මන්දිරේ කොටුවෙලා ඉන්න වෙලාවෙ ගොඨාභය රාජපක්ෂ ගිහින් රනිල් මුණගැහුණා. අදටත් දෙන්නා ඒ ගැන කියන්නෙ නැහැ. ඇත්තටම ගෝඨාභය කිවුවෙ රනිල්ව ආරක්ෂා කරනවා කියන එකයි. කළගුණ සැලකුවා. මේ ආණ්ඩුව ජනතා වරමට පටහැණිව සාතකයන්, හොරුන්, වංචනිකයන් ආරක්ෂා කළා.

මේ රටේ වංචා දූෂණ හෙළිදරව් කළේ ජනතා විමුක්ති පෙරමුණයි. රවීට ඇමතිකම නැති වුණේ කෝප් කමිටුවේ සභාපති සුනිල් හඳුනනෙත්ති සහෝදරයා විසින් මහ බැංකු පරීක්ෂණ ඉදිරියට ගෙන ගිය නිසයි. රටට ලැබිය යුතු මුදල් ඇවන්ට්ගාඩ් හොර සමාගමකට හැරවීමට එරෙහිව ජ.වි.පෙ. පාර්ලිමෙන්තුවේ දවසක විවාදයක් ගෙනාවා. තිලක් මාරපනට ඇමතිකම නැති වුණේ එතනදි ගෝඨාභය රකින්න ගියපු එකට එරෙහිව ජ.වි.පෙ. විශ්වාසභංගයක් ගෙන ආ නිසයි. අත්අඩංගුවට ගන්න අධිකරණ නියෝග නිකුත් කරලා තියෙද්දි හිටපු ජනධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි ගාමිණී සෙනරත් සැඟවී සිටියේ එවකට පොලිස් ඇමති සාගල රත්නායකගේ නිවසේයි. මේ බව රටට හෙළිදරව් කළේ ජනතා විමුක්ති පෙරමුණයි. විමල් වීරවංශ හොර ගමන් බලපත්‍රයකින් රට යන්න ගිහින් අහුවුණාම රනිල් නීතිපතිට කියලා ඔහුව නිදහස් කරගත්තා.

බලය තිබෙනනේ, ජනතාව සතුවයි. ජනාධිපති මන්දිරයේ හෝ අරලියගහ මන්දිරයේ නෙමෙයි. එයට යන කෙනෙකුට බලය ආරූඪ වෙනවා නෙමෙයි. එම බලයේ උල්පත ජනතාවයි. අපි රනිල්ගෙන් හෝ මහින්දගෙන් බලය ඉල්ලා ගන්නවා නෙමෙයි. අපි බලය ඉල්ලා ගන්නේ ජනතාවගෙන්. අපට එය කළ හැකියි. 71 පරම්පාරවේ අපේ නායකයින්, පැරණි වමේ පක්ෂවලින් ඉවත් වූවන්, සුන්දර අදහස් ඇති යෞවනයින්, නිර්මාණශීලී කලාකරුවන්, දක්ෂ වෘත්තිකයින් එකතු කරගෙන එළඹෙන ජූලි 14වැනි දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී නව සංවිධානයක් පිහිටුවනවා. මීළඟට රටේ බලය හුවමාරු කරන බලවේගය වන්නේ එයයි.

අපට පැවරී තිබෙන්නේ දේශපාලන කළමනාකරණ කොටසයි. රටේ ආර්ථිකයේ එක් එක් ක්ෂේත්‍රයන් වසර 05ක් තුළ ක්‍රියාත්මක කළ යුතු ඉලක්ක සකස් කළ යුත්තේ දේශපාලන කළමනාකරණයෙනුයි. ඒ සැලැස්මට අනුව ක්‍රියාත්මක විය යුත්තේ ඒ ඒ ක්ෂේත්‍රවල විශේෂඥයනුයි. කැපකිරීම් කළ හැකි විනයක් සහිත දේශපාලන නායකත්වයක් හා දේශපාලනයක් සහිත ජනතා විමුක්ති පෙරමුණට එම දේශපාලන කළමනාකරිත්වයට මැදිහත් විය හැකියි. දැන් විශාලතම වෘත්තිකයින්ගේ සංවිධානය ජවිපෙ සමග එකතු වී සිටිනවා. ඔවුන් ජවිපෙ සමග එකතුවී සිටින්නේ හදන පාලනයේ තනතුරු බලාගෙන නොවෙයි; රට ගොඩනැගීමට කැපවී සිටින වෘත්තිකයින් වශයෙනුයි.

අද ඇත්තේ ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි; මහජන ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්. එසේ වී තිබෙන්නේ ජාතිකත්වයන් අතර අවිශ්වාසය හා සැකය වර්ධනය වන නිසයි. සිංහල හා මුස්ලිම් අන්තවාදය අප මෑතකදී අත්දැක්කා. මෙම තත්වයට මුහුණදිය හැක්කේ අන්තවාදය පරාජය කළ හැකි දේශපාලන ව්‍යාපාරයකට පමණයි. ජ.වි.පෙ. දේශපාලන න්‍යායපත්‍රයේ කිසිදු ජාතිවාදයකට, ආගම්වාදයකට ඉඩක් නැහැ.

නීතියේ විධානයේ ආධිපත්‍යය සහතික කළ හැක්කේ ජනතා විමුක්ති පෙරමුණට පමණයි. අධිකරණයෙන් කට්ටි පනිමින් සිටින ගෝඨාභයලාට නීතියේ හා විධානයේ ආධිපත්‍යයේ තහවුරු කළ නොහැකියි. අපි මේ රටේ මහජනයාගේ මුදල් සතයක්වත් හොරකම් නොකළ මිනිස්සු. වංචාකාරී දේශපාලකයන් නොසිටින එකම දේශපාලන ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ පමණයි. ජ.වි.පෙ. පාලනයක් යටතේ සැබෑ ලෙසම නීතිය ක්‍රියාත්මක වෙන රාජ්‍යයක් හදනවා. සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතිකත්වයන් ආමන්ත්‍රණය කළ හැකි දේශපාලන ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ බව සහතික කරනවා.

දැන් මේ රටේ ජනතාවට අපි කියන්නේ අපට බලය දෙන්න කියන එකයි. ජනතාව අතේ තියෙන බලය ජනතා විමුක්ති පෙරමුණට බාර දෙන්න. මේ රටට ආදරය කරන ආණ්ඩුවක්, මහජනතාවගේ වුවමනාකම් නියෝජනය කරන ආණ්ඩුවක්, මහජනතාවට තමන්ගේ යැයි හිතෙන ආණ්ඩුවක් පිහිටුවීමට ජනතා විමුක්ති පෙරමුණ සමග අත්වැල් බැඳගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

## ඉතිහාසයේ ඒ තට්ටු මාරු දේශපාලනය පරාජය කළ යුතුයි

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**



මේ නුගේගොඩ නගරය වසාගෙන පිරී ඉතිරී සිටින්නේ මේ සටන දිනන්න පුළුවන් බව ඔප්පු කරපු ජනතාවක්. මේ ජනතාව විනයගරුකව කළුතර සිට පාගමනින් පැමිණ මෙතන රැස්ව සිටිනවා.

රනිල්-මෛත්‍රී-මහින්දලා වෙන් වෙන් අය නොවේ. ඔවුන් එකම කණ්ඩායමක්. ඔවුන් එක මිටකට පරාජය කළ යුතුයි. අපි කුමන්ත්‍රණවලින් ආණ්ඩු මාරු කිරීමට විරුද්ධයි. ඔක්තෝබර් 26 මාළිගා කුමන්ත්‍රණයකින් බලය මාරු කිරීමට විරුද්ධ වුණේ ඒකයි. මේ ආණ්ඩුව ගෙදර යවා අලුත් ආණ්ඩුවක් හැදිය යුතුයි. ඒ වෙනුවට පරණ හොරු ගෙනත් තේරුමක් නැහැ. ඒ හිස්තැන පිරවිය යුත්තේ ජනතාවාදී ආණ්ඩුවක් බිහිකිරීමෙනුයි.

පහුගිය කාලය පුරා එකම කට්ටියක් ඇමතිවරු බවට පත් වුණා. ජනතාව ඉතිහාසයේ ඒ තට්ටු මාරු දේශපාලනය පරාජය කළ යුතුයි. අපි මේ ආරම්භ කළේ ඒ සටනයි. මේක ආණ්ඩුව පැරදවීමේ සටනක් පමණක් නොවෙයි; නව ජනතාවාදී ආණ්ඩුවක් බිහිකිරීමේ සටනයි. අපි මේ සටනට බැස්සේ සැලසුමක් ඇතිවයි. රට ගැන ඇත්ත හැඟීමක් තිබෙන විද්වතුන් අප සමග එක්ව සිටිනවා. ඔවුන් මේ රට ගොඩනගන්න ප්‍රතිපත්ති මාලාවක් හැදුවා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාවට නංවන විශ්වසනීය නායකත්වය ලෙස ඔවුන් ජනතා විමුක්ති පෙරමුණ තෝරා ගත්තා.

මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළ යුතු බව විශ්වාස කරන සංවිධාන ගණනාවක් අප සමග සාකච්ඡා කරන්න පටන් ගත්තා. මේ ඡන්දයක් වෙනුවෙන් හැදෙන පෙරමුණක් නොවෙයි. ජනතා බලයක් නිර්මාණය කරන පෙරමුණක්. සමාජය වෙනස්කිරීමේ වුවමනාවෙන් සිටින සංවිධාන ගණනාවක් අප සමග ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ජාතිවාදය පැරදවීම වෙනුවෙන් මහජන ආරක්ෂාව වෙනුවෙන් ජාතික සමගිය වෙනුවෙන් පීඩාවට පත් සියලු ජනකොටස් වෙනුවෙන් කැපවන පිරිස් අප සමග අත්වැල් බැඳගෙන සිටිනවා. අප කොන්දේසි විරහිතව මෙම සටන් පාඨ වෙනුවෙන් පෙනී සිටිනවා. මෙවැනි සංවිධාන ජවිපෙ පෙරටු කරගෙන දේශපාලනය කරන්න කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. මෙම සංවිධාන ඒකරාශී කරගෙන මේ සමාජය වෙනස් කිරීම සඳහා මහජන ව්‍යාපාරයක් අපි පිහිටුවනවා. එය මේ ජූලි මාසයේ 14 වනදා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී එළිදකිනවා.

මීළඟ මැතිවරණයේදී රනිල්ට-මහින්දට එරෙහිව ඉතිහාසයේ ගොඩනැගෙන විශාලතම දේශපාලන පෙරමුණ ගොඩනැගෙනවා. අද සතුරන් කලබල වෙලා. අපේ සතුරන් අප පක්ෂයේ නායක අනුර සහෝදරයාට අවලාද නගනවා. ඔවුන් එදා විජේවීර සහෝදරයාට අවලාද නැගුවා. පස්සේ සෝමවංශ සහෝදරයාට අවලාද නැගුවා. දැන් අනුර සහෝදරයාට අවලාද ගහනවා. අසත්‍යය අස්වැද්දූ බිමක සත්‍යය වල් පැළ වගේ පේන්න පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණ අවලාදවලින් වැට්ටවිය නොහැකියි. "අපි අපගේ සාර්ථකත්වය මනින්නේ මිතුරන්ගේ ප්‍රශංසාවලින් නොව සතුරන්ගේ කෝපාවිෂ්ඨ ගර්ජනාවලින්" යැයි චීන විප්ලවයේ නායක මාඕසේතුං පැවසුවා. අපි තෝරා ගත්තේ දුෂ්කර මාවතක්. අප සියලු දෙනා විශාල කැපකිරීම් කර තිබෙනවා. මේ අවලාදවලින් අපි අපේ වගකීම් කිසිදු ලෙසකින් වෙනස් කරන්නේ නැහැ. ජනතාවාදී ආණ්ඩුවක් නිර්මාණය වීමෙන් පසුවද අපි ස්වේච්ඡාවෙන් මේ රට වෙනුවෙන් වැඩකිරීමට සූදානම්.

## ඉතිහාසයේ ඔවුන්ගේ යුගය අවසන්. වර්තමානය සහ අනාගතය අපේ යුගයයි

**ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා**



මේ පාලකයින්ට තමන්ගේ අඩුම කුඩුම රැස්කරගෙන ගෙදර යන්න වෙලාව ඇවිත් තියෙනවා. අපි රට පුරාම මාසයක පමණ කාලයක් පුරා එම සංඥාව දී තිබුණා. සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව ජාතිකත්ව භේදයකින් තොරව රනිල්-මෛත්‍රී ආණ්ඩුවට ගෙදර යන්න බල කරන්න පැමිණ සිටිනවා.

මේ ආණ්ඩුව බලයට ආවේ රාජපක්ෂවරුන්ගේ දූෂිත පවුල් පාලනය අවසන් කරනවා කියාගෙන. නමුත් මේ ආණ්ඩුවත් රාජපක්ෂ නවත්තපු තැන ඉඳලා මහජන ධනය හොරකම් කරමින්, රට විකුණමින්, ඉදිරියට යනවා. ඒ විතරක් නොවෙයි, මහජන ආරක්ෂාව පවා ඔවුන් අත්හැරදමා තිබෙනවා. මේ තත්වය තුළ මේ ආණ්ඩුව බලයේ සිටිය යුතු නැහැ. ගෙදර යා යුතුයි. මේ ආණ්ඩුව විතරක් නොවෙයි. 71 වසරක් තිස්සේ මේ රට විනාශ කළ පාලකයන් හා ඔවුන්ගේ දේශපාලනය ගෙදර යැවිය යුතුයි. දැන් කුඩු ජාවාරම්කරුවන් සිව්දෙනෙක් එල්ලා මරන්න යනවාලු. දම්වැලේ අග අයට මරණ දඬුවම දුන්නත් කුඩු ජාවාරම් දම්වැලේ මුල් පුරුක් ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය වටේ ඉන්නවා. පාර්ලිමේන්තුව, පළාත් සභාව තුළ ඉන්නවා. ජවිපෙ පාලනයක් යටතේ මේ කුඩු ජාවාරම් දම්වැලේ මුල් පුරුක්, හොරුන්, වංචනිකයින්, ස්ත්‍රී දූෂිතයින් හිරගෙවල්වලට දක්කනවා.

අවුරුදු 71 පුරා මේ රටේ පාලකයෝ ජනතාවට රුපියල් කෝටි ලක්ෂ 12ක ණය බරක් ඉතුරු කරලා. අපට විනාශ කරපු රටක් ඉතිරි කර තිබෙනවා. ඔවුන් හදපු රටක් නැහැ. ඔවුන් දැන් ඡන්ද ලංවෙනකොට ජාතිවාදය වපුරමින් ඡන්ද ගොඩගහනවා. කුඩු ගෙන්නල ලාභ හොයනවා. මහජන මුදල් නාස්තිකරලා ණය ගොඩගහනවා. ජනසවිය, සුභ අනාගතයක්, ආසියාවේ ආශ්චර්යය, යහපාලනය වැනි වචන කියමින් ජනතාව රවටමින් සිටිනවා. රට වනසන පාලනයන් ගෙනත් තිබෙනවා. මේ රට මෙහෙම විනාශ වෙන්න ඕන රටක් නොවෙයි.

මහින්ද ආණ්ඩුව පරාජය කරනකොට රනිල් - මෛත්‍රී ජනතාවට බලාපොරොත්තු ගොන්නක් හැදුවා. ඒත් සිදුවුණු කිසිවක් නැහැ. ආණ්ඩුව තවත් පවුල් ලක්ෂ හයකට සමෘද්ධිය දෙන්න යනවා. ඒ කියන්නේ මේ දක්වා දෙමින් හිටපු පවුල් ලක්ෂ 13යි අලුත් 6යි එකතුව පවුල් ලක්ෂ 19ක් විතර සමෘද්ධියෙන් ජීවත් වෙන රටක් නිර්මාණය වී තිබෙනවා. අවුරුදු 71ක් ගතවෙද්දි දළ වශයෙන් කෝටියක් විතර ජනතාවක් සමෘද්ධියෙන් ජීවත් වෙනවා. මේ ආණ්ඩුවලට ආයෙත් ජනතාවගෙන් බලය ඉල්ලන්න පුළුවන්ද? ඔවුන් රැස්කර තිබෙන්නේ බලයෙන් පහවෙන්න අවශ්‍ය ලකුණුයි.

මේ රටේ ආණ්ඩුවක් හදන්න ඇත්ත සුදුසුකම් පෙන්නපු එකම පක්ෂයයි තිබෙන්නේ. ඒ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. වසර 71ක් පුරා මේ රටේ පාලකයෝ කෘෂිකර්මාන්තයට මල්ටි බැරල් ප්‍රහාර එල්ල කළා. දැන් බෝම්බ ප්‍රහාර නිසා සංචාරක කර්මාන්තය ඇදවැටී තිබෙනවා. ඔවුන්ට මේ රට ඉදිරියට ගෙනයාමට නොහැකියි. ඉතිහාසයේ ඔවුන්ගේ යුගය අවසන්. වර්තමානය සහ අනාගතය අපේ යුගයයි. සමාජයේ සිදුවීම් දෙස සංවේදී වෙමින් සියලු දෙනා එක කඳවුරකට එකතු විය යුතුව තිබෙනවා. ජනතාවාදී පාලනයක් නිර්මාණය කරගැනීම සඳහා සියලු දෙනාට ආරාධනය කරනවා.

## සියලු ජාතිකත්වයන්ට ගොඩවිය හැකි වේදිකාව ජනතා විමුක්ති පෙරමුණයි

**අයිතීන් උදෙසා කාන්තාවෝ සභාපතිනි සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය**



මහජන ආරක්ෂාව තහවුරු කරන්න බැරිවුණු පාලකයන්ට ගෙදර යන්න කියන්න ධෛර්යයක් තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණට පමණයි. සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතිකත්වයන්ට ගොඩවෙන්න පුළුවන් වේදිකාව ජනතා විමුක්ති පෙරමුණ විතරයි.

අපි එක්නෙකා අතර, තරගයක් තිබුණේ නැහැ. අපේ දරුවන්ට පාසලක් හොයාගන්නේ කොහොමද? බෙහෙත් කරගෙන්නේ කොහොමද කියන එක අපි හැමෝටම ප්‍රශ්න විදිහට තිබුණා. ජාතිවාදී දේශපාලකයන් අපිව ව්‍යාපාරික තරගයකට ඇදල දාල අප අතර විරසකයක් හැදුවා. සුන්දර ශ්‍රී ලංකාවෙක් බිහිකර ගැනීම වෙනුවෙන් සියලු ජාතිකත්වයන්ට අයත් අපි ජනතා විමුක්ති පෙරමුණ සමග එකතු වෙනවා. මේ රටේ මහජන ආරක්ෂාව සැලසිය හැකි ජාතික සමගිය ගොඩනැගිය හැකි ජනතා විමුක්ති පෙරමුණ සමග හෙට දිනයේ ගොඩනගන රට තුළ සියලු දෙනාට මානව ප්‍රේමයෙන් එකතු වෙන ලෙස ආරාධනා කරනවා.

# සොයුරියනි, මේ පාරෙන් එන්න...



කාන්තාවන් වන අපට බොහෝ සිහින පවතී. උපතේ සිට මරණය දක්වාම එම සිහින නොනැසී පවතින අතර අපට අපගේ ජීවිත කාලය පුරාවට මේ සිහින යථාර්ථයක් කරගැනීමට අවස්ථාව හිමිවී ඇතිදැයි අප මදක් විමසා බලමු.

වාර විභාගය ලියන්නට බාල සොහොයුරා වඩාගෙන පාසලට පියනගන කකුලක් අහිමි වතු කම්කරු දියණිය වැනි දියණියන්ගෙන්ද, කුසගින්න නිසා දරුවන්ද සමගින් දිවිනසාගන්නා කතුන්ගෙන්ද, ගිනි පොලියට ගත් ක්ෂුද්‍ර ණය ගෙවාගැනීමට නොහැකිව දිවිනසාගත් කාන්තාවන්ගෙන්ද, යුද්ධය නිසා සැමියන් අහිමිව ගෘහමූලිකයන් බවට පත්වී ජීවන අරගලයේ යෙදෙන උතුරු නැගෙනහිර දෙමළ කතුන්ගෙන්ද, ළමා විවාහ සමඟ අසරණ වන මුස්ලිම් කතුන්ගෙන්ද, එක් ජාතියක් බෝවීමේ භීතියෙන් තම ජාතියේ ගොඩ වැඩිකරගන්නට දරුවන් හදන මැෂින් බවට පත්වීමට බල කෙරෙන සිංහල කතුන්ගෙන්ද, මැදපෙරදිග වහල් සේවයේ යෙදෙන කතුන්ගෙන්ද, ඕනෑම මොහොතක ලිංගික අතවරයට ලක්වන හා ලක්වූ බාල තරුණ මහලු කාන්තාවන්ගෙන්ද පෙනී යන්නේ අපගේ සිහින බොඳ වී ඇති බව නොවේද? අවසන ජනගහනයෙන් 51% ක් වූ රටේ සමස්ත කාන්තාවන් වශයෙන් අපට අපේ බලාපොරොත්තු ඉටුකර ගැනීමට හැකිවී තිබේද?

අපේ සියලු අපේක්ෂාවන් ඉටුවන සමාජයක් පැවැතියා නම් අපේ දරුවන්ට නිදහසේ අධ්‍යාපනය ලැබීමේ හැකියාවක් ලැබෙනු ඇත. අපේ දරුවන්ට හොඳ පාසල් ලැබිය යුතුව ඇත. කුසගින්නේ මිය යන දරුවන් හෝ දවි නසා ගන්නා මවුවරුන් අපට මුණ නොගැසෙනු ඇත. දරිද්‍රතාවේ පත්ලටම කිඳාබැස ඇති ආර්ථිකය ගොඩගන්නට මැදපෙරදිග ගෘහ සේවයට යන කාන්තාවන් දකින්නට නොලැබෙනු ඇත. සූ සැටබරණින් සැරසී පේදුරුතුඩුවේ සිට දෙවුන්දරතුඩුව දක්වා දවසේ ඕනෑම වෙලාවක ගමන් ගත්තත් කාන්තාවන් කිසිදු අතවරයකට ලක් නොවනු ඇත. නමුත් යථාර්ථය ඊට බොහෝ දුරය.

වසර 71ක් පුරා නැවත නැවතත් ලාංකේය භූමිය මත සිදුවෙමින් පවතින්නේ එකම දෙයමය. කුසගින්නේ හිඳිමින් ජන්දපොළට ගොස් අපි තට්ටුමාරු ක්‍රමයට නිල් කොළ පාලකයින්ට කතිරය ගැසුවෙමු. බස්රියේ, දුම්රියේ පාපුවරුවේ එල්ලී ගොස් ඔවුන් බලයට පත්කරන්නට අපි ජන්දය පාවිච්චි කළෙමු. රෝහලේ ඇඳක් හෝ නොමැතිව බෙහෙත් නොමැතිව පණ අදිමින් හිඳ නිල් කොළ පාලකයින් වෙනුවෙන් සිහින දැක්කෙමු. ඔවුන් අතින්ම දූෂණයට ලක්වූ, මරා දැමුණු ගැහැනුන්ට අපහාස කරමින් දූෂකයින් වංචාකාරයින්, වෙනුවෙන් ජන්දය පාවිච්චි කළෙමු. මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ දරුවන් ඇතිව මෙන්ම කසිප්පු බී ගෙට ගොඩවන සැමියාගෙන්ද රාත්‍රිය පුරා ගුටි කා පසුදා පහන්වන සැණින් ජන්ද පොළට ගොස් බාර් හිමියන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වෙනුවෙන් ජන්දය පාවිච්චි කළෙමු. අවසානයේ අපි අප විසින්ම අපේ රට විනාශය කරා යොමු කිරීමට 71 වසරක් පුරා ජන්දය පාවිච්චි කර ඇත්තෙමු.

කාන්තාවන් වන අපි කඩේට ගොස් පොල් තෝරන විට කිහිප වරක් සොලවා හොඳම පොල්ගෙඩිය තෝරා ගන්නට උත්සාහ කරමු. ඇඳුමක් ගන්නට ගිය විට තෝරා තෝරා හොඳම දෙයක් ගන්නට වග බලා ගනිමු. නමුත් රටේ පාලකයින් පත්කිරීමේදී මෙවැනි තෝරා ගැනීමක් කර හොඳම දේ තෝරා ගැනීමට අපි මෙතෙක් අපොහොසත් වී ඇත්තෙමු. නමුත් දැන්වත් සියල්ල වෙනස් කළ යුතුව තිබේ.

ඉදින් මේ ජරාජීර්ණ වූ ධනපති සමාජයේ අනිවාර්ය ගොදුරු බවට පත්වී මිය යනවා වෙනුවට මේ සමාජය යහපත් දිශාවට යොමු කිරීමට අප පෙරමුණ ගත යුතුව තිබේ. අපි හම්බ කොළොත් අපි කාලා ඇඳලා ඉන්නවා යන මානසිකත්වයෙන් මිදී රෑ වැටුණු වලේ දහවලේද නැවත නැවතත් වැටෙමින් ආ ගමන නතර කළ යුතුව ඇත. ඒ සඳහා කාන්තාවන් වන අපට ධෛර්යයක් මෙන්ම හැකියාවක්ද සතුවන බව අවබෝධ කර ගත යුතුය.

අවිශ්වාසය වෙනුවට විශ්වාසයෙන් ඉච්ඡාභංගත්වය වෙනුවට බලාපොරොත්තුවත් රැගත් ජාතික සමගිය ගොඩනඟන රට හදන ජනතාවාදී පාලනයක් වෙනුවෙන් වූ අංකුර මේ භූමිය මත රෝපණය වී තිබේ. පසුගිය ජූලි 14 වනදා මානවාදී, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී වාමවාදී සියලු බලවේගයන් සමගින් ගොඩනැඟුණු පුළුල් මහජන ව්‍යාපාරය රට පාලනය කරන අවස්ථාව දක්වා ඔසවා තැබීමටත් ඉන් ඔබ්බට වගකීම් පවරා ගැනීමටත් කාන්තා දායකත්වය අනිවාර්ය සාධකයකි.

මේ දූෂිත සමාජ ක්‍රමයේ පහසු ගොදුරක් බවට පත්වී සිටින නමුදු අපට ඊට එරෙහි වන්නට දැවැන්ත හැකියාවක් ඇති බව විශ්වාස කළ යුතුමය. ඒ වෙනස වෙනුවෙන් අපට දැන් මාවතක් සකස් වෙමින් තිබේ. ඒ මාවතට පිවිසී අපි සැවොම එක්වී මේ රට වැටී ඇති මේ අගාධයෙන් ගොඩ ගත යුතුව තිබේ.

71 වසරක් පුරා ඉච්ඡාභංගත්වයට පත් සමාජයකට බලාපොරොත්තුවේ නැවුම් අරුණළු කැන්දන්නට සොයුරියනි, මේ පාරෙන් එන්න...

## උනුන් විරසක නොවී අත්වැල් බඳිමු සකී ...

**නිදන් කරන් පසුගැති සිතුවිලි වස්තූ**
**වැදී ගෙයින් ගෙට නිදියන බලවත්තූ**
**නිවී යා නොදී පන්දම් කර පත්තූ**
**යදම් බිඳති එඩි බල ඇති බවලත්තූ**

**නොපා නුවණ හැඳි මිටටත් වඩා නැති**
**එපා ලොවට පෙන්වන්ට දුඳන ගතී**
**දපා උනුන් මත විරසක උනා ඇතී**
**කපා දැමූවත් අත්වැල් බඳිමු සකී**

**ඇස්සට නියවනා, වත්තම බදු දීපු**
**පස්සට දමමු, වස්සන් ගෙබිමක් හාපු**
**නිස්සට හිස නමා, හොරු රැළ රට කාපූ**
**මස්සට යට නොවී, කුණු කූඩෙට දාමු**

## සිව්දෙසින්



### අපහාසයට දඬුවම ඉල්ලා වීදි බැස

පසුගිය දා පුවටෝ රිකෝ ජනතාව දස දහස් ගණනක් වීදි බැස කොඩි වනමින් හට්ටි මුට්ටිවලට ගසමින් විරෝධතා දැක්වූයේ ආණ්ඩුකාර රිකාඩෝ රොසෙල්ලෝට ධූරයෙන් ඉවත් වීමට බලකරමිනි. විරෝධතාව ඇති වූයේ රොසෙල්ලෝ ඔහුගේ සමීපතමයින් අතර අන්තර්ජාලය හරහා සිදුකරන ලද සංවාදයක් ප්‍රසිද්ධියට පත් වීමත් සමගය. පිටු 889 කින් සමන්විත වූ සංවාදයේ කාන්තාවට නිග්‍රහ හා අපහාස කර තිබූ ප්‍රකාශයන් හේතුවෙන් මෙම විරෝධතා ඇති විය.

තවද මෙම විරෝධතා තීව්‍ර කිරීමට 2017 මරියා කුණාටුවෙන් පසු පුවටෝ රිකෝව මුහුණ දී සිටින ණය අර්බුදය සහ පුවටෝ රිකෝ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක විසින් සිදුකර ඇති දූෂණද හේතු විය. දැඩි අව් රශ්මියද නොතකා කුඩා දරුවන්ද, යෞවන යෞවනියන්ද, වෘත්තිකයින්ද වැඩිහිටියන්ද මෙලෙස විරෝධතා දැක්වීම සඳහා ඇමරිකානු අධිවේගී මාර්ගයට රැස්වී සිටීම විශේෂත්වයක් විය. විරෝධතාවලට ප්‍රතිචාරයක් වශයෙන් රොසෙල්ලෝ තමා ජනතාවගෙන් සමාව ඉල්ලා සිටින බව පැවසීය.

තමා ඉල්ලා අස් නොවන නමුත් නැවත ජන්දයක් නොඉල්ලන බවත් ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. මෙය විරෝධතාකරුවන් තවදුරටත් ප්‍රකෝප කිරීමට හේතු විය. කෙසේ නමුදු මෙයට වසර 15කට පසු පුවටෝ රිකොහි සිදුවූ විශාලතම ජන විරෝධතාවය වෙයි. වර්ධනය වන විරෝධතා හමුවේ තවදුරටත් ධූරයේ රැඳී සිටීමට නොහැකි වූ රොසෙල්ලෝ ඉල්ලා අස්වීමට තීරණය කළ අතර කාන්තා අයිතීන් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් පෙන්වා දෙන්නේ, මෙය කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂ ජයග්‍රහණයක් වන බවත් එසේම දීර්ඝ සටනක ආරම්භයක් බවත්ය.

### සුඩාන කාන්තාවන්ට යුක්තිය ඉටුකරනු

සුඩානයේ ඔමාර් අල් බෂීර් ගේ 30 වසරක පාලනය අවසන් කිරීමට පසුගිය කාලයේ සිදුවූ විරෝධතා ව්‍යාපාර සඳහා කාන්තාවෝ විශාල වශයෙන් සහභාගි වූහ. එසේ ක්‍රියාකාරී ලෙස සහභාගි වූ කාන්තාවන්ට හමුදාව විසින් සිදු කළ දූෂණ කිරීම් හා ලිංගික හිරිහැරවලට යුක්තිය ඉටුකිරීම මගහැරී යන තත්වයක් ඇතිවී ඇති බව එරටින් වාර්තා වේ.

පසුගිය දා හමුදාව හා විපක්ෂය විසින් ඇති කරගත් එකඟතාවය හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වේ යැයි සැක පහළ වී තිබේ. සුඩාන වෛද්‍ය කමිටුව පෙන්වා දෙන්නේ ලිංගික හිංසන 70ක් පමණ වාර්තාගත වී ඇති බවය. කෙසේ නමුදු එවැනි ලිංගික හිංසන පිළිබඳ චෝදනා හමුදාව විසින් ප්‍රතික්ෂේප කරන අතර මේ වන තෙක් ඒවා පිළිබඳ පරීක්ෂණ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත. මේ



සම්බන්ධයෙන් කාන්තා ක්‍රියාකාරිනියන් පෙන්වා දෙන්නේ, විරෝධතාවලදී කාන්තාවන්ගෙන් ලැබුණු අතිමහත් දායකත්වය යටපත් කරමින් කාන්තාවන් නැවත් නිවෙස්වලට තල්ලුකර කොටු කර දැමීමේ දේශපාලන ගනුදෙනුවක් සිදුවෙමින් පවතින බවය. අප්‍රිකාව පුරා කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාත්මක වන සංවිධාන ජාත්‍යන්තර ප්‍රජාවට මේ වන විට අවධාරණය කරමින් සිටින්නේ, කාන්තාවන්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩත්වයන්ට නිසි යුක්තිය ඉටුකරන ලෙස සුඩාන හමුදා කවුන්සිලයට බලකරන ලෙස හා ඒ වෙනුවෙන් මැදිහත් වන ලෙසය.

### ඉරානයේ කාන්තා පාපන්දුලෝලීහු සටන් මඟට

ඉරාන පාපන්දු කණ්ඩායම ආසියාවේ ඉහළම ස්ථානයේ රැඳෙන පාපන්දු කණ්ඩායම වන අතර 2022 කටාර්හිදී ලෝක කුසලාන පාපන්දු තරගාවලිය පැවැත්වීමට නියමිත අතර සිය කණ්ඩායමේ ජයග්‍රහණය පතා බොහෝ ඉරාන වැසියන් තරග නැරඹීම සඳහා එහි යාමට දැනටමත් සැලසුම් කර තිබේ. කෙසේ නමුත් ඉරාන කාන්තාවන්ට පිරිමි පාපන්දු ක්‍රීඩා තරග නැරඹීමට සහභාගි වීම දශක හතරක පමණ කාලයක් මුළුල්ලේ නීතියෙන්




තහනම් කරනු ලැබ තිබේ. මේ වන විට මෙම තහනම ඉවත් කරවා ගැනීමට ව්‍යාපාරයක් දියත් වෙමින් පවතින අතර මෙම නීතිය ඉවත් නොකළහොත් ලෝක කුසලාන තරගාවලිවයට ඉරානය ඇතුළුවීම වැළැක්වෙන මට්ටමට මෙම ව්‍යාපාරයේ හඬ වර්ධනය වී තිබේ.

මෙම ව්‍යාපාරය මෙහෙයවන කාන්තාවන් ප්‍රකාශ කර සිටින්නේ කාන්තාවන්ද පිරිමින් මෙන්ම ක්‍රීඩා ලෝලීන් වන බවයි. තවද ෆිෆා සභාපති විසින් ඉරාන පාපන්දු ෆෙඩරේෂණයට ලිපියක් යවා ඉරාන කාන්තාවන්ට තරග නැරඹීමට ඉඩ නොසැලසීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා තිබේ. මෙම ව්‍යාපාරයේ කැපී පෙනෙන චරිතයක් වන්නේ ඉරාන පාපන්දු කණ්ඩායමේ නායකයාගේ නැගණිය වන මාර්යම් ශෝජායි වන අතර ඇය පවසන්නේ තමා මෙය සිදුකරන්නේ කාන්තා පාපන්දු ලෝලීන් වෙනුවෙන් වන අතර එයට සහෝදරයාගේ සම්බන්ධයක් නොමැති බවය.

ඉතිහාසයේ කතාව... 12

# රජය ව්‍යාප්ත වීමේ ඉතිහාසය





"රාජ්‍යයේ ඓතිහාසික කාර්ය කොටස සහ එහි අර්ථය පිළිබඳව මාක්ස්වාදය දරන අදහස මෙයින් ඉතාමත් පැහැදිලි ලෙස ප්‍රකාශිත වේ. රාජ්‍ය යනු, පංති සතුරුභාවයන්ගේ නොසමාදාන ස්වභාවයේ නිමැවුමක් හා සලකුණක් වන්නේය. පංති සතුරුභාවයන් වාස්තවික වශයෙන් සමාදාන කළ නොහැකි තැන, අවස්ථාවල හා ඒ තාක් දුරට, රාජ්‍යය උද්ගත වන්නේය. එසේම, අනෙක් අතට පංති සතුරුභාවයන් සමාදාන කළ නොහැකි බව රාජ්‍යයේ පැවැත්මෙන් ඔප්පු කෙරේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**6වැනි වෙළුම,**
**13 පිටුව**

පැරණි ප්‍රාථමික සාමූහික ක්‍රමය බිඳවැටී, ලොව පුරා එක රැයකින් රජය බිහිවූයේ නැත. සමාජ සංවර්ධනය යනු එවැන්නක් නොවේ. නැතිනම් දෙවියන්ගේ අදෘශ්‍යමාන බලයක් විසින් එක් රැයකින් රජය මැව්වේද නැත. හැමවිටකම නැතිනම් බොහෝවිට සිදුවන්නාක්මෙන් රජය බිහිවූයේ සමාජ සංවර්ධනයේ ඉදිරියෙන්ම සිටි ගෝත්‍රික කණ්ඩායම් තුළිනි. ඉන්පසු සිදුවූයේ පෞද්ගලික දේපළ අත්පත්කර ගැනීම සඳහා එම 'රජය' බලහත්කාරය යොදා ගම්බිම් ආක්‍රමණය කරමින් හෝ පැතිරී යමින් තැනින් තැනට ව්‍යාප්ත වීමය. රජයේ ව්‍යාප්තිය කොතරම් සංකීර්ණද යත් රජය බිහිවී සියවස් ගණනාවක් ගතව තිබියදීත් තවමත් 'රජය' නැමති යාන්ත්‍රණය එහි හරයෙන් ක්‍රියාත්මක නොවන ගෝත්‍රික ජන කණ්ඩායම් රැසක් ලොව පුරා සිටී. ඇමරිකානු මහාද්වීපයේ ඇමසන් වනාන්තරය තුළ, ආසියාවට අයත් නිව්ගිනියා දූපත්වල තවමත් රජයේ ව්‍යාප්තියට හසු නොවූ හා රජය බිහිකර නොගත් ගෝත්‍ර සිටීම මීට උදාහරණ වේ.

ලංකාවේ ලිඛිත හා නිල ඉතිහාසයට අනුව ගත්විට ලංකාවේ රජයේ බිහිවීම ආරම්භ වන්නේ ක්‍රි.පූ. 06වැනි සියවසේ ඉන්දියාවේ සිට මෙහි පැමිණි ඉන්දු යුරෝපීයයන් ගෙනි. පුරාවිද්‍යාත්මක සාධක අනුව ඒ වන විටත් ලංකාව තුළ පැවති ජනාවාසකරණ තුළ රජය බිහිවීමේ ලක්ෂණ පහළ වී තිබෙන්නට ඇති වුවද නිශ්චිත ලෙස රජය (රජු) අපට හමුවන්නේ 'විජයගේ පැමිණීම' ලෙස ඉතිහාසගතව ඇති ඉන්දු යුරෝපීයන්ගේ පැමිණීම සමගය. අපේ රටේ ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නේද ඒ සමගය.

**විනාශය මත ගොඩනැගීම**

ලෝක ඉතිහාසය දෙස බලන විට රජයේ ව්‍යාප්තිය යනු බලහත්කාරී හා විනාශකාරී ක්‍රියාදාමක් බව පෙනේ. පෞද්ගලික දේපළ ඇතිවීමත්, නැතිනම් දේපළ පෞද්ගලිකව අත්පත් කරගැනීමේ හැකියාව ඇතිවී එසේ අත්පත් කරගැනීමත් සමග පෞද්ගලික දේපළ මිනිසාගේ චින්තනය තුළ මහා විපර්යාසයක් කළ බව පෙනේ. එතෙක් පැවති සාමූහික චින්තනය වෙනුවට, බෙදාහදාගෙන කෑමේ සමාජ සම්ප්‍රදාය වෙනුවට, කිසිවකු පීඩාවට පත් නොකිරීමේ සම්ප්‍රදාය වෙනුවට දේපළ සඳහා සියල්ලන් පීඩාවට පත්කොට යටපත් කරගැනීමේ උන්නතිකාමී අභිලාෂය මතුවිය.

පෞද්ගලික දේපල මිනිසාගේ ආශාවන් උද්දීපනය කළ අතර තව තවත් දේපළ ගොඩ ගැසීමට ඔහු පෙළඹවීය. එහිදී දේපළ කොල්ලකමින් ගොඩගැසීම සඳහා බලය අවශ්‍ය විය. එසේම බලය පවත්වාගැනීම සඳහා දේපළ අවශ්‍ය විය. එනම් ධනය සඳහා බලය යෙදවීම හා බලය සඳහා ධනය යෙදවීම සිදුකෙරිණි. අසල්වැසි ගෝත්‍ර යටපත් කරමින් භූමිභාග අත්පත්කර ගනිමින් එහි දේපළ කොල්ලකමින් 'රජය' නැවුම් භූමි කරා ව්‍යාප්ත විය. විටෙක එය ආක්‍රමණකාරී යුද්ධවලින් පිරුණ ප්‍රචණ්ඩ ක්‍රියාවලියක් වූ අතර තවත් විටෙක ප්‍රචණ්ඩත්වය මතුපිටට නොපෙනෙන එහෙත් බලය යොදා කරන ක්‍රියාවලියක් විය. දුර්වල ගෝත්‍ර හා ජනාවාස ප්‍රබලයින් ඉදිරියේ කිසිදු විරෝධයකින් තොරවම යටත් වූ අවස්ථා බොහෝ තිබිණි. ඕස්ට්‍රේලියාවේ ආදිවාසී අබොර්ජින්වරුන් විනාශකරමින් එහි රජය බිහිකරන ලද්දේ බ්‍රිතාන්‍ය ප්‍රමුඛ යුරෝපා ජාතීන් විසිනි. ඒ 18වැනි සියවස තරම් මෑතදීය. එසේම ඇමරිකානු මහාද්වීපයේ ජීවත්වූ රතු ඉන්දියානු ගෝත්‍රික ජනයා ඔවුන්ගේ ගම්බිම්වලින් පලවා හරිමින්, ශිෂ්ටාචාර විනාශකරමින් මහා මිනිස් ඝාතන මගින් ඇමරිකාවේ වත්මන් රජය ගොඩනගනු ලැබුවේ යුරෝපියන් විසිනි.

ලෝකයේ ලිඛිත ඉතිහාසය යනු බොහෝ විට රාජ්‍යය විසින් නැතිනම් පාලකයන් විසින් ලියන ලද්දක් විය. එම ඉතිහාසය තුළ ඉතිහාසයේ සැබෑ නිර්මාණකරුවන් වන වැඩකරන ජනයා නොසලකා හැර රජුන්, ප්‍රභූන්, වීරවරුන් ඉතිහාසය නිර්මාණය කරන්නන් බවට අර්ථකථනය කර තිබේ. ඒ නිසාම දැනට ලොව පවතින නිල ඉතිහාස කථා බොහෝ විට වැරදි හා ප්‍රබන්ධ කරන ලද ඒවා වේ.

රාජ්‍ය ගොඩනැගීම පිටුපස ඇත්තේ මහා ජන විනාශයක කථාවක් බව ඉන් පැහැදිලිවේ.

**රජයේ වෙනස්කම්**

රජය හැමතැනම සමාන ලෙස එකවිට බිහි නොවුණා සේම එක් එක් භූගෝලීය කලාප තුළ බිහිවූ රජයේ හැඩහුරුකම්ද වෙනස්කම් සහිත විය. ග්‍රීසිය හා පසුව රෝමය පදනම්කරගත් යුරෝපයේ රජය ආරම්භයේදී එක් අතකින් වහල් හිමි රජය වූ අතර ඒ සමගම ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නගමින් රාජ්‍ය ආකෘතියක් වූ ප්‍රජාතන්ත්‍රවාදයට පදනමද දැමීය. ආසියාවේ රජය ආරම්භයේදී ඉන්දියාවේ සමහර තැන්වල හා ලංකාවේද ආසියාතික ක්‍රමයේ රජයක් (වහල් හිමි රජයට හෝ වැඩවසම් රජයට වෙනස්) බිහිවූ අතර චීනය, ජපානය වැනි භූමි කලාපවල වහල් හිමිකම හා වැඩවසම් ලක්ෂණ මිශ්‍ර ස්වරූපයක් රජය තුළ දක්නට ලැබිණි. කෙසේ වෙතත් හරයෙන් ගත් විට අප මීට කලින්ද සඳහන් කළ පරිදි රාජ්‍ය වර්ග කිහිපයක් ඉතිහාසයේ දැකිය හැකි විය. එහිදී ආරම්භක රාජ්‍ය වර්ගය වූයේ වහල්හිමි රජය හෝ ආසියාවේදි ආසියාතික ක්‍රමය වේ. ඉන්පසු වැඩවසම් රාජ්‍ය හා ධනවාදී රජය හා අවසානයේ සමාජවාදී රාජ්‍යයද ඉතිහාසය තුළ බිහිවී තිබේ.

**රජය හා ඉතිහාසය**

ලෝකයේ ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නේ බොහෝවිට රජය බිහිවීමත් සමගය. ඉතිහාසය ලියූ හෝ ඒ සඳහා මූලාශ්‍ර සකස් කළ බොහෝදෙනා එක්කෝ රාජ්‍ය අනුග්‍රහය ලැබූ ආගමික නායකයෝ වූහ. නැතිනම් එකල රාජ්‍ය අනුග්‍රහය ලැබූ ලේඛන ගතකරන්නෝ වූහ. ඒ නිසාම ලෝකයේ ලිඛිත ඉතිහාසය යනු බොහෝ විට රාජ්‍යය විසින් නැතිනම් පාලකයන් විසින් ලියන ලද්දක් විය. එම ඉතිහාසය තුළ ඉතිහාසයේ සැබෑ නිර්මාණකරුවන් වන වැඩකරන ජනයා නොසලකා හැර රජුන්, ප්‍රභූන්, වීරවරුන් ඉතිහාසය නිර්මාණය කරන්නන් බවට අර්ථකථනය කර තිබේ. ඒ නිසාම දැනට ලොව පවතින නිල ඉතිහාස කථා බොහෝ විට වැරදි හා ප්‍රබන්ධ කරන ලද ඒවා වේ.

කෙසේවෙතත් රජය බිහිවීමත් සමග පෞද්ගලික දේපළ වර්ධනය කරගැනීමේ වුවමනාවත් සමග වඩ වඩාත් වැඩියෙන් නිෂ්පාදනය කිරීමේ වුවමනාත් සමග සමාජ සංවර්ධනයට එක් අතකින් ගතිකත්වයක් ලැබිණි. හරියටම කියන්නේ නම් පෞද්ගලික දේපළ හා රජය ඉතිහාසයේ ගමන වේගවත් කරමින් ඊට ගතිකත්වයක් ලබා දෙන ලදී. එය රජය බිහිවීමෙන් සමාජ සංවර්ධනයට ලැබුණු වාසිය විය. එහෙත් ඒ අතරම ඉතිහාසය තුළ එම ගතිකත්වය රජය විසින් ඇතිකරනු ලැබුවේ ඉතාම අමානුෂිය ලෙස දේපළ අහිමි විශාල ජනතාවක් නිර්මාණය කරමින් ඔවුන් පාගා පීඩාවට ලක්කරමින් හා විවිද ආක්‍රමණ මගින් මහා මිනිස් ඝාතනයන්ට මග පාදමිනි. රජය බිහිවීමත් සමග යුද්ධද බිහිවිය. රටවල් ආක්‍රමණය කිරීම ඉතිහාසයේ මුල් වකවානුවේ සුලබ දේ විය. ඒ අතර රජය තුළ ඉතිහාසය ඉදිරියට ගියේ මහා මිනිස් ඝාතන, ලේ වැගිරීම්, ආක්‍රමණ, යටත්කිරිම් හා පීඩාවන් මගිනි.

**වීරකථා ඉතිහාසය**

අපට ඉතිහාසයේ හමුවන වීරකථා බොහොමයක්ම ලේ වැකි ආක්‍රමණ වීරත්වයට නැංවූ කථා විය. ග්‍රීසියේ ඇතැන්ස්, ස්පාටා වැනි පෞර රාජ්‍යයන් විසින් ගෙන ගිය යුද්ධ පදනම් කරගත් හෝමර්ගේ 'ඉලියඩ්' හා 'ඔඩෙසි' නම් වීර කාව්‍ය තුළත්, ඉන්දියාවේ 'මහා භාරතය' 'රාමායනය' වැනි වීර කාව්‍ය තුළත් වීරත්වයට යටින් ඇත්තේ ආක්‍රමණ, ඝාතන හා ලේ වැගිරීම්ය. ඒ අනුව රජය බිහිවීමෙන් පසු අප දකින්නේ, එම රජයේ ක්‍රියාවන් සාධාරණය කරමින් රජය උත්කර්ෂයට නංවමින් හා ඊට වීරත්වයක් ආරෝපණය කරමින් ඉතිහාසය ලියනු ලැබූ බව හා ඊට සමගාමීව සාහිත්‍යයක්ද බිහිවූ බවය.

ඉතිහාසය යනු වියුක්ත දෙයක් නොවේ. එය රජය, දේශපාලනය, කලාව, විද්‍යාව, දර්ශනය, තාක්ෂණය වැනි සියලු විෂයන් ඒකාබද්ධ කරගනිමින් වර්ධනයක් වූවක් විය. එබැවින් ඉතිහාසය සංයුක්තව වටහාගන්නේ කෙසේද යන්න විමසා බැලිය යුතුව ඇත.

# වෙළඳ යුද්ධයෙන් ඩොලරය පසුබසී



මේ දිනවල ජාත්‍යන්තර දේශපාලනයේ සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ සිදුවන සම්බාධක පැනවීම්, තීරු බදු පැනවීම්, වෙළඳ යුද්ධ ආදිය විසින් එක්සත් ජනපද ඩොලරය සතු බලය හීනවෙමින් පවතින බව පෙනෙන්නට තිබේ. මෙය තවදුරටත් වර්ධනය වුවහොත් නුදුරු අනාගතයේදීම ඩොලරය සතු ආධිපත්‍යය මුළුමනින්ම බිඳවැටීමට ඉඩ ඇතැයිද අනාවැකි පළ කෙරෙමින් තිබේ.

ලෝක ආර්ථික අර්බුදය හේතුවෙන් සෑම අධිරාජ්‍යවාදී රටකටම තම තමන්ගේ ජාතික ආර්ථිකයන්, අනෙකුත් විදේශීය ආර්ථිකයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට බලකෙරෙන තත්වයක් උදාවී තිබේ. ලොව විශාලතම ආර්ථිකයට හිමිකම් කියන එක්සත් ජනපදය තමන් සතුව තිබූ ශ්‍රේෂ්ඨත්වය යළි අත්පත්කර ගැනීම සටන් පාඨය කරගනිමින් ලොව පුරා රටවලට තර්ජනය කරමින්, සම්බාධක, වෙළඳ බාධක, තීරු බදු පනවමින් සිටී. එහෙත් ඒ අතරම ඉන් පැනනංවන ප්‍රතිඵල නොසලකා හරිමින් කටයුතු කිරීමට හෝ නොසලකා හැරීමට බලකෙරී තිබේ. එක්සත් ජනපද ආර්ථික සම්බාධක වලංගුව පවතින්නේ එක්සත් ජනපද ඩොලරය ජාත්‍යන්තර වෙළඳාම සඳහා භාවිතා කළහොත් සහ එය සංචිත මුදල් ඒකකයක් ලෙස පවතින්නේ නම් පමණක් බව කවුරුත් දනිති. එක්සත් ජනපද ආර්ථික සම්බාධක, තර්ජන, වෙළඳ බාධක හා තීරු බදු පැනවීම්වලින් පීඩාවට පත්වන රටවල් එක්සත් ජනපද ඩොලරය අත්හරිමින් සහ ඊට සම්බන්ධ බැංකු පද්ධතිය අත්හරිමින් ඒ ඒ රටවල් අතර ද්වීපාර්ශ්වික වෙළඳ ගනුදෙනුවලට යොමුවෙමින් තිබේ. එක්සත් ජනපදය තමන්ට අවශ්‍ය අයුරින් එක් එක් රටවල ආර්ථිකයන් හැසිරවීමට උත්සාහ දැරීම ඩොලරයෙන් ඉවත්ව යාමට බොහෝ රටවල් පොළඹවන එක් හේතුවකි. ඩොලරයේ බලපෑමෙන් මිදුනහොත් එලෙස එක්සත් ජනපදයට අවශ්‍ය අයුරින් එක් එක් රටවල ආර්ථිකයන් හැසිරවීමට අපහසු වනු ඇත.

2019 වසරේ එක්සත් ජනපදයේ දළ ජාතික නිෂ්පාදනය එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 21.1කි. එහි ණය ප්‍රමාණය ට්‍රිලියන 22කි. එනම් එක්සත් ජනපදයේ ණය ප්‍රමාණය එහි දළ ජාතික නිෂ්පාදිතයෙන් 105%කි. තවද එක්සත් ජනපදයේ මුදල් නොගෙවූ වගකීම් ප්‍රමාණය (Unfunded liabilities) එරට දළ ජාතික නිෂ්පාදිතය මෙන් දස ගුණයකි. මෙම ණය කිසියම් මොහොතකදී කඩා වැටුණහොත් ඉන් ඇති කරනු ලබන දාම ප්‍රතික්‍රියාව විසින් ඩොලරය මත යැපෙන සමස්ත ආර්ථික පද්ධතියම කඩා වැට්ටවීමට ඉඩ තිබේ. බොහෝ රටවල් මෙම අනතුර පිළිබඳ අවබෝධයක සිටින අතර, ඒ නිසාම ඩොලරය මත රඳා නොපවතින ගනුදෙනු ක්‍රමයකට පිවිසීමට කැමැත්තෙන් සිටී. මේ නිසා එකී රටවල් ඩොලර් මත නොයැපෙන යුවාන්, රූබල් හෝ වෙනත් එවැනි මුදල් ඒකකයන්ට (යුරෝ මීට අයත් නොවේ) මාරුවීම පිළිබඳ සලකා බලමින් සිටී.

සම්බාධක මගහැරවීම සඳහා චීනය, ඉරානය, රුසියාව හා වෙනිසියුලාව දැනටමත් අන්තර්ජාල මුදල් ඒකකයක් වන ක්‍රිප්ටෝ කරන්සි, සිය වෙළඳ ගනුදෙනුවලදී භාවිතා කිරීමට පටන්ගෙන තිබේ. ඉදිරියේදී ඉන්දියාවද මෙම ක්‍රියාවලියට එක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව චීනය, රුසියාව, ඉරානය, පකිස්ථානය, ඉන්දියාව හා බොහෝ මධ්‍යම ආසියානු රටවල් එක්වී ගොඩනගාගත් ෂැංහයි සහයෝගීතා සංවිධානයේ රටවල්ද ඩොලරය භාවිතයෙන් ඉවත්වීමට අවශ්‍ය කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. එක්සත් ජනපදයේ මූල්‍යමය ආධිපත්‍යය සහ සම්බාධකවලට එරෙහිවීම සඳහා රාජ්‍ය පාලනය යටතේ මෙහෙයවන මෙම අන්තර්ජාල මුදල් අතිශය වැදගත් වනු ඇතැයි සැලකේ.

මීට අමතරව ඉන්දියාව මේ වන විටත් ඉරානය සමග භාණ්ඩ හුවමාරුව පටන්ගෙන ඇත. ඉන්දියානු තේ සහ ඉරාන බොරතෙල් මේ අයුරින් හුවමාරු කෙරෙන අතර ඒ සඳහා භාණ්ඩ හුවමාරු බැංකු පිහිටුවා ඇත. මෙම බැංකුවලදී එකවිට ඉන්දීය රුපියල්වලින් සහ ඉරාන රියාල්වලින් ගනුදෙනු කළ හැකි වේ. මේ ආකාරයේ වෙළඳ ගනුදෙනුවලදී එක්සත් ජනපද සම්බාධක මගහැර යා හැකි අතර, ඒවාට එක්සත් ජනපද බැංකුවලට හෝ භාණ්ඩාගාරයට මැදිහත්වීමට නොහැකිය.

එක්සත් ජනපද සම්බාධක මධ්‍යයේ වුවද රුසියාව තුළ ජර්මන් ආයෝජන ඉහළම මට්ටමකට ළඟා වී ඇත. රුසියානු හා ජර්මානු වාණිජ මණ්ඩල තොරතුරුවලට අනුව රුසියාව තුළ සිදුකෙරී ඇති ආයෝජනවලින් 33%ක් ජර්මානු ආයෝජන වේ. රුසියානු විරෝධී බටහිර බලපෑම් හමුවේ වුවද 2018 වසරේදී රුසියානු-ජර්මානු වෙළඳාම 8.4%කින් ඉහළ ගොස් තිබේ. මීට අමතරව එක්සත් ජනපද විරෝධය නොතකමින් 'උතුරු ධාරාව 2' නම් වූ ස්වභාවික ගෑස් නළ මාර්ගය රුසියාව හා ජර්මනිය එක්වී ගොඩනගමින් සිටී. එහි කටයුතු 2019 වසරේ අවසානයට පෙර අවසන් කිරීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තු වේ. එසේ වුවහොත් යුරෝපයට අවශ්‍ය ස්වභාවික වායු එකී නළ මාර්ගය හරහා සැපයිය හැකිවේ. එවිට යුරෝපය තවදුරටත් එක්සත් ජනපද ස්වභාවික වායු මත යැපීමට අවශ්‍ය නොවේ.

චීනය සමග වන ජනාධිපති ට්‍රම්ප්ගේ වෙළඳ යුද්ධයද අවසානාත්මක වශයෙන් ඩොලරය දුර්වල කරන ක්‍රියාවක් බවට පත්ව තිබේ. මේ නිසා චීනය වෙනත් වෙළඳ ගනුදෙනුකරුවන් සොයා යන අතර, (දැනටමත් එවැන්නන් සොයාගෙන ඇත.) බොහෝ ආසියානු, පැසිෆික් හා යුරෝපා කලාපවල ගනුදෙනුකරුවන් චීනය සමග ඩොලරයට පිටතින් ගනුදෙනු කිරීම ආරම්භ කර ඇත. ඔවුන් දැනටමත් එක්සත් ජනපද බැංකු පද්ධතිය සහ swift හුවමාරු ක්‍රමය මගහැර චීන ජාත්‍යන්තර ගෙවීම් පද්ධතිය (CIPS - The Cross-Border Interbank Payment System) සමග ගනුදෙනු කරන්නට පටන්ගෙන තිබේ. එසේම චීන ජාත්‍යන්තර ගෙවීම් පද්ධතිය මේ වනවිට ලෝකයේ ඕනෑම ගනුදෙනුකරුවෙකු සඳහා විවෘත කර ඇත. එක්සත් ජනපදයේ මෙකී වෙළඳ යුද්ධය විසින් යුවාන් මුදල් ඒකකය ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඉහළට ඔසවා ඇති අතර, එය විශ්වාසදායක සංචිත මුදල් ඒකකයක් බවටද පත්කර තිබේ. පසුගිය අවුරුදු 20ක කාලය තුළදී ජාත්‍යන්තර සංචිත තුළ ඩොලරය මුල්කරගත් වටිනාකම් 90% සිට 60% දක්වා පහළ බැස තිබේ. ඩොලර් සංචිත වේගයෙන් යුවාන් සංචිත බවට හා රන් සංචිත බවට හැරෙමින් තිබේ.

එක්සත් ජනපද ආර්ථික ආධිපත්‍යය ජාත්‍යන්තර පරිමාණයෙන් දුර්වල කිරීමට මෙකී ඩොලර් හරණය බලපායි. එවිට ලෝකය තුළ එක්සත් ජනපදයේ දේශපාලන ආධිපත්‍යයද ඊට සමානුපාතික ලෙස දුර්වල කෙරෙනු ඇත. එය ලෝකයේ අධිරාජ්‍ය විරෝධී අරගලයටත් ලෝක වමේ ව්‍යාපාරයටත් වාසිදායක තත්වයන් ඇතිකරනු නිසැකය.

## ලෝකයේ කුසගින්න නැවතත් ඉහළට



2019 වසරේ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ තත්ව වාර්තාවට අනුව ලෝකයේ කුසගින්නෙන් සිටින ප්‍රමාණය නිරපේක්ෂ ලෙස ඉහළ ගොස් තිබේ. 2018 වසර තුළ ලෝක ජනතාවගෙන් මිලියන 820ක් කුසගින්නෙන් ගතකර තිබේ. දශක ගණනාවක් පුරා මෙම සංඛ්‍යාව අඩුවෙමින් පැවතියද 2015න් පසු එය නැවත ඉහළ යමින් තිබෙන බව මෙම වාර්තාව මගින් හෙළිකර තිබේ. 2015 වසරේදී කුසගින්නෙන් සිටි සංඛ්‍යාව මිලියන 785.4ක් වූ අතර, 2016 වසරේදී එය මිලියන 796.5ක්ද 2017 දී මිලියන 811.7ක්ද වී ඇත.

ආසියානු මහාද්වීපය තුළ ඌන පෝෂණය වැඩිම කලාපය ලෙස වාර්තාවී ඇත්තේ දකුණු ආසියානු කලාපයයි. එහි ඌණ පෝෂිත ප්‍රතිශතය 14.7%කි.

ලෝකය තුළ කුසගින්න ඉහළ යන අතරම ස්ථුලතාවද එලෙසම ඉහළ යන බව මෙම වාර්තාව මගින් පෙන්වාදී තිබේ. ඊට අනුව ස්ථුලතාව හේතුවෙන් මිලියන 04ක ජනතාවක් මියගොස් තිබේ.

## තුර්කි-රුසියානු මිත්‍රත්වය නංවන මිසයිල ආරක්ෂණ පද්ධති



රුසියාව තුර්කියට ෆ - 400 මිසයිල ආරක්ෂණ පද්ධතිය ප්‍රවාහනය අවසන් කරනු ලැබ තිබේ. ජූලි 12වැනි දින සිට මේ දක්වා විශේෂ ගුවන් ගමන් 30ක් පමණ මේ සඳහා සිදුකර ඇත. මෙම මිසයිල ආරක්ෂණ පද්ධතිය ලබාදෙනු ලබන්නේ 2017 වසරේදී එක්සත් ජනපද ඩොලර් බිලියන 2.5ක් වටිනා මිසයිල පද්ධති දෙකක් ලබාගැනීම වෙනුවෙන් දෙරට අත්සන් කළ ගිවිසුම අනුවය. මෙම මිසයිල ආරක්ෂණ පද්ධතිය ලබාදීම මගින් තුර්කි ගුවන් ආරක්ෂණ පද්ධතිය ශක්තිමත් වනවාට අමතරව දෙරට අතර ද්වීපාර්ශ්වික සහයෝගීතාවයද ශක්තිමත් වනු ඇතැයි බලාපොරොත්තු වේ. තුර්කියේ මෙම ක්‍රියාමාර්ගයට එක්සත් ජනපදය විසින් විරෝධය පළ කරන ලද අතර එක්සත් ජනපදය හා තුර්කිය අතර ඇති ෑ - 35 වැඩසටහන නවතා දැමීමටද එක්සත් ජනපදය කටයුතු කරමින් සිටියි. තුර්කිය එක්සත් ජනපදයෙන් ෑ - 35 ප්‍රහාරක ගුවන් යානා 100ක් පමණ ඇණවුම් කර තිබේ.

## ජාත්‍යන්තරකරණය වී ඇති යේමන යුද්ධය



එක්සත් ජනපද කොංග්‍රසය විසින් සෞදි අරාබියට සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට සිදුකෙරෙන එක්සත් ජනපද අවි වෙළඳාම තහනම් කළේ ඔවුන් යේමන යුද්ධයේදී සිදුකරන මානව හිමිකම් උල්ලංඝනයට ප්‍රතිචාරයක් ලෙසය. ඒ සඳහා අනුමත කරගත් පනත් 03ක් එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සිය නිෂේධ බලය යොදවා අවලංගු කර තිබේ. මේ නිසා එක්සත් ජනපද ඩොලර් බිලියන 08ක් වටිනා අවි ආයුධ එකී රටවලට යැවීමට හැකියාව ලැබේ.

දැනට යේමනයේ සිදුවන ජාත්‍යන්තර යුද්ධයේදී අන්ඩාර් අල්ලාහ්ට (එනම් හුති හමුදාවට) එරෙහිව සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ගෙනයන යුද්ධයට එක්සත් ජනපදය, ප්‍රංශය හා බ්‍රිතාන්‍යය සහාය ලබාදෙයි. වසර 04ක් තිස්සේ පැවතෙන මෙම යුද්ධයෙන් මේ වනවිට සාමාන්‍ය පුරවැසියන් 17000කට අධික පිරිසක් මියගොස් මිලියන 03ක ජනතාවක් අවතැන් වී ඇත. මිලියන 24ක ජනතාවකට ජාත්‍යන්තර ආධාර මත යැපීමට සිදුව තිබේ.

ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවල දැඩි බලපෑම හේතුවෙන් එක්සත් ජනපද කොංග්‍රසය මීට මාසයකට ඉහත දී මෙම තහනම පැනවීමට සිදුවිය. මෙම තහනම නොතකා කටයුතු කිරීමට හේතු වශයෙන් ඩොනල්ඩ් ට්‍රම්ප් පැවසුවේ මෙකී ආයුධ වෙළඳාම එක්සත් ජනපදයේ රැකියා දහස් ගණනක් සුරක්ෂිත කරන අතර මැදපෙරදිග කලාපය තුළ එක්සත් ජනපද වුවමනාවන් ආරක්ෂා කරවන බවයි.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2019 ජූලි 09

# ජනතා බදු මුදල් නාස්ති නොකිරීම ආණ්ඩුවේ වගකීමයි

(මහාමාර්ග සංවර්ධන පරිපූරක මුදල පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා

විශේෂයෙන් මේ රටේ ජනතාවගේ බදු මුදල් ඒ ජනතාවගේ වුවමනාව සඳහා වෙන් කරන්නේ කොහොමද කියන එක තමයි මහා මාර්ග සංවර්ධනය පිළිබඳව අද අපි කරන මේ සාකච්ඡාවේදීත් අපට කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මධ්‍යම අධිවේගී මාර්ගය කොටස් තුනක් යටතේ නුවර දක්වා ඉදි කරන්න නියමිතයි. කඩවත සිට මීරිගම දක්වා වන පළමුවෙනි කොටස ඉදිකරන්න නියමිත වෙලා තිබෙන්නේ චීන සමාගමකින්. හැබැයි, තවම එහි සියයට 5ක්වත් ඉදිකිරීම් අවසන් කර නැහැ. ඊළඟට තිබෙන මීරිගම සිට කුරුණෑගල දක්වා වූ කොටස දේශීය සමාගම් විසින් තමයි ඉදි කළේ. ඒහි සියයට 85ක් පමණ වැඩ අවසන් කර තිබෙනවා. ඒ දේශීය සමාගම්වලට ගරුත්වයක් හැටියට මම කියන්න ඕනෑ, දේශීය සමාගම් විසින් අධිවේගී මාර්ගයේ මේ කොටසට දක්වන ලද දායකත්වය නිසාම අපේ රටේ සමාගම් 15කට පමණ ජාත්‍යන්තර ටෙන්ඩර්වලට ඇතුළත් වන්නටත් අවස්ථාව ලැබී තිබෙන බව. ඒක අපි අගය කරන්නට ඕනෑ. ඒ වාගේම මෙහි තුන්වන කොටස හැටියට පොතුහැර සිට ගලගෙදර දක්වා අධිවේගී මාර්ගය ඉදිවෙනවා. මේ කොටසේ ඉදිකිරීම් කරන්න නියමිත වෙලා තිබෙන්නේ ජපන් සමාගමකට.

මේ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමේ ඉඳලාම විශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා. 2016 මැයි 25 වෙනි දා ජපන් තානාපතිවරයා වෙනුවෙන් එහි නියෝජ්‍ය රාජ්‍යතාන්ත්‍රික නිලධාරියෙක් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට නැත්නම් මාර්ග සංවර්ධන අධිකාරියට එවන ලද ලිපියකින් කියැවෙන්නේ මේ අධිවේගී මාර්ගය සඳහා ජපන් රජය සහනදායි ණයක් දෙන්න සූදානම් කර තිබෙනවා කියලා. ඒ අනුව, සහනදායී ණයක් ඒ අය දෙනවා. ඒ වගේම මේ අධිවේගී මාර්ගයේ තුන්වන කොටස ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවනුත් ජපන් රජය ලබාදෙනවා. උපදේශකවරුණුත් ජපන් රජය ලබා දෙනවා. ඒ අනුව, එම තානාපති කාර්යාලය මැදිහත් වෙලා කොන්ත්‍රාත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තුන්දෙනෙකුගේ නම් එවනවා. ඒ ඒක් නමක් තමයි, Taisei corporation අනෙක් එක, Penta Ocean Construction Company limited අනෙක් එක Wakachiku Construction Company Limited. මේ කොන්ත්‍රාත් සමාගම් පිළිබඳව සොයා බැලීමේදී ජපන් තානාපති කාර්යාලය එහෙම නැත්නම්, ජපන් රජය එවපු



කොන්ත්‍රාත් සමාගම්වලින් ඒ තායිසේ සමාගමට විතරයි මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් පළපුරුද්දක් තිබෙන්නේ. මේ Penta Ocean Construction Private limited. කියන නම කියවෙන හැටියෙන්ම ඔබතුමියට තේරෙනවා ඇති, මේ Penta Ocean කියන්නේ නැව් සමාගමක් බව. ඒගොල්ලන්ට තිබෙන්නේ නැව් සෑදීමේ අත්දැකීම්. ඊළඟට මේ Wakachiku Construction Private Limited කියන සමාගම දන්නේ පාලම් හදන්නයි. එහෙම සමාගම් කිහිපයක් තමයි ජපන් ආණ්ඩුව විසින් මේ රජයට නිර්දේශ කරන්නේ. ඒ වගේම එහි උපදේශකත්වය සඳහාත් ජපන් ආණ්ඩුවම Nippon Koei Company Limited, Oriental Consultants Company Limited, Katahira and Engineers International private Limited කියන ආයතන තුන ලංකාවට එනවා.

මේ ක්‍රියාවලිය මෙහෙම සිද්ධ වෙද්දී මේ ආණ්ඩුව පත් වුණාට පසුව කැබිනට් මණ්ඩලයට උඩින් අති විශේෂ කාරක සභාවක් හැදුවා නේ. කැබිනට් අනු කමිටුව කියලා. කැබිනට් මණ්ඩලයට එන්න කලින් ඒ සියලු දේවල් ඒ කැබිනට් අනු කමිටුවෙන් අනුමත කරනවා. ඒ වගේම තමයි මේ ව්‍යාපෘතියත්. මොකද,

ව්‍යාපෘතිය ඒ විධියට අනුමත කරලා, කැබිනට් මණ්ඩලයත් අත ඉස්සුවාට පස්සේ නැවතත් ජපන් රජය කියනවා, මේ සඳහා හයිසෙයි සමාගම විතරක් නොවෙයි, තවත් සමාගමක් යෝජනා කරන්න අවශ්‍යයි කියලා. ඒ ගොල්ලන් යෝජනා කරනවා, ෆුජිටා කියන තව සමාගමක්. ඒ සමාගමත් මේ වැඩේට සම්බන්ධ කරගෙන joint venture එකක් ගහලා, නැත්නම් consortium එකක් හැටියට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න කියලා කියනවා. මේ ෆුජිටා කියන සමාගම ගත්තොත්, ඔවුන් චීනයේ කරපු ව්‍යාපෘතියක් පිළිබඳ තොරතුරු මා ළඟ තිබෙනවා, එම චීන ව්‍යාපෘතියේදී ෆුජිටා සමාගම විසින් හෙබෙයි ප්‍රාන්තයේ මාර්ග ඉදිකිරීමක් සඳහා යොදවපු කම්කරුවන් හතර දෙනෙක් චීන ආණ්ඩුවෙන් පිටුවහල් කරනවා, චීන රජයේ ඔත්තු බැලූවාය කියලා. චීන රටේ ඔත්තු බලන්න ඒ ජපන් කම්කරුවන් යෙදෙව්වා කියලා ඔවුන් පිටුවහල් කරනවා. ඉතින් එහෙම ඉතිහාසයක් තියෙන අය තමයි ජපන් තානාපති කාර්යාලය හරහා අපටත් එවන්නේ. එහෙම එව්වාට පස්සේ වැඩ පටන් ගන්න කොට නම් පටන් ගන්නේ මේ ව්‍යාපෘතිය සහනදායී ණය ක්‍රමයක් යටතේ කරනවා කියලායි. හැබැයි, මොකද වෙන්නේ? 2016 ඉඳන් 2017ට එනකොට ඒක සහන ණයක් නොවෙයි, වාණිජ ණයක් බවට පත් වෙනවා. ඒ නිසා මේ ලබා දෙන ණය මුදලේ අපේ පොලිය හා වාරිකය කීයද කියලා කවුරු හරි ඇමතිවරයෙක් උත්තර දෙනවා නම් මම කැමැතියි. මා දන්නා හැටියට සීයට 2.7කට වඩා වැඩි පොලි වාරිකයක් අපට ගෙවන්න සිද්ධ වෙනවා, මේ

> මෙම ව්‍යාපෘතියට රුපියල් බිලියන 136ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. හැබැයි, ඒක වසර 3ක් ප්‍රමාදවීම නිසා තවත් සියයට 10ක පමණ මුදලක් අපි variationsj,g ගෙවන්න ඕනෑ. එතකොට මුළු මුදල රුපියල් බිලියන 150ක් විතර වෙනවා. නමුත්, අද මේ ව්‍යාපෘතිය ජපන් සමාගම් අතර ටෙන්ඩර් කළොත්, රුපියල් බිලියන 100කින් විතර මෙම ව්‍යාපෘතිය කරගන්න පුළුවන්. ඒ කියන්නේ, මේ රටේ ජනතාවගේ මුදල් රුපියල් බිලියන 50ක් විතර අපේ භාණ්ඩාගාරයේ ඉතිරි වෙනවා.

ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් අනු කමිටුව - CCEM - එකෙන් අනුමත කරලා තමයි මේවා කැබිනට් එකට එවන්නේ. එතකොට කැබිනට් එක පඹයා වාගේ අත උස්සන එක තමයි ඒ කාලයේ සිද්ධ වුණේ. මේ ණය වෙනුවෙන්. ඒ නිසා එක් සහනදායි ණයක් නොවෙයි.

ඊළඟට, ඉදිකිරීම් ගිවිසුම අත්සන් කරන්නට ඕනෑ. හැබැයි, ආණ්ඩුවට ලොකු කලබලයක් තියෙනවා.

15 වැනි පිටුවට

2019 ජූලි 11

# ජනවරමට එකඟ පාර්ලිමේන්තුවක් හදන්න ජනතාවට අවස්ථාව දිය යුතුයි!

(ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාව පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

2015 අගෝස්තු 16වැනි දින අනුර යාපා මන්ත්‍රීතුමා, ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා, තව ගොඩක් අය - මම ඒ ලැයිස්තුව කියන්න යන්නේ නැහැ - එකතු වෙලා ආණ්ඩුවක් හැදුවා. ඒ බව මේ රටේ ජනතාව දන්නවා. ඊට පසුව 2018 ඔක්තෝබර් 26වැනිදා මොකද කළේ? තව කණ්ඩායමක්, එක්සත් ජාතික පක්ෂයේ කට්ටියක් එකතු වෙලා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවක් හැදුවා. එතකොට රනිල් වික්‍රමසිංහ මහත්මයාට ආණ්ඩුවක් හදන්න උදවු කළේ, බුලත් කොළෙන් ඡන්දය ගත්ත කට්ටියයි; එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය ගත්ත කට්ටියයි; අපි නොවෙයි. නැවතත් මහින්ද රාජපක්ෂ මහත්මයාට ආණ්ඩුවක් හදන්න ඔක්තෝබර් 26වන දින එක්සත් ජාතික පක්ෂයෙන් ආපු කීපදෙනෙක් මේ පැත්තෙන් වාඩි වෙලා උදවු කළා. ඒ අපි නොවෙයි. එතකොට ආණ්ඩුවට උදවු කළේ කවුද? අපි අහනවා, ඒ අපි ද කියලා. ඒ නිසා වැරැදි තැන්වල වාඩි වෙලා කථා කරන්න එපා. මේවා දේව වාක්‍ය වාගේ. විපක්ෂයේ මන්ත්‍රීවරු විශ්වාසභංගය ගැන කථා කරනකොට හැම තිස්සේම පටන් ගන්නේ කොතැනින්ද? ජනතා විමුක්ති පෙරමුණට ගහගෙන; ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුව රකිනවා කියාගෙන. හැබැයි, ඒ දේව වාක්‍ය එතුමන්ලාටයි අදාළ. මොකද, මෙච්චර කල් එතුමන්ලා තමයි ආණ්ඩුව රැකලා තිබෙන්නේ. අයවැය විවාදයේදීත් එහෙමයි.

රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව ගෙනාපු විශ්වාසභංග යෝජනාවේදී 76දෙනයි හිටියේ. පාර්ලිමේන්තුවට 95 දෙනෙක් ඇවිත්, 76දෙනයි හිටියේ. එයින් හයදෙනෙක් අපි. මෙතුමන්ලාගේ 70දෙනයි. හැබැයි, අපට මෙතුමන්ලා කිවුවේ නැහැ, "අපි රනිල් වික්‍රමසිංහ මහත්තයාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙනවා. ඔයගොල්ලන් එන්න. අපේ 95 දෙනාම එනවා. අපි ඔක්කෝම එකතු වෙලා ඒ ගැන කටයුතු කරමු" කියලා. එහෙම කථා කර ගත්තේ නැහැ. කථා කරගන්න දෙයක් එතැන තිබුණේ නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයාට විරුද්ධව විශ්වාසභංග ගෙනෙනකොට, ආයෙත් අපෙන් අහන්න දෙයක් තිබෙනවාද? අපි දන්නවා කරන්න ඕනෑ දේ. අපි විශ්වාසභංග යෝජනාවක් ගෙනාවාම ඒක සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ලියලා තිබෙනවා. භාෂාව තේරෙනවා නම්, අකුරු කියවන්න පුළුවන් නම් ඒක

තේරුම් ගන්න පුළුවන්. අනුර දිසානායක මන්ත්‍රීතුමා ඊයේ පැයක් විතර කියපු ටික අහගෙන හිටියා නම්, මේ විශ්වාසභංග යෝජනාව ගෙනැත් තිබෙන්නේ මොකටද කියලා නොතේරෙන කෙනෙකුට වුණත් තේරෙනවා. එතකොට ආයෙත් අමුතුවෙන් කතා කරන්න දෙයක් නැහැ. එතුමන්ලා මේ විශ්වාසභංග යෝජනාවට සහය දෙනවා නම් දෙගිඩියාවකින් තොරව සහය දෙන්න පුළුවන්. අපට විපක්ෂ නායකතුමාගෙන්, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් එක ඉල්ලීමයි කරන්න තිබෙන්නේ. දැන් ඔබතුමන්ලාට පක්ෂව මන්ත්‍රීවරුන් 97 දෙනෙක් ඉන්නවා. ඔක්තෝබර් 26 වෙනිදා ඒ කුමන්ත්‍රණය කරපු වෙලාවේ එකතු කර ගත්ත අයත් එක්ක විපක්ෂයේ මන්ත්‍රීවරු 91දෙනෙක් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයෙන් ගත්ත 5 දෙනෙක් ඉන්නවා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමෙක් ඉන්නවා. අන්න ඒ 97 දෙනා අද හවසට ගෙන්වන්න. ඒ වගකීම තිබෙන්නේ අපි හයදෙනාට නොවෙයි නේ. දැන් ඒක තමයි විපක්ෂ නායකතුමාට තිබෙන අභියෝගය සහ වගකීම.

මට ආණ්ඩුවටත් කියන්න දෙයක් තිබෙනවා. දැන්



පථයට ගැළපෙන්නේ නැහැයි කියලා කථානායකතුමා ඒ කොටස ඉවත් කරනවා. මොකද හේතුව, මෙතැනදී ගෙනෙන්න ඕනෑ විශ්වාසභංග යෝජනාවක් නොවෙයි, දෝෂාභියෝග යක්. ඒ දෝෂාභියෝගය ගෙනෙන්න අපි හයදෙනාට බැහැ. ඒකට 75දෙනෙක් ඕනෑ. මේ විශ්වාසභංග යෝජනාව කරුණු අනුව හරි කියලා දැන් ඔබතුමන්ලා පිළිගන්නවා නම් මම කියනවා දෝෂාභියෝගයත් ගෙනෙන්න කියලා. ඒ දෝෂාභියෝගය ගෙන්න පාර්ලිමේන්තුවේ මේ පැත්තේ 97 දෙනෙක් ඉන්නවා. අනෙක් පැත්තෙත් ඉන්නවා 106දෙනෙක්. ඒ දෙගොල්ලන්ටම එකතු වෙලා ඒක ගෙනෙන්න පුළුවන්. දෝෂාභියෝගයක් ගේනෙන කොට අපි ඒකට මොකද කරන්නේ කියන එක

> ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඉල්ලා සිටින්නේ මෙයයි. මුස්ලිම් ජනතාව රට පැත්තට - ශ්‍රී ලංකාව පැත්තට- දිනා ගැනීම වෙනුවෙන් කළ යුතු හැම දේම කළේ නැත්නම් මේ අන්තවාදය බෝවෙනවා; ව්‍යාප්ත වෙනවා; මුළු රටම විනාශයට පත් වෙනවා. ඒක තමයි අපි පසුගිය දවස්වල දැක්කේ. ජනාධිපතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, අගමැතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, රාජපක්ෂ මහත්මයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන් තමයි කටයුතු කළේ.

ආණ්ඩුවෙන් කියනවා, මේ විශ්වාසභංග යෝජනාවට ආරක්ෂක ඇමතිතුමාත් ඇතුළත් කරලා ගෙනාවේ නැත්තේ මොකද කියලා. ඒ කියන්නේ මේ විශ්වාසභංග යෝජනාවේ කරුණු ටික ඔබතුමන්ලා පිළිඅරගෙන ඉවරයි කියන එක. විශ්වාසභංග යෝජනාවේ කරුණු අනුව ආණ්ඩුවම කියන්නේ, " විශ්වාසය භංග වෙච්ච එක හරි. මේ ප්‍රහාරයට වග කියන්න ඕනෑ ආණ්ඩුවමයි. හැබැයි, අපි විතරක් නොවෙයි, අරයාත් ඉන්නවා. ඒ හාමුදුරුවන්ටත් බෙදන්න" කියලා. හැබැයි, අපි ඒක නොදැන නොවෙයි, එයා ඇතුල් නොකළේ. අපි එතුමාත් ඇතුලත් කරලා ගෙනාවා නම් මේ විශ්වාසභංග යෝජනාවේ විෂය ගැන අපට විවාද ඕනෑ නැහැ. ඒ ගැන අපෙන් අහන්න එන්න ඕනැත් නැහැ. අපට ඒකට සහාය දෙන්න පුළුවන්. ආණ්ඩුවේ හර්ෂ ද සිල්වා මැතිතුමා කිවුවා, "මේ විශ්වාසභංග යෝජනාව අපි ආණ්ඩුවක් හැටියට පරද්දන්න කටයුතු කළාට, අඩංගු මේ කරුණුවලට එකඟයි" කියලා. එතුමා කියපු දේම තමයි සමහර අය කියන්නේ. "ඇයි, අපට විතරක් ගෙනෙන්නේ, ජනාධිපතිතුමාත් ඇතුළත් කරලා ගෙනෙන්න" කියලායි කියන්නේ. එහෙම කියන කොටම විශ්වාසභංග යෝජනාවේ තිබෙන කරුණු අනුව, මේ ආණ්ඩුව කෙරෙහි ත ි බ ු ණ ු වි ශ ් ව ා ස ය

15 වැනි පිටුවට

කවුළුව හැරම් තබමි

# හෙට දිනන ලොව තනන තැන




මානව ඉතිහාසය පුරාම ලෝකය වෙනස් කළේ සහ අලුත් කළේ පැවති ප්‍රතිගාමී සම්මතයන්ට එරෙහිව සටන් කළ මිනිසුන්ය. ඔවුහු සමාජයට සාපේක්ෂව ඉතා සුළු පිරිසක් වූහ. එහෙත් හොඳින් සංවිධානය වූ දැනුවත් සුළු පිරිසක් වූ ඔවුහු පසුව මහා ජන බලවේගයක්ව සමාජය අලුත් මාවතකට තල්ලු කර දැමිය හැකි බව ප්‍රායෝගිකව ඔප්පු කළෝය.

අද ලාංකේය සමාජය මුහුණදී ඇති අභියෝගය වන්නේද පුරා 71 වසරක් මෙරට කාබාසිනියා කළ, ජරාජීර්ණ කළ, මේ දුගඳ හමන ධනේශ්වර පාලන ක්‍රමය වෙනස් කිරීමය. එහිදී ඒ තුළ තිබෙන වැඩවසම්වාදී කුණුකන්දල්වල ප්‍රතිවිරෝධයන්ට මුහුණ දීමට ඊට නායකත්වය දරන බලවේගයට අනිවාර්යයෙන් සිදුවන්නේය.

පසුගිය ජූලි 14 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී 'හෙට පිණිස අද' 'ජාතික ජන බලවේගය' යන නාමය යටතේ එවන් බලවේගයක් සිය පළමු පියවර තැබීය. ඒ ලාංකේය සමාජ ඉතිහාසයේ ප්‍රථම වතාවටය.

විද්වතුන්, කලාකරුවන් ඇතුළු සමාජයේ සියලු පැතිකඩ නියෝජනය කරමින් මේ කුණු වී ඇති සමාජ ආර්ථික, දේශපාලන, සංස්කෘතික බල රටාව වෙනස්කොට අලුත් නැවුම් ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා ප්‍රබල වැඩපිළිවෙළක්ද එහිදී ඉදිරිපත් කෙරිණි.

මෙවැනි අලුත් වැඩපිළිවෙළකට අතගැසූ හැම විටම ප්‍රතිගාමී බලවේග ඊට එරෙහිව විවිධ අවලාද, බෙගල් ඇදබෑම සාමාන්‍ය සිරිතය. මෙය සර්ව සම්පූර්ණ ව්‍යායාමයක් බව කීමට තරම් අපි හදිසි නොවෙමු. එහෙත් අඩුපාඩු පරාජය කරගෙන ඉදිරියට යා හැකි පිරිසක් ඊට එක්ව සිටින බව නම් පැහැදිලිය. වැඩය ඔවුන් අතටම කොන්ත්‍රාත් දී බලා සිටීම රටේ පුරවැසියාගේ වගකීම නොවේ. වැඩය යථාර්ථයක් කිරීම සඳහා දායකවීම රටේ පුරවැසියන්ගේද අත්හළ නොහැකි වගකීම වන්නේය.

# ආධ්‍යාත්මික අබ්බගාතයෝ



සිය ඉරණම අද්භූත බලවේගවලට භාරදී දේවල් යැදීම මිත්‍යාවෙන් අන්ධ වූ ආධ්‍යාත්මික අබ්බගාතයන්ගේ සිරිතය. අපේ රටේ පාලකයෝද එවැන්නෝය. එවන් පාලකයන් සිටින රටකට අත්වන්නේද අබ්බගාත වූ ආර්ථිකයකි; දේශපාලනයකි; සමාජයකි; සංස්කෘතියකි.

මේ දිනවල අපේ රටේ පාලකයෝ එකා පසුපස එකා පෙළ ගැසී ඉන්දියාවේ තිරුක්කෝවිල් වන්දනාවේ යෙදෙති. රනිල්ව පූසාරියෙකුට අන්දවා තිරුක්කෝවිල් දෙවියන් යදිනු මේ දිනවල මාධ්‍යවල අපට දැකගත හැක. වරෙක මහින්දද වරෙක මෛත්‍රීද තව තව දේශපාලුවන්ද දැන් තිරුක්කෝවිල් වන්දනාවේ යෙදෙති. ඒ ඊළඟ ජනාධිපතිවරණ සිහිනය සැබෑ කර ගැනීමේ ඒකායන අරමුණෙනි. වෙන විදියකට කිව්වොත් බලය සඳහා දෙවියන් යැදීමය. දැන් ලංකාවේ දෙවිවරු ඊට ප්‍රමාණවත් නැත. ඒ නිසා දැන් ඔවුන් පතන්නේ ඉන්දීය දෙවියන්ගේ පිහිටය.

මෙවන් ජනතාද්‍රෝහී දේශපාලන ප්‍රභූවරුන්ගේ ඉල්ලීම් ඉටුකරන දෙවියෙක් වෙත්නම් ඒකාටද හෙණ වැදිය යුතු බව අපේ මිත්‍රයකු ලඟදී අප සමග පවසා සිටියේය.

නවීන තාක්‍ෂණයෙන් රට දියුණු කිරීමට 'වයි ෆයි' කලාප ගැන කථා කරන රනිල්, නව ලිබරල්වාදී රනිල් තනිකරම ගෝත්‍රිකයකු බව දැන් ඔප්පු වී හමාරය. පූර්ව ගෝත්‍රිකයන් හඹා ගියේ ආහාරය පිණිස දඩයමක් පසුපසය. මේ ගෝත්‍රිකයන් හඹා යන්නේ බලය පසුපසය. එනම් රටම දඩයම් කිරීමටය. එකම වෙනස එයය. නොපෙනෙන නොසිටින බොරු බලවේගවලට තම ඉරණම භාරදීමට තරම් නිවට නියාලු, දින පාලකයන් සිටින රටක නැවත නැවතත් තම ඉරණම විසඳීමට මෙරට ජනයා ඔවුන්ටම බලය දෙන්නේ නම් ඒ රටේ ජනයාට අපට කීමට ඇත්තේ 'අබ සරණයි' කියාය. රටට සැබැවින්ම 'දෙවියන්' බලනු ඇත්තේ මේ අධ්‍යාත්මික අබ්බගාත පාලකයන් සදහටම මෙරටින් තුරන් කළදාටය.

# අලුගෝසුවෝ සහ පුරවැසියෝ

අපේ රටේ වත්මන් ජනාධිපතිවරයා "චූන් පාන්" වැඩ කිරීමට කවදත් දක්ෂය. ඔහුගේ මේ වැඩ අතර මහත් ආන්දෝලනයකට ලක් වූ වැඩක් වන්නේ, 'එල්ලුම්ගසය. දැන් රටේ ඇතැම් මිනිසුන් බලා සිටින්නේ රටේ කුඩු කාරයන් ඇතුළු සකලවිධ අපරාධකරුවන් එක්තරා කදිම උදෑසනක එල්ලුම්ගසේ එල්ලී සිටින දසුන දැකීමේ නොඉවසුම් රිසියෙනි.

එහෙත් රටේ කියවීමක් ඇති මිනිසුන් නම් කියන්නේ පළමුව එල්ලා දැමිය යුත්තේ පුරා වසර 71ක මේ ශාපලත් දේශපාලනය තවදුරටත් ඉදිරියට ගෙනයමින් රට කන රවටන දේශපාලුවන් කියාය.

අනෙක් අතට බැලූවිට මේ පාලකයන් දැන් රටේ හැම පුරවැසියාගේ අතටම කඹයක්දී තොණ්ඩුව බෙල්ලට දමා හමාරය. බඩුමිල බර, බදු බර, දඩ පිට දඩ බර, පාලකයන්ගේ නාස්තියේ සහ දූෂණයේ බර මේ සියලු රටේ සියලු පුරවැසියන්ගේ ගෙල වටා තොණ්ඩු දමා හමාරය. දැන් ඉතිරිව ඇත්තේ තමන් කැමති විටක පුරවැසියාට සිය ගෙලේ දමා ඇති තොන්ඩුව හිරකරගෙන මියයාම පමණය. ඒ සඳහා අලුතින් අලුගෝසුවන් අවශ්‍ය නැත. රට කරවන පාලකයන් ඒ අලුගෝසුකමට හොඳම සුදුස්සෝය. සියදිවි නසා ගැනීමට සිදුවී ඇති පුරවැසියා බකං නිලා සිටියහොත් අර අලුගෝසුවන් දිගටම රජ කරනු ඇත. දැන් කළ යුත්තේ රටම එල්ලා මැරීමට කඹ අත දරා සිටින අර අලුගෝසුවන් රොත්තම දේශපාලන පෝරකයට යවා රට නව මාවතකට ගැනීමේ කාර්යයට හිතන මතන සියලු පුරවැසියන් වහ වහා පෙරමුණ ගැනීමය.



# පොලිටිකල් පංතිය

පොලිටික්ක දවස් ගාණක් නෑවිදින් ඉඳලා එක දවසක ටිකක් විතර පරක්කු වෙලා පංතියට ඇදුණා, හම් මල්ලත් බඩට හේත්තු කරගෙන. මූණත් ඇදිල ගිහින්. ඇඟත් කෙට්ටු වෙලා.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය ඉස්සර වුණා.

"වෙරි ගුඩ් මෝර්...නිං සර්" අනුරුද්දියත් දෙවෙනියට කිවුවට සෙකන්ඩ් වුණේ නෑ.

"මොකද සර් සනීප නැද්ද. නිකං හුඹහෙන් ඇදල ගත්ත වගේනෙ" කනියටත් කට තියන් ඉන්න බෑ.

"අයියෝ සර්, මේ මොකද? පාචනේද, සෙංගමාලෙදල ගලපටලෙද, මැලේරියාවද... ගොනෝරියාවද?" මංජුව දන්න දරුණු ලෙඩ ඔක්කොම කිවුව, අන්තිම ලෙඩේ ඇහුණෙ ළඟම හිටපු කීපදෙනෙකුට විතරයි.

"මට ඇති ලෙඩක් නෑ ළමයිනේ. ඔය ළමයි ලෙඩ දාන්න හදනව" පොලිටික්ක අමාරුවෙන් හිනා වෙලා කිවුව.

"වෙන්න බෑ සර්. මොකක් හරි තියෙනව. සර් සීනි චෙක් කරල බැලුවද?" කනිය ලෙඩක් දාන්නම බැලුව.

"මට ඇති සීනියක් නැහැ ළමයිනේ. මම පහුගිය දවස් ටිකේ ටිකක් හිතුව ඒකයි" පොලිටික්ක මල්ල මේසෙ දාරවලට එලයින් කළා.

"ටිකක්නම් වෙන්න බෑ. සර් නොකා නොබී හිතල තියෙනව" අනුරුද්දිය කිවුවෙ කම්මුලට අත තියාගෙන.

"හරි... මම හොයා ගත්ත සර්ට තියෙන ලෙඩේ... " මංජුව දොස්තරට ඇන්දා. "ඒකම තමයි"

"ඈ මංජු, මොකද්ද සර්ගෙ ලෙඩේ" "ඔයා දන්නවද මංජු" " මොකද්ද මංජු" හැම තැනින්ම ඉල්ලීම් ආවා. ඉල්ලුවෙ නැත්තෙ පොලිටික්ක විතරයි වගේ.

"එහෙම කියන්න බෑ" මංජුව ගණන් ඉස්සුව. "ලෙඩාගෙ විස්තර ලෙඩාගෙ අවසරේකින් තොරව තවත් කෙනෙකුට කියන එක වැරදියි. හිපොක්‍රටීස් ප්‍රතිඥාවට විරුද්ධයි" මංජුව කොලර් එක හැදුවෙ අඩු නලාව විතරයි වගේ.

"කමක් නෑ ළමයො ඕනැ දෙයක් කියන්න. මං දන්න තරමින් මට ලෙඩක් නෑ" පොලිටික්ක ඇදෙන කතාව කෙටි කරන්න හිතුව.

"සර්ට තියෙන්නෙ විචිකිච්චාව" මංජුව වෙඩිල්ල වගේ කියල දැම්ම.

"විචිකිච්චාව... විචිකිච්චාව ලෙඩක්ද?" පොලිටික්ක අවුලෙ.

"මොකක් ගැනද සර්ගෙ විචිකිච්චාව? එතකොට සර් ලෙඩ වෙන තරම් හිත හිත වද වුණේ කවුරු ගැනද?" වසන්තිය විස්සෝපෙන්.

"සර්ට හිතන්න තියෙන්නෙ උඹල ගැන නෙමෙයි වසන්තියෝ" සමන කියද්දි වසන්තිගෙ මූණ ඇඹුල් වුණා.

"එහෙනම් ඒ මොකක් ගැනද කියලත් කියනවලකො?" පොලිටික්ක සාස්තර අහන්න ආව වගේ.

"සර් මේ දවස්වල නොකා නොබී හිතන්නෙ ඊළඟ ජනාධිපතිවරණෙ ගැන... අපේක්ෂකය කවුරු දායිද කියල" සමන අත නොබලම සාස්තරේ කිවුව.

"නොකා නොබීනම් හිතුවෙ නෑ සමන්. හැබැයි මං ඒ ගැන හිතුව" පොලිටික්කගෙ තිබුණෙ වැරැද්දක් කරල අහුවුණු මූණක්.

"සර් බලන් ඉන්නව ගෝඨාභය මහත්තය ඡන්ද කොලේට එනකම්. ඒත් මහින්ද මහත්තය කියනව ඒ ගැන තවම එයා තීරණේ කරල නැහැ කියල. තැනින් තැනින් කතා එනව චමල් හරි ශිරන්ති හරි වෙන්නත් පුළුවන් කියල. අනෙක මෛත්‍රීගෙ දීගෙ හරි යන්නත් බැරි නැහැ" සමන කියද්දි පොලිටික්ක හීල්ලුව.

"ගෝටාභය මහත්තය ඡන්ද කොලේ නැත්තම් අපිනම් ඡන්දෙ දාන්න යන්නෙ නෑ" පොලිටික්ක හිත හදාගන්න හදනව.

"හැබැයි බන්දුල මහත්තය කියල තියෙන්නෙ පොල් ලෙල්ලක් දැම්මත් ඇති කියල, සර්ලගෙ ඡන්දෙ ගන්න. ඒ හින්ද කියන්න බෑ" සමන කියද්දි පොලිටික්කගෙ කට කපු ලෙල්ලක් වගේ ඇකිළුණා.

## ජාතික ජන...

05 පිටුවෙන්

***නියමුවා:- සාම්ප්‍රදායික පක්ෂ දේශපාලනය මත යැපෙන රටේ බහුතර ජනතාවකට ඔබේ පණිවිඩය මොකක්ද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** මෙතෙක් රට පාලනය කරපු එ.ජා.ප.ය සහ ශ්‍රීල.නි.ප.ය කියන දේශපාලන පක්ෂ දෙක සහමුලින්ම අසමත් වෙලා තියෙනවා. ඒ නිසා මේ දේශපාලන සංස්ථා දෙකටම උදව් කරපු ඒ හා බැඳුණු නිලධාරි වළල්ලකුත් තියෙනවා. එයටම අනුබද්ධ ව්‍යාපාරික වළල්ලකුත් තියෙනවා. එයටම අනුබද්ධ ආගමික වලල්ළකුත් තියෙනවා. එයටම අනුබද්ධ මාධ්‍ය වළල්ලකුත් තියෙනවා. මේවා අවුරුදු හතළිහක්, පනහක් තිස්සේ එ.ජා.ප. - ශ්‍රීල.නි.ප. දේශපාලන කඳවුරු දෙකත් එක්ක මේ රට මේ විනාශයට දායක වුණු සංවිධාන. ජනතාවගෙනුත් සැලකිය යුතු කොටසක් මේ අයට ඡන්දය දීලත් තියෙනවා.

නමුත් පසුගිය අවුරුදු 40ක් පුරා මතුවුණු ප්‍රධානම අදහසක් තමයි දේශපාලන සංස්ථාවට පමණක් රටේ ප්‍රශ්න විසඳන්න බැහැ කියන එක. එහි එක අන්තයකට ඇවිල්ලා තියෙනවා, දේශපාලනයට මොකුත් කරන්න බැහැ විද්වතුන්ට පමණයි කරන්න පුළුවන් කියලා. ඒකත් මම හිතනවා වැරදි අර්ථයක්. අද ජාතික ජනබලවේගය තුළ අපි සමත් වෙලා තිබෙනවා මේ රට විනාශ කරපු කඳවුරුවලට එරෙහිව සිටින දේශපාලන කණ්ඩායම්, සිවිල් පුද්ගලයන්, කලාකරුවන්, ආචාර්යවරුන්, ධීවර සමිති



නායකයන්, ගොවි සමිති නායකයන්, තව ලිංගික වශයෙන් හා විවිධ පීඩාවන්ට පත්වුණු ජන කණ්ඩායම්, කාන්තාවන් මේ වගේ සැලකිය යුතු කණ්ඩායම් රාශියක් එකතු වෙලා තිබෙනවා, රටේ අනාගතයේදී  මහජන ආණ්ඩුවක් හැදීම සඳහා එකට වැඩ කරන්න. ඒ නිසා මේ වෙලාවේ ජාතික ජන බලවේගය ලෙස රටේ දූෂිත විනාශකාරී දේශපාලන වලල්ළට එරෙහිව දේශපාලන සහ ප්‍රගතිශීලී වාමාංශික බලවේග නියෝජනය කරන ස්වාධීන අනන්‍යතාවක් සහිත කණ්ඩායම්වල මධ්‍යස්ථානයක් ගොඩනගන්න අපි සමත්වෙලා තිබෙනවා.

අපි ඉල්ලා සිටින්නේ ඔබ මෙතෙක් ඒ බලාපොරොත්තු වුණු ඒ අදූෂිත දේශපාලනයත්, රටට ආදරය කරන විද්වතාත් දේශපාලන අපේක්ෂාවෙන් තොරව සමාජය වෙනුවෙන් වැඩකරපු සිවිල් සංවිධානත් බිම් මට්ටමේ මිනිස්සු සමග වැඩ කරන ගොවි සංවිධාන, ධීවර සංවිධානත් මේ සියල්ල දැන් මහජන ආණ්ඩුවක් සඳහා එකට එකතු වී තිබෙනවා. මේක තමයි ජනතාවගේ බලාපොරොත්තුව. ඒ නිසා ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ මේ ජාතික ජන බලවේගය වටා ඒකරාශී වෙන්න කියලා.

## මඩකලපුව විශ්වවිද්‍යාලය...

16 පිටුවෙන්

අමාත්‍යාංශයන් අවසර ඉල්ලා තිබෙනවා.

මෙම බැටිකොලෝ කැම්පස් ආයතනය නීති විරෝධී ආයතනයක්. ඒ වගේම ජාතික සමගියට දැඩි බලපෑමක් එල්ල කරන ආයතනයක්. ඉඩම මිල දී ගැනීමේදී වංචා කොට තිබෙනවා. මෙම ඉඩම ලබාගැනීමේදී හීරා පදනම හේතුව ලෙස ඉදිරිපත් කරන්නේ නොමිලයේ වෘත්තීය පුහුණුව ලබාදෙන පොදු කටයුත්තක් සඳහා ඉදිකරන ආයතනයක් කියලා. නමුත් ඔවුන් ඉදිකරන්නේ මුදලට පාඨමාලා විකුණන ආයනතයක්. ඒ වගේම මහවැලි අධිකාරිය මෙම ඉඩම වෙන්කොට තිබුණේ සිද්ධපුර නගරය නම් ව්‍යාපෘතියක් සඳහායි. එම ව්‍යාපෘතිය නතර කොට තමයි මේ ඉඩම හීරා පදනමට ලබා දෙන්නේ. ඒ වගේම එවකට මහවැලි අධිකාරිය අයත් අමාත්‍යවරයා ලෙස වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් මෙම ඉඩම බැහැර කිරීමේ ක්‍රමවේදය ගැටලුසහගතයි. අද වනවිට ලබාදුන් අක්කර 35ට අමතරව අක්කර 8ක පමණ නීති විරෝධී ගොඩනැගිලි ඉදිකර තිබෙන අතර තවත් අක්කර 15ක් නීතිවිරෝධී ලෙස හෙළි පෙහෙළි කර තිබෙනවා. ඒ වගේම මෙම බැටිකොලෝ කැම්පස් ආයතනය ගොඩනැගිලි සඳහා අදාළ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගෙන නැහැ.

බැටිකොලෝ කැම්පස් ආයනය ඉදිකළ ශ්‍රී ලංකා හීරා පදනම ලියාපදිංචියේ ගැටලු තිබෙනවා. 1980 අංක 31 දරන රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ පනතට අනුව ශ්‍රී ලංකා හීරා පදනම හෝ හීරා පදනම ලියාපදිංචි කර නැහැ. ඒ වගේම මෙම ආයනයට මුදල් ලැබීම පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. සෞදි අරාබියෙන් මෙම මුදල ලැබුණේ ණයක්ද, ප්‍රදානයක්ද කියලා පැහැදිලි නැහැ. මේ සම්බන්ධයෙන් කළ විමර්ශනවලදී හිස්බුල්ලා මන්ත්‍රීවරයා මෙම මුදල ණයක් බව පිළිගත්තා. නමුත් එය ණය මුදලක් නම් බී.ඕ.අයි. ආයතනයේ අනුමැතියත් තිබිය යුතුයි. ඒ වගේම එම මුදලට අදාළ ණය ගිවිසුමක් නැහැ. ණයක් නම් ආපසු ගෙවිය යුතුයි. ඒ සඳහා ණය ලබාගැනීමේදී අනුග මනය කරන විදේශ ණය ගැනුම් ගිණුමක් ආරම්භ කොට නැහැ. මහ බැංකුවේ අවසරයක් නැහැ. ඒ නිසා මෙම ගනුදෙනුව පිළිබඳ හිස්බුල්ලාගේ ප්‍රකාශය පරස්පරයි.

හිස්බුල්ලා මන්ත්‍රීවරයා එවකට ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයෙකු හෝ රාජ්‍ය ඇමතිවරයෙකුව හිඳිමින් ආණ්ඩුව සමග ගිවිසුම් අත්සන් කිරීම ළබැඳියාවන් අතර ගැටලුවක් තිබෙනවා. ඒ වගේම මෙවැනි ආයතනවලට අවසර ලබාගත් පසුව ආයතනයේ ක්‍රියාවලිය ප්‍රශ්න කිරීමට අපේ රටේ නීති ප්‍රමාණවත් නැහැ. එනිසා මේ පදනමින් දෙමළ ඩයස්පෝරාවටත් අවශ්‍ය නම් ලංකාව තුළ දෙමළ ජාතිවාදය පෝෂණය කිරීමේ පදනමින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් ස්ථාපිත කළ හැකියි.

මෙම ආයතනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධන කාරක සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. මෙම බැටිකොලෝ කැම්පස් ආයතනයට අයත් සියලු වත්කම් රජයට පවරා ගන්නා ලෙසත් මෙම ආයතනය නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක් ලෙස පවත්වාගෙන යාමටත් නිර්දේශ ඉදිරිපත් කොට තිබෙනවා. ඒ වගේම මෙය ජාතික විශ්විද්‍යාලයක් බවට පත්කොට සහජීවනයේ විද්‍යා භූමියක් බවට පත්කළ යුතු බවට සියලු දෙනාගේ එකඟත්වයෙන් යෝජනා ඉදිරිපත් කොට තිබෙනවා.

එසේ තිබියදී රනිල් වික්‍රමසිංහ මහතා විසින් මෙම ආයතනය සම්බන්ධයෙන් කැබිනට් අනුකාරක සභාවක් පත්කොට තිබෙනවා. ඒ සඳහා මලික් සමරවික්‍රම, මංගල සමරවීර, මනෝ ගනේෂන් සහ



ලකී ජයවර්ධන සාමාජිකයින් ලෙස පත්කොට තිබෙනව. මෙම කැබිනට් අනුකාරක සභාවේ සංයුතිය අනුව බොහෝ දුරට විසඳුම විය හැක්කේ මෙම ආයතනය හිස්බුල්ලාටම පවරා දී පෞද්ගලික උපාධි ආයතනයක් ලෙස පවත්වාගෙන යෑමයි. ආයෝජකයන් අපේ රටට එන්නේ නැතිවෙයි කියලා බොරු භීතියක් හදලා බැටිකොලෝ කැම්පස් ආයතනය හිස්බුල්ලාටම පවරා දීමට තමයි මොවුන්ගේ උත්සාහය වෙලා තියෙන්නේ.

එනිසා මෙම බැටිකොලෝ කැම්පස් ආයතනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ එක්දින විවාදයක් ඉල්ලා සිටීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කොට තිබෙනවා. ඒ වගේම එම ආයතනය රජයට පවරා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඇති නීතිමය තත්වය පිළිබඳව අපි උපදෙස් ලබාගනිමින් ඉන්නවා. ඒ වගේම එම ආයතනය රජයට පවරා ගැනීම සඳහා ආණ්ඩුවට බලපෑම් කරන අරගල අපේ රටේ විශ්විවද්‍යාල ආචාර්යවරුන් සහ ශිෂ්‍ය ව්‍යාපාරය සමග එක්වී දියත් කිරීමට ජනතා විමුක්ති පෙරමුණ බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මෙම ආයතනය ඉදිකිරීම සඳහා හිස්බුල්ලා විසින් හේතුව ලෙස සඳහන් කළ නැගෙනහිර පළාතේ තරුණ තරුණියන් වෙනුවෙන් නොමිලයේ අධ්‍යාපන පාඨමාලා ලබාදෙනවා යන්න සැබෑ වුවමනාව නම් මෙය රජයට පවරා දී ඒ සඳහා අවස්ථාව උදාකර දීමට කටයුතු කරන ලෙස හිස්බුල්ලා මන්ත්‍රීවරයාට අපි කියා සිටිනවා.”

මෙම අවස්ථාවට ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයාද සහභාගි විය.

## ජනතා බදු මුදල් නාස්ති...

13 පිටුවෙන්



ආණ්ඩුවට විතරක් නොවෙයි, අගමැති කාර්යාලයට - ඊට අමතරව, ජපන් තානාපති කාර්යාලයට මේ වැඩේ ඉක්මනට කරගන්න ඉතා විශාල උනන්දුවක්, අධික උනන්දුවක් තියෙනවා. ඒ නිසා තමයි අපේ නීතිපති දෙපාර්තමේන්තුව හරහා  නිසි අනුමැතිය නොලැබී තිබියදීත් මේ සමහර එකඟතාවලට යන්නේ. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මේ හයිසෙයි සමාගමේ බලයලත් නිලධාරී වෙත ඉදිරිපත් කරන ලද Letter of Acceptance, එහෙම නැත්නම් මේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා වන ලිපිය මේ අවස්ථාවේදී මට ඉදිරිපත් කළ හැකියි. 2018 මැයි මාසයේ 04වැනිදා තමයි මේ  ලිපිය ඉදිරිපත් කරලා තියෙන්නේ. නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ අදාළ ණය ගිවිසුම සඳහා, කොන්ත්‍රාත් ගිවිසුම සඳහා නිල අනුමැතියක් නොලැබී තිබියදී කොහොමද මෙහෙම ලිපියක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් නිකුත් කරන්නේ කියලා මා දැනගන්න කැමැතියි. එතුමන්ලාට මේ සඳහා කාගේ බලපෑමක්ද ආවේ?. මේ ලිපි දිහා බැලූවාට පස්සේ පෙනෙන කාරණය තමයි විශේෂයෙන් ජපන් තානාපතිවරයා සහ ජපන් තානාපති  කාර්යාලයේ නිලධාරීන් හැසිරිලා තිබෙන්නේ මේ කොන්ත්‍රාත් සමාගම්වල නියෝජිතයන් හැටියටද කියලා මම දැනගන්න කැමැතියි. මොකද, එතරම් ප්‍රමාණයකට ජපන් තානාපති කාර්යාලය මේ වෙනුවෙන් මැදිහත් වෙනවා. **මෙම ව්‍යාපෘතියට රුපියල් බිලියන 136ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. හැබැයි, ඒක වසර 3ක් ප්‍රමාදවීම නිසා තවත් සියයට 10ක පමණ මුදලක් අපි variationsවලට ගෙවන්න ඕනෑ. එතකොට මුළු මුදල රුපියල් බිලියන 150ක් විතර වෙනවා. නමුත්, අද මේ ව්‍යාපෘතිය ජපන් සමාගම් අතර ටෙන්ඩර් කළොත්, රුපියල් බිලියන 100කින් විතර මෙම ව්‍යාපෘතිය කරගන්න පුළුවන්. ඒ කියන්නේ, මේ රටේ ජනතාවගේ මුදල් රුපියල් බිලියන 50ක් විතර අපේ භාණ්ඩාගාරයේ ඉතිරි වෙනවා.**

ඒ වගේම,  පොතුහැර ඉදිකිරීමට නියමිත System interchage එක අපේ දේශීය සමාගම් හරහා ඉදි කරගන්න අපට පුළුවන්. ඔවුන්ට ඒ අත්දැකීම තිබෙනවා. ඔවුන් කඩවත එවැනි එකක් ඉදි කළා. අන්දරවැව ඉදි කළා. අත්දැකීම් සහිත එවැනි දේශීය සමාගම් තිබියදී, වැඩි මුදලකට, අපේ රටේ නීතිපති දෙපාර්තමේන්තුවේ නිසි අවසරයක් නොමැතිව අපේ රටේ ජනතාවගේ බදු මුදල් ණය හැටියට මේ විධියට ජපානයට යවන එක කොතරම් අසාධාරණද කියලා තේරෙනවා ඇති. මෙතැන තිබෙන්නේ වෙන මොකවත් නොවෙයි. එක පැත්තකින් මේ කොමිස් හැහිල්ලට අමතරව අනෙක් පැත්තෙන් ජපානය දැන් අපේ රටේ ස්වෛරීභාවයට හානි කරන විධියට මැදිහත් වීම් කරමින් ඉන්නවා.  එම නිසා විශේෂයෙන්ම අපේ රටේ ජනතාවගේ බදු මුදල් ඉතිරිකිරීමත්, රටේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමත් වෙනුවෙන් මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑය කියන යෝජනාව ආණ්ඩුවට ඉදිරිපත් කරනවා.

## ජනවරමට එකඟ පාර්ලිමේන්තුවක්...



භංග වෙලා තිබෙනවාය කියන එක පිළිගෙන ඉවරයි. ඒ නිසා ඉතාම පැහැදිලියි, මේ ආණ්ඩුව ජනතාවට වග කියන ආණ්ඩුවක් නොවෙයි කියන එක.

ඒ වාගේම, මේ විශ්වාසභංග යෝජනාව ගෙනැල්ලා ජයග්‍රහණය කරලා, ආණ්ඩුවක් හදන්නත් ඒ ආණ්ඩුවේ බහුතරය කවුද කියල හොයන්නත් මේ පාර්ලිමේන්තුවට අයිතියක් නැහැ. මොකද, මේක විකෘති පාර්ලිමේන්තුවක්, මහජන වරම විකෘති කරපු පාර්ලිමේන්තුවක්. ඒ නිසා මේ පාර්ලිමේන්තුව ආයෙත් ආණ්ඩු හදන එක නොවෙයි කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව විසුරවලා මේ රටේ ජනතාවට අවස්ථාව දෙන්න ඕනෑ ජන වරමට ගරු කරන, ජන වරමට එකඟ පාර්ලිමේන්තුවක් හදන්න. ඒකාබද්ධ විපක්ෂයේ මහත්වරු නිතරම අපට ඇඟිල්ල දිගු කරලා කියන කථාවක් තමයි. "ඔයගොල්ලන් අද ආණ්ඩුවට විරුද්ධව විශ්වාසභංගයක් ගෙනාවා නම්, ඔක්තෝබර් 26 ගෙනාපු ආණ්ඩුව රැක්කෙ නැත්තේ ඇයි කියන එක. ඔක්තෝබර් 26 කුමන්ත්‍රණය රැක්කෙ නැත්තේ මොකද කියලා අහනවා. ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපට මේ පාර්ලිමේන්තුවේ සිටින ඔළු ගෙඩි ගණන වැදගත් නැහැ කියන ඒක අපි අදත් කියනවා. 10ක්, 20ක්, 40ක්, වෙන්න පුළුවන්. අපි 06 දෙනා වෙන්න පුළුවන්, පසුගිය ඔක්තෝබර් 26 වැනිදා කළ ජාතියේ කුප්‍රකට කුමන්ත්‍රණය නැවත කළොත්, ඒ කුමන්ත්‍රණයත් පරාජය කරන්න අපි හෙට කටයුතු කරනවා. ඒක ශ්‍රේෂ්ඨාධිකරණය විතරක් නොවෙයි, මේ රටේ ජනතාවත් අනුමත කරනවා ඇතැයි කියලා අපි විශ්වාස කරනවා. අපි පිළිගන්නේ නැහැ, මේ ව්‍යවස්ථාව සර්ව සම්පූර්ණ වශයෙන් උත්තරීතරයි කියලා. හැබැයි, යම් රටක පැවැත්මට ඒ රටේ මහජනතාව අනුමත කරපු යම් හෝ ව්‍යවස්ථාවක් තිබෙනවා නම්, එම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම ක්‍රමවේදයක්.

පසුගිය ඔක්තෝබර් 26වැනි දා ඒකාබද්ධ විපක්ෂයේ තමුන්නාන්සේලා මේ වාගේ විශ්වාසභංග යෝජනාවක් ගෙනාවා නම්, ඒ විශ්වාස භංගයේ කරුණු අනුව මේ ආණ්ඩුව ගෙදර යවන්න ඕනෑය කියලා පාර්ලිමේන්තු ක්‍රමයට ආවා නම්, මිරිස් කුඩු ගහන්නේ නැතිව, මරා ගන්න එන්නේ නැතිව, කථානායක පුටුව පෙරළන්නේ නැතිව ආවා නම් අපි එකඟ වෙනවා. එදා මහ රෑ ඇමතිකම් දුන්නා. විනාඩි 45ක් පමණ ඇමතිකම දරපු ඇමතිවරුත් හිටියා. විනාඩි 45යි! රාත්‍රී 9.30ට විතර ඇමතිකම භාර ගන්නවා. අභයාරාමයට යනවා. එතැන ආගමික වතාවත් කරනවා. 10.15ට අමාත්‍යාංශයට යනවා. 10.45ට විතර ඇමතිකම නැහැ. එහෙම ඇමතිවරුත් හිටියා. ඒ වාගේ කුප්‍රකට, යටි කුමන්ත්‍රණ, ඩීල්වලට අපි එකඟ නැහැ.

හැබැයි, දැන් අපි මේ අනුගමනය කර තිබෙන ක්‍රමය තමයි ජන සම්මත ක්‍රමය. මේක තමයි ව්‍යවස්ථානුකූල ක්‍රමය. එදා තමුන්නාන්සේලාත් මේ ක්‍රමයට ආවා නම් ජනතා විමුක්ති පෙරමුණේ අපි හය දෙනාගේ සහයෝගයත් ගන්න තිබුණා. ඒකාබද්ධ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු හෘදය සාක්ෂියට එකඟව අදත් පිළිගන්නවා, ඒ ජාතියේ බාල ගේම් එකකට යන්නේ නැතිව, ළඟ බලය අල්ලන ගේම් එකකට යන්නේ නැතිව වැදගත් විධියට ඒ වැඩේ කරන්න තිබුණාය කියන එක. දැන් මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඒක පිළිගන්නවා. මේ පාර්ලිමේන්තුව විකෘතියක්. ඒක අපි කවුරුත් පිළිගන්නවා. මේ පාර්ලිමේනුව දැන් ජනවරම නියෝජනය කරන්නේ නැහැ. දැන් මන්ත්‍රීවරයකු දිහා බැලුවොත්. ජනතාවට කියන්න බැහැ කොයි පැත්තේද ඉන්නේ කියලා. එහෙට පැනැලා, මෙහෙට පැනලා ආයෙත් එහෙට පනිනවා.

විශේෂයෙන්ම දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ට අද ලොකු වගකීමක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු, උතුරේ ජනතාවගේ විතරක් නොවෙයි මේ රටේ ජනතාවගේ යම් නියෝජනයක් අති විශාල විධියට නියෝජනය කරන්නට පුළුවන් මන්ත්‍රීවරුන් කියලා අපි විශ්වාස කරනවා. ඒ ඡන්ද ප්‍රමාණය, මන්ත්‍රී ධුර ප්‍රමාණය මේ මොහොතේ දී ඉතාම බාල විධියට, ලාභ විධියට ආණ්ඩුව ආරක්ෂා කරන්න යොදවන්න එපා. මේ සිදු වූ ප්‍රහාරය නිසා ඇති වූ අනාරක්ෂිතභාවය උතුරු නැගෙනහිර ඔබතුමන්ලාට හෙට ඇති වෙන්නට පුළුවන්. විශේෂයෙන් නැගෙනහිර, මඩකලපු ජනතාවට ඇති වෙන්න පුළුවන්. ඒක අදත් සිද්ධ වෙලා තිබෙනවා. සිද්ධවෙමින් තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේ විශ්වාසභංග යෝජනාව හොඳට කියවන්න කියලා. මේ ආණ්ඩුව, මහජන ආරක්ෂාව සලසන්න පුළුවන් ආණ්ඩුවක් නොවෙයි කියන එකයි අපි කියන්නේ. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. අපි මේ ආණ්ඩුව මේ යන ගමන නතර කරමු. එසේ නතර කරන්න කියන්නේ නැවත මේ ජාතියේ විකෘති පාර්ලිමේන්තුවක් හදන්න නොවෙයි. ජනතාවට වග කියන, ජනතා නියෝජනයක් තිබෙන, ඔබතුමන්ලාගේ නියෝජිතයන්ට නියෝජිතයන්ට පවා පැහැදිලි නියෝජනයක් තිබෙන පාර්ලිමේන්තුවක් හදන්න අවශ්‍ය ඉඩකඩ මේ රටේ ජනතාවට හදා දෙන්නයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




චේ දියණියට ජාත්‍යන්තරවාදී සහය පළකරමින්...



'නේත්‍රා' ක්‍රීඩකයින්ට උපකරණ ලබාදී...




කියුබාවට සහයෝගය පළකරන ආසියානු සමුළුවට සහභාගි වෙමින්...





කළු ජූලියට එරෙහිව සහෝදරත්වය පළකරමින්...



ජාතික සමගි වැඩපිළිවෙළ වැඩකරන ජනතාවට පිළිගන්වා...

# රට යන විනාශකාරී ගමන නිසැක ලෙසම වෙනස් කළ යුතුව තිබෙනවා

**ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා**



රට අතිශය විනාශකාරී අන්තයක් කරා ගමන් කරමින් තිබෙන බවත් රටත් ජනතාවත් අතිශය පීඩාවට පත්ව ආර්ථිකයේ, සමාජයේ, පරිසරයේ ඇති විය හැකි විශාලතම හානිය වෙමින් තිබෙන බවත් හෘද සාක්ෂියක් ඇති කිසිවෙකුට රට යමින් ඇති විනාශකාරී ගමන දෙස බලා සිටීමට අයිතියක් නොමැති බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, මේ විනාශකාරී ගමන නිසැක ලෙසම වෙනස් කළ යුතුව ඇතැයි අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 14වැනි දින කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ජාතික ජන බලවේගය එළිදැක්වීමේ අවස්ථාවේ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"අද සමාජය කඳවුරු තුනකට බෙදී තිබෙනවා. එකක් ගෝත්‍රවාදී අන්තයක් නියෝජනය කරනවා. අනෙක් පාර්ශ්වය නව ලිබරල් විනාශකාරී අන්තයක් නියෝජනය කරනවා. මේ කඳවුරු දෙක විටෙක එකටත් විටෙක වෙන් වෙන්වත් බලය හෙබවූවා. ඊට පිටින් විශාල විසිරුණු කඳවුරක් තිබෙනවා. මේ විසිරුණු තුන්වනි විකල්ප කඳවුර එක මධ්‍යස්ථානයකට එකතු කළ යුතුව තිබෙනවා. ජාතික ජනබලවේගය නිර්මාණය වන්නේ එම මධ්‍යස්ථානය වෙනුවෙනුයි. මෙය නියෝජනය කරන අප අතර වෙනස්කම් තිබිය හැකියි. එහෙත් අප සියලු දෙනා මුල් ගල් තුනක් මත විශ්වාසය තබනවා. පළමුවැන්න රටේ ප්‍රජාතන්ත්‍රවාදය, දෙවැන්න ආර්ථික සමානාත්මතාව, තෙවැන්න මිනිසත්කමයි.

අද වන විට සෑම තැනම මිනිස් නිදහසට වැටකඩොළු බඳිනු ලැබ තිබෙනවා. කලා සංස්කෘතික අංශයේ සිට සියලු ක්ෂේත්‍රයන්වලට මෙය අදාළයි. ආර්ථික සංවර්ධනය කියන්නේ කොන්ක්‍රීට් වනාන්තරයක් නෙමෙයි. එය ඇස් නිලංකාර කරවන්නක්ද නොවිය යුතුයි. ආහාර නොමැතිකම නිසා අම්මලාට දරුවන් සමග කොච්චියට පැනීමට සිදු නොවිය යුතුයි. තරුණ තරුණියන්ට රටින් පලා යාම ජයග්‍රහණයක් ලෙස සිතෙන්නක් නොවිය යුතුයි. ජාතික ආර්ථිකයේ ඵල ජනතාව අතර බෙදී යන සියලු දෙනාට සමානාත්මතාවයෙන් සලකන ආර්ථිකයක් නිර්මාණය විය යුතුයි. සියලු ගෝත්‍රවාදී ජාතිවාදී මතවාද ඉවත්වී මනුෂ්‍යත්වයෙන් ජීවත් විය හැකි සමාජයක් නිර්මාණය කළ යුතුව තිබෙනවා.

අප සියලු දෙනා මේ වෙනුවෙන් විවිධ ක්ෂේත්‍රවල අරගල කළ පුද්ගලයින් විය හැකියි. එහෙත් අද අප හමුවේ ඇත්තේ හුදෙකලා තනි තනි අරගලවලින් ජයග්‍රහණය කළ හැකි සටනක් නෙමෙයි. ඒ සඳහා අප සියලු දෙනා එක මිටකට ඒකරාශි විය යුතුව තිබෙනවා. තනි තනි වටුවාට දැල එසවිය නොහැකියි. නමුත් අප සාමූහිකව පියාසර කළහොත් අපට දැලෙන් මිදීමට හැකියාව තිබෙනවා. ජාතික ජනබලවේගය එවැනි සාමූහික ප්‍රයත්නයක් වනු ඇති බවට අපට විශ්වාසයක් තිබෙනවා.

මේ පණිවිඩය අප සමාජයේ සියලු කොටස් වෙත ගෙන යා යුතුව තිබෙනවා. සමාජයේ පතුලේ ජීවත්වන ජනතාව වෙත මෙම අදහස ළඟා විය යුතුයි. මෙම සංවිධානය පුළුල් මහජන ව්‍යාපාරයක් බවට පත්විය යුතුව තිබෙනවා. පොදුවේ මෙම සමාජය තුළ යටත්වීම වෙනුවට පවත්නා අසාධාරණයට එරෙහිව සටන් වදින අකීකරු මිනිසුන් විය යුතුව තිබෙනවා. එවැනි මිනිසුන් ඒකරාශි කරගත් ජාතික ජනබලවේගය නව සමාජයක් නිර්මාණය කිරීමේ ජයග්‍රහණයෙන් මිස නතර නොවන බව සහතික කරනවා."

# මඩකලපුව විශ්වවිද්‍යාලය රටේ නීතියටත් පටහැණියි; ජාතික සමගියටත් බාධාවක්

**ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**



බැටිකොලෝ කැම්පස් ආයතනය 2012 සිට ආරම්භ කිරීම සඳහා අවසර ලබාගැනීම, බී.ඕ.අයි. ලියාපදිංචිය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් අවසර ලබාගැනීම, මහවැලි අධිකාරියෙන් ඉඩම ලබාගැනීම, ණය මුදල සඳහා ගිණුම් විවෘත කිරීම, මුදල් ලැබුණු ආකාරය නීති විරෝධී වන අතරම පාඨමාලාවන් සඳහා සෞදි අරාබියෙන් ආචාර්යවරුන් ගෙන්වාගැනීම, ආයතනයේ පාඨමාලා ලෙස ෂරියා නීතිය පිළිබඳ පාඨමාලා, ඉස්ලාම් බැංකුකරණය පිළිබඳ පාඨමාලා අන්තර්ගතවීම වැනි කරුණුවලින් රටේ ජාතික සමගියට බාධාවක් එල්ල කරන මූලධර්මවාදී විශ්වවිද්‍යාලයක් බවට පත්වීමේ ඉඩ ඇතැයි ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා ප්‍රකාශ කළේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මේ බව කියා සිටියේ පසුගිය 17වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේද පැවසීය.

"මෙම බැටිකොලෝ කැම්පස් ආයතනය සඳහා ඉඩම වෙන් කර ගැනීම සිදුවන්නේ 2012දීයි. නැගෙනහිර පළාතේ තරුණ තරුණියන්ට නොමිලයේ වෘත්තීය පුහුණු පාඨමාලා ලබාදීමේ අධ්‍යාපන ආයතනයක් ආරම්භ කිරීමේ පදනමින් ඉඩමක් ලබාගැනීමට මහවැලි අධිකාරියෙන් ඉල්ලීමක් කළා. ඒ අනුව 2013 ජූලි 24වැනිදා මඩකලපුව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අක්කර 35ක ඉඩමක් වසර 35කට බදු ලෙස හීරා පදනමට ලබාගත්තා. අක්කරයකට රු. 14,340ක් බදු වශයෙන් අයකර ගන්නා අතර හීරා පදනම එම ඉඩම සඳහා වසරකට ගෙවිය යුතු මුදල් වන්නේ රු. 491,200ක මුදලක්. ඒ වගේම මෙම ආයතනය ඉදිරිකිරීම සහ පවත්වාගෙන යාම සඳහා මුදල් ලබාගැනීම ගැටලුසහගත තත්වයක්. 2016 මාර්තු මාසයේ සිට 2017 ජූනි මස දක්වා වසරක පමණ කාලයක් තුළ සෞදි අරාබියේ අලි ෆාලී නම් පදනමක් මගින් අවස්ථා 07කදී හීරා පදනමට රු. කෝටි 360ක් ලබාදෙනවා. ඒ වගේම මෙම ආයතනය සඳහා ආචාර්යවරුන් ලෙස සෞදි අරාබියේ මහාචාර්යවරුන් ගෙන්වා ගැනීමට උසස් අධ්‍යාපන 15 වැනි පිටුවට

# ජනාධිපතිවරණය කල්දාන්න කිසිදු ඉඩක් නැහැ

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**



වත්මන් ජනාධිපතිවරයාගේ ධුර කාලය 2020 ජනවාරි 08වැනිදා අවසන් වන බව පැහැදිලි කරුණක් බවත් පෙර අවස්ථාවකදී ජනාධිපතිවරයා විසින් ධුරයේ කාලය සම්බන්ධයෙන් සිදුකළ මත විමසුමේදී ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලි තීන්දුවක් ලබාදී ඇති බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, මෙම තත්වය තුළ නැවත ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම අනවශ්‍ය දෙයක් බවත් ජනාධිපතිවරණය නොවැම්බර් මසදී පැවැත්විය යුතුව තිබෙන බවත් අවධාරණය කළේය.

විජිත හේරත් සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 22වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායක ජනාධිපති ධුර කාලය වන්නේ වසර 06ක්. ඒ වගේම එම ව්‍යවස්ථාවට අනුව ජනාධිපති ධුරයට අසීමිත බලතල ප්‍රමාණයක් තිබෙනවා. එම අසීමිත ඒකාධිපති බලතල සහ ධුර කාලය වෙනස් කිරීම සඳහා තමයි 19වැනි සංශෝධනය ගෙනාවේ. ඒ සඳහා ප්‍රගතිශීලී බලවේග විශාල පිරිසක් මැදිහත් වුණා. එම නිසා 19 සංශෝධනයේ ඉතාම පැහැදිලි කරුණක් තමයි ජනාධිපති ධුර කාලය වෙනස් කිරීම. 1978 ව්‍යවස්ථාවේ 32 වගන්තියට අනුව තේරී පත් වූ ජනාධිපතිවරයා ධුරයේ දිවුරුම් දීම සම්බන්ධයෙන් සඳහන් වෙනවා. ඒ අනුව තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා 2015 ජනවාරි 09වැනිදා අගවිනිසුරුවරයා ඉදිරියේ දිවුරුම් දී ධුරයේ වැඩ බාරගත්තේ. එම නිසා ඔහුගේ ධුර කාලය 2015 ජනවාරි 09වැනිදා පටන් ගැනෙනවා. 19වැනි සංශෝධනය මගින් වසර 06ක්ව පැවති ජනාධිපති ධුර කාලය වසර 05ක් දක්වා අඩු කළා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(2) වගන්තියට අනුව 'ජනාධිපතිවරයා අවුරුදු 05ක කාලයක් ධුරය දරන්නේය' යනුවෙන් සඳහන් වෙනවා.

ඒ වගේම ජනාධිපතිවරයාගේ කටයුතු සම්බන්ධයෙන් වාද විවාද තිබෙනවා. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට 02 වැනි පිටුවට


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.